මහජන අදහස් සඳහා නිකුත් කළ අනුවාදය

දෙසැම්බර් 15 2025

# ශ්‍රී ලංකාවේ ජාතික විදුලිබල ප්‍රතිපත්තිය

## බලශක්ති අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා රජය

**2025<මාසය> <දිනය> .**

ශ්‍රී ලංකාවේ විදුලිබල සැපයුම් කර්මාන්තයෙහි සංවර්ධනය හා මෙහෙයුම් සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීම පිණිස බලශක්ති අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන ලේඛනයකි.

2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත මගින් සංශෝධිත 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධාන ප්‍රකාරව **2025<මාසය> <දිනය>** දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරේ.

## 1. හැඳින්වීම

***2019 අගෝස්තු 9 දිනැති අංක 2135/61 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ගයෙහි (NEPS) පූර්විකාවේ සඳහන් වන්නේ, විදුලිබල උත්පාදනය සහ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් 2008 ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග මඟින් නියම කරන ලද ඉලක්ක කිහිපයක් ශ්‍රී ලංකාව විසින් සපුරාගෙන ඇති බවයි. පිරිසිදු, ආරක්ෂිත, තිරසාර, විශ්වසනීය සහ ආර්ථික වශයෙන් ශක්‍යතාවය සහිත බලශක්ති සැපයුමක් භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ සමාජ සාධාරණ සංවර්ධනයක් සඳහා පහසු සහ දැරිය හැකි මිලකට බලශක්ති සේවා ලබා දීම සහතික කිරීම මෙහි ප්‍රකාශිත ජාතික බලශක්ති ප්‍රතිපත්තියේ සහ උපායමාර්ගවල ප්‍රධාන අරමුණ වේ.''***

2019 වසරේදී ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මානුෂීය සංවර්ධන දර්ශකයේ (UN Human Development Index) මධ්‍යම මට්ටමේ පසු වූ බවත්, 2017 වසරේ වාර්ෂික ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (GDP per capita) ඇමරිකානු ඩොලර් 4,065ක් ලෙස මධ්‍යම මට්ටමක පැවති බවත් ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග ප්‍රකාශනය (NEPS) මඟින් පෙන්වා දෙන ලදී.

ඉදිරි දශකය තුළ ඉහළ මධ්‍යම ආදායම් මට්ටමට ළඟා වීමට රජය දරන ප්‍රයත්නය ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ බලශක්තියේ කාර්යභාරය තීව්‍ර කළ බව ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ගය මඟින් පිළිගන්නා ලදී. ආර්ථික වර්ධනය වේගවත් කරන අතරතුර අඩු බලශක්ති තීව්‍රතාවයක් පවත්වා ගැනීම ශ්‍රී ලංකාවට ඇති අභියෝගය බව එහි සඳහන් විය. තවද ශ්‍රී ලංකාව 100% ක විදුලියනය (electrification) නැමති වැදගත් සන්ධිස්ථානයකට ළඟා වී ඇති බවත්, ඒ මඟින් සියලුම පුරවැසියන්ට නවීන බලශක්ති ප්‍රභවයන් ලබාදීමේ ඉලක්කය සපුරා ඇති බවත් ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ගය මඟින් තවදුරටත් පෙන්වා දෙන ලදී. (පිටුව 3A).

රටේ ප්‍රාථමික බලශක්ති සංචිතය තුළ පුනර්ජනනීය බලශක්තිය සඳහා හිමිව ඇති සාපේක්ෂව ඉහළ දායකත්වය ක්‍රමයෙන් අඩුවීමට ඉඩ ඇති බව ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ගය මඟින් පෙන්වා දෙන ලදී. මීට හේතුව වන්නේ මෙරට සතු ප්‍රධාන ජල විදුලි විභවයෙන් (hydro power potential) වැඩි කොටසක් මේ වන විටත් ප්‍රයෝජනයට ගෙන තිබීමයි. ගෘහස්ථ බලශක්ති පරිභෝජනය ෆොසිල ඉන්ධන දෙසට නැඹුරු වීමත් සමඟ, සියලු ආකාරයේ බලශක්තීන් සඳහා පවතින වර්ධනය වන ඉල්ලුම සපුරාලීම සඳහා ෆොසිල ඉන්ධන භාවිතය වැඩි වැඩියෙන් සිදු වේ. ජල සම්පත විවිධ අවශ්‍යතා සඳහා දායක වන අතර, පානීය ජලය සහ කෘෂිකාර්මික අවශ්‍යතාවලට පසුව විදුලි උත්පාදනය සඳහා හිමිවන්නේ තෙවන ප්‍රමුඛතාවයයි. 2019 වසරට පෙර දශක කිහිපය තුළ 55% ක මට්ටමක පවත්වාගෙන ගිය ප්‍රාථමික බලශක්ති සැපයුමෙහි පුනර්ජනනීය බලශක්ති දායකත්වය ආරක්ෂා කර ගැනීමට සහ එය තවදුරටත් ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් ප්‍රබල වෙනසක් අපේක්ෂා කෙරේ.

ආර්ථිකය බලගැන්වීම සඳහා විවිධ ප්‍රභවයන්ගෙන් ලබාගන්නා විශ්වසනීය, පිරිවැය-ඵලදායී සහ තරඟකාරී මිල ගණන් යටතේ පවතින බලශක්ති සේවා සැපයීම සහතික කිරීම සඳහාත්, බලශක්ති ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ අභියෝගයට මුහුණ දීම සඳහාත් වූ ශ්‍රී ලංකාවේ සැලසුම ඉදිරිපත් කිරීමට ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග (NEPS) සැලසුම් කර ඇත.

*"එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණුවල 7 වන අරමුණ සමඟ ශ්‍රී ලංකාව අනුගත කරමින්, 2020 වසර වන විට සැමට දැරිය හැකි, විශ්වසනීය, තිරසාර සහ නවීන බලශක්තිය සඳහා වන සාර්ව ප්‍රවේශය (universal access) සපුරා ගැනීමට මෙම ප්‍රතිපත්තිය දායක වනු ඇතැයි ද එහි ප්‍රකාශ විය."*

2019 වසරේදී ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග (NEPS) ගැසට් කරන ලද නමුත්, 2022 වසරේ ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන්, විදුලි ගාස්තු දැරිය නොහැකි තත්ත්වයට පත්වීම නිසා පහළ ආදායම් ලබන නිවාස සහ කුඩා ව්‍යාපාර සැලකිය යුතු ප්‍රතිශතයක් විදුලි බලයෙන් විසන්ධි වී ඇති බව සටහන් වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2019 ජාතික බලශක්ති ප්‍රතිපත්තියේ මූලික පදනමක් තවදුරටත් සුදුසු නොවේ.

2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත මඟින් සංශෝධිත, 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත මඟින් ලංකා විදුලිබල මණ්ඩලය මූලාමය වශයෙන් ස්වාධීන වූ වෙනම සමාගම් ලෙස වෙන් කිරීමට (unbundled) ප්‍රතිපාදන සලසා ඇති අතර, ඉන් සමාගම් හතරක් ලංකා විදුලිබල මණ්ඩලයේ මූලික කාර්යයන් භාර ගනු ඇත. එම සමාගම් හතරෙහි කාර්යයන් පහත පරිදි වේ:

(අ) ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
*කාර්යයන්: විදුලිබල උත්පාදනය, ලංකා විදුලිබල මණ්ඩලය සතු විදුලි බලාගාරයන්හි (CEB) සියලුම වත්කම්, බැරකම් සහ මෙහෙයුම් කටයුතු භාර ගැනීම*

(ආ) නැෂනල් ට්‍රාන්ස්මිෂන් නෙට්වර්ක් සර්විසස් ප්‍රොවයිඩර් (ප්‍රයිවට්) ලිමිටඩ්
*කාර්යයන්: ජාතික විදුලි බල පද්ධතිය (National Grid) සමන්විත වන භෞතික යටිතල පහසුකම් සංවර්ධනය, නඩත්තුව සහ මෙහෙයුම් කටයුතු සිදු කිරීම; ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ පද්ධතියට අදාළ සියලුම සම්ප්‍රේෂණ වත්කම්, බැරකම් සහ මෙහෙයුම් කටයුතු භාර ගැනීම*

(ඇ) නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
*කාර්යයන්: විදුලි ජනන කාලසටහන්ගත කිරීම (Generation scheduling), බලාගාර ක්‍රියාත්මක කිරීම සඳහා යොමු කිරීම (Commitment) සහ ආර්ථික වශයෙන් වාසිදායක ලෙස විදුලි ජනනය බෙදා හැරීම (Economic dispatch); එමෙන්ම අනාගත විදුලි උත්පාදනය සහ සම්ප්‍රේෂණ ධාරිතාව සැලසුම් කිරීම සම්බන්ධ කාර්යයන්.*

(ඈ) ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
*කාර්යයන්: විදුලිය බෙදාහැරීම සහ සැපයීම; ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීමේ කලාප හතරෙහි (distribution divisions) වත්කම්, බැරකම් සහ මෙහෙයුම් කටයුතු භාර ගැනීම.*

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත තවත් සීමිත වගකීම් සහිත සමාගම් දෙකක් (limited liability companies) ලංකා විදුලිබල මණ්ඩලයේ ඉතිරි වත්කම් සහ කාර්යයන් භාර ගනු ඇත.

(ඉ) CEB Employees Fund (Private) Limited (CEBEF);
(ඊ) Energy Ventures Lanka (Private) Limited (EVL)

ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO) සිය සේවා ප්‍රදේශය තුළ විදුලිය බෙදාහරින්නා ලෙස තවදුරටත් කටයුතු කරනු ඇත.

මෙම ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සකස් කර ඇත්තේ මෙම පසුබිම තුළ ය.

ඉහත සඳහන් කළ සමාගම් හය සහ ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO), මෙම ප්‍රතිපත්තිය තුළ සාමූහිකව 'අනුප්‍රාප්තික ආයතන' (successor entities) ලෙස හඳුන්වනු ලැබේ.

## 2. ප්‍රතිපත්ති ප්‍රකාශය

1. විදුලි සැපයුමේ සුරක්ෂිතභාවය ඉහළ නැංවිය යුතුය
2. විදුලි සේවා සඳහා ආරක්ෂිත සහ සමාජ සාධාරණ ප්‍රවේශය සහතික කළ යුතුය.
3. ජාතික ආර්ථිකයට ප්‍රශස්ත පිරිවැයකින් (optimal cost) විදුලි සේවා සැපයිය යුතුය
4. විදුලි සේවා ප්‍රභවකරණය (sourcing) සහ බෙදාහැරීම සම්බන්ධයෙන් ස්වයංපෝෂිතභාවය ඉහළ නැංවිය යුතුය.
5. විදුලිබල ක්ෂේත්‍රයේ ආයතනවල දිගුකාලීන මූල්‍ය තිරසාරභාවය සහතික කළ යුතුය.

සමගාමී ප්‍රතිපත්ති (Concurrent Policies) පහත පරිදි වේ.

I. විදුලියේ කාර්යක්ෂමතාවය සහ සංරක්ෂණය ප්‍රවර්ධනය කළ යුතුය..
II. පුනර්ජනනීය බලශක්තිය පදනම් කරගත් විදුලි උත්පාදනයේ දායකත්වය ඉහළ නැංවිය යුතුය..
III. විදුලිබල ක්ෂේත්‍රයේ යහපාලනය ශක්තිමත් කළ යුතුය.
IV. විදුලි සැපයුම් පද්ධති සහ පාරිභෝගික සේවා ඩිජිටල්කරණය (digitalisation) වේගවත් කළ යුතුය..
V. ජාතික පරිසර සහ දේශගුණික ප්‍රතිපත්ති සඳහා සහාය දැක්විය යුතුය
VI. අනාගත විදුලිබල ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් සුරක්ෂිත කළ යුතුය.

ප්‍රතිපත්ති ප්‍රකාශයන් සවිස්තරාත්මකව පහත දැක්වේ

**1. විදුලි සැපයුමේ සුරක්ෂිතභාවය සහතික කිරීම**

රටේ ප්‍රාථමික සහ ද්විතීයික විදුලි සැපයුම මඟින් එහි අඛණ්ඩතාව ප්‍රමාණවත් බව, ගුණාත්මකභාවය සහ විශ්වසනීයත්වය සහතික කළ යුතුය.

**2. විදුලි සේවා සඳහා ආරක්ෂිත ප්‍රවේශයක් ලබා දීම**

සියලු පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා සහ ලාභදායී ආර්ථික කටයුතුවල නිරත වීම සඳහා විශ්වසනීය, පහසු, දැරිය හැකි මිලකින් යුත්, ආරක්ෂිත, සාධාරණ සහ ගුණාත්මක විදුලි සේවාවන් සඳහා වන ප්‍රවේශය ඔවුන් වෙත ලබා දෙනු ඇත

**3. ජාතික ආර්ථිකයට ප්‍රශස්ත පිරිවැයකින් විදුලි සේවා සැපයීම**

ජාතික ආර්ථිකයට ඇති බර අවම කිරීම සඳහාත්, දේශීයව නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා ජාත්‍යන්තර වෙළෙඳපොළේ තරඟකාරීත්වය අත්කර ගැනීම සඳහාත් ප්‍රශස්ත දිගුකාලීන පිරිවැයකින් (optimum long-term cost) විදුලි සේවා සපයනු ලැබේ. අනාගත සියලුම විදුලි උත්පාදනයන්, ජාතික පද්ධති මෙහෙයුම්කරු (NSO) විසින් ක්‍රියාත්මක කරනු ලබන අවම පිරිවැය ප්‍රශස්තකරණය කළ ජනන සැලසුම්කරණ මූලධර්ම (least cost optimised generation planning principles) මත පදනම් වනු ඇත.

**4. ස්වයං විශ්වාසනීයත්වය ඉහළ නැංවීම**

බලශක්ති සැපයුම බාහිර බලපෑම්වලට ගොදුරු වීමේ අවදානම අවම කිරීමේ අරමුණින්, තාක්ෂණික, ආර්ථික, පාරිසරික සහ සමාජීය ගැටළු වලට යටත්ව, ආනයනික සම්පත් මත යැපීම අවම කිරීම සඳහා දේශීය බලශක්ති සම්පත් ප්‍රශස්ත මට්ටමින් සංවර්ධනය කරනු ලැබේ.

නවෝත්පාදනයන් දිරිමත් කිරීමේ සහ විදුලිය භාවිතා කරමින් දේශීය ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගනිමින්, කෘෂිකාර්මික, ග්‍රාමීය සහ ප්‍රාථමික කර්මාන්ත ක්ෂේත්‍රයන්හි විදුලිය ක්‍රියාකාරීව භාවිතා කරන නව පරිශීලකයින් දිරිමත් කරනු ලබන අතර, එහිදී කාන්තාවන් සහ තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

**5. විදුලිබල ක්ෂේත්‍රයේ ආයතනවල දිගුකාලීන මූල්‍ය තිරසාරභාවය**

පිරිවැය මත පදනම් වූ (cost-reflective) විදුලි ගාස්තු හඳුන්වා දීමට සමගාමීව, විදුලිබල ක්ෂේත්‍රයේ නියාමනය ක්‍රමයෙන් කාර්යසාධනය මත පදනම් වූ නියාමන ක්‍රමවේදයක් (performance-based regulation regime) දක්වා පරිවර්තනය කළ යුතුය. එමෙන්ම, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම තුළින් ලබාගන්නා ප්‍රතිලාභවලින් (ඉතිරි කිරීම් වලින්) කොටසක්, ආයතන සේවකයින් සඳහා දිරි දීමනා ලෙසත්, අවසාන පරිශීලක පාරිභෝගිකයන්ගේ වැය බර අවම කිරීම සඳහාත් වෙන් කළ යුතුය.

සමගාමී ප්‍රතිපත්තිවලට අදාළව,

I. **බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණය ඉහළ නැංවීම**

සැපයුම්කරුවන් මෙන්ම භාවිත කරන්නන් ද සහභාගී කර ගනු ලබමින් සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විදුලිය කාර්යක්ෂමව භාවිතයට ගැනීම සම්බන්ධව ප්‍රවර්ධනය කෙරෙනු ඇත.

II. **පුනර්ජනනීය බලශක්තියෙහි දායකත්වය වැඩි කිරීම**

අවම පිරිවැයක් යටතේ විදුලිය නිපදවීමට සහ විදුලිබල ක්ෂේත්‍රයෙහි තිරසාරත්වය සහ ඉහළ ප්‍රකෘතියට පත්වීමේ මට්ටමක් සාක්ෂාත් කරගැනීම සඳහා දේශීය පුනර්ජනනීය බලශක්ති සම්පත් ප්‍රශස්ත මට්ටමක් කරා සංවර්ධනය කෙරෙනු ඇත.

III. **විදුලිබල ක්ෂේත්‍රයේ යහ පාලනය ශක්තිමත් කිරීම**

වගවීම, සාධාරණත්වය සහ විනිවිදභාවය සහතික කිරීම ඔස්සේ දැරිය හැකි මිලකට යටතේ ගෘහස්ථ, වාණිජ සහ කර්මාන්ත පාරිභෝගිකයින් වෙත විදුලි සැපයීම සඳහා විදුලිබල ක්ෂේත්‍රය තුළ පාලනය ශක්තිමත් කෙරෙනු ඇත. අවසානයේ දී විදුලිබල ක්ෂේත්‍රයෙහි සියලුම පිරිවැය දැරීමට සිදුවනුයේ විදුලි පාරිභෝගිකයින්ට බව අවධානයට ගනිමින්, උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ පරිපාලනය ප්‍රශස්ත පිරිවැයක් යටතේ සිදු කර යාම සහතික කිරීම සඳහා ස්ථාවර ප්‍රතිපත්තියක් සහිත වටපිටාවක් සහතික කිරීම සහ නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සිදු කෙරෙනු ඇත. මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා අනුප්‍රාප්තික ආයතනවල සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සහ සේවකයින් මෙන්ම අනුප්‍රාප්තික ආයතන සමඟ ගිවිසුම්ගත වන සියලුම පුද්ගලයින් තම ක්‍රියාවන් සම්බන්ධයෙන් වගවිය යුතුය.

IV. **ඩිජිටල්කරණය**

සුහුරු ජාල තාක්ෂණයන් හඳුන්වා දීම සහ පාරිභෝගිකයින් වෙත ඉහළ මට්ටමේ අත්දැකීමක් ලබාදීම සඳහා මෙන්ම බලශක්ති පද්ධති කළමනාකරණය ස්වයංක්‍රීය කරවීමට ද ආර්ථික වශයෙන් සාධනීය නොවන විට යාන්ත්‍රික නොවන මැදිහත්වීම (manual) අඩු කරවීමට ද සුහුරු මනුකරණය යොදා ගැනීම සිදු කෙරෙනු ඇත. ප්‍රධාන ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ උපාය මාර්ගයක් ලෙස ස්වයංක්‍රීය ඉල්ලුම් ප්‍රතිචාර තාක්ෂණයන් සැලකෙනු ඇත. විදුලි මිල පෙන්නුම් කෙරෙන පණිවිඩ මගින් පාරිභෝගිකයින්ට දැනුවත්වීමට හැකියාව ලැබෙන සුහුරු ගොඩනැගිලි සහ සුහුරු මනුකරණය වෙත පූර්ණ වශයෙන් පරිවර්තනය වීම ඇතුළුව සුහුරු තාක්ෂණවේදයන් කඩිනම් කරවීමට කටයුතු කෙරෙනු ඇති අතර එහිදී ඉල්ලුම් පැතිකඩ වෙනස් වී සමස්ත සැපයුම් පිරිවැය අඩු වනු ඇත.

V. **ජාතික පාරිසරික සහ දේශගුණික ප්‍රතිපත්ති**

විදුලිබල ප්‍රතිපත්තිය දේශීය පාරිසරික තත්ත්වය සුරක්ෂිත කිරීම කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කරනු ලබමින් ජාතික පාරිසරික සහ දේශගුණික ප්‍රතිපත්ති හි අදාළ අංශ සමඟ අනුකූල විය යුතුය.

VI. **විදුලිබල ක්ෂේත්‍රයේ අනාගත සංවර්ධන කටයුතු උදෙසා අවශ්‍ය ඉඩම් සුරක්ෂිත කිරීම**

විදුලිබල ක්ෂේත්‍රයේ අනාගත සංවර්ධන කටයුතු උදෙසා අවශ්‍ය ඉඩම් හඳුනා ගනිමින් ඒවායේ හිමිකාරිත්වය තහවුරු කරගැනීමේ අවශ්‍යතාවය සහ සමාජීය බලපෑම් සහ නැවත පදිංචි කිරීමේ පිරිවැය අවම කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, උත්පාදන, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ සැලසුම් මත පදනම්ව අනාගත ව්‍යාපෘති සඳහා රජය සතු ඉඩම් වෙන් කිරීම සිදු කෙරෙනු ඇත.

## 3. කාර්යය සාධන කාල රාමුව

කාර්යය සාධන කාල රාමුව පහත පරිදි වේ.

**1. විදුලිබල සැපයුමේ සුරක්ෂිතබව තහවුරු කිරීම**

බලශක්ති සුරක්ෂිතතාව සාක්ෂාත් කර ගැනීම සඳහා හඳුනාගත් උපාය මාර්ග ක්‍රියාවට නැංවීම පිණිස පහත සඳහන් ඉලක්ක සහ සන්ධිස්ථාන සපුරා ගැනෙනු ඇත.

(අ) විදුලි ගාස්තු ප්‍රතිපත්තියේ දක්වා ඇති විස්තර පරිදි සුදුසුකම් සහිත කුටුම්භ සඳහා ජීව සහනදායි ගාස්තුව (Life –line tariff) අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙනු ඇත.

(ආ) හරස් සහනාධාර සහ විවිධ අධිභාර ක්‍රමිකව අඩු කෙරෙනු ඇත.

(ඇ) විදුලිබල පද්ධතියට සම්බන්ධ සෑම තාප විදුලි බලාගාරයකම අවම පරිභෝජන කාලයකට සමාන උපාය මාර්ගික ඉන්ධන සංචිතයක් පවත්වා ගත යුතු අතර පරිභෝජන අනුපාත, බෙදාහැරීමේ කාල සීමාවන්, තොගවල පිරිවැය එදිරිව විකල්ප ඉන්ධනවල පිරිවැය සහ පුළුල් සැපයුම්කරුවෙකු සිටීම සම්බන්ධයෙන් ද සැලකිල්ලට ගනු ලැබිය යුතුය.

(ඇ) විදුලිබල උත්පාදනය සඳහා උපයෝගී කර ගැනෙන දේශීය බලශක්ති සම්පත් පිළිබඳ පූර්ණ ඉන්වෙන්ටරියක් සකස් කොට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) විසින් ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

**2. විදුලිබල සේවාවන් සඳහා සුරක්ෂිත ප්‍රවේශයක් සැලසීම**

(අ) විශ්වසනීය, පහසු, දැරිය හැකි, සුරක්ෂිත, සාධාරණ සහ ගුණාත්මක වූ විදුලිබල සේවාවන් සඳහා ප්‍රවේශය

(i) සියලුම පුරවැසියන් හට සිය ජීවන තත්ත්වය නඟාසිටුවා ගැනීම පිණිස

(ii) සහන ලැබීම සඳහා සුදුසු යැයි හඳුනාගන්නා පිරිස් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට යොමු කරවීමට හැකි වන පරිදි ලාභදායී ආර්ථික ක්‍රියාකාරකම්වල නියැලීම සඳහා ඔවුන් දිරිගැන්වීම; නිශ්චිත ඉලක්ක සහ සන්ධිස්ථාන හඳුනා ගනු ලැබීම, එවැනි වගකීම් පවරා ඇති ආයතන විසින් ඒවා සපුරාලනු ලැබීම සහතික කෙරෙනු ඇත.

(ආ) සහන ලැබීම සඳහා සුදුසුකම් ලබන පාරිභෝගිකයින් කලින් කලට සිදු කරනු ලබන සමීක්ෂණ මත පදනම්ව හඳුනා ගැනෙනු ඇත.

(ඇ) අනාගත කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සහ ව්‍යාපාර දිරිගැන්වීම පිණිස විදුලි සම්බන්ධතාවයක් ලබා ගැනීමේ දී දැරීමට සිදුවන මූලික පිරිවැය සඳහා අයවැයෙන් සහාය ලබා දීමට කර්මාන්ත අමාත්‍යාංශය විසින් කටයුතු කරනු ඇති අතර, වත්මන් ව්‍යාපාර ප්‍රාග්ධන පිරිවැය හා සැසඳීමේ දී එය සැලකිය යුතු වැදගත්කමක් උසුලනු ඇත. ව්‍යවසායන් සඳහා සහාය ලබා දීමේ වගකීම කර්මාන්ත අමාත්‍යාංශය වෙත පැවරී ඇති කටයුත්තක් වන හෙයින් සුදුසුකම් ලබන පිරිස් හඳුනාගැනීම් කර්මාන්ත අමාත්‍යාංශය විසින් සිදු කෙරෙනු ඇත. අමාත්‍යාංශය විසින් මෙය සුදුසු යැයි සලකනු ලබන ආකාරයකින් වාරික වශයෙන් අයකර ගැනෙනු ඇත.

(ඇ) විදුලි සැපයුමේ අනුකූලතාව, ඒකාබද්ධ කිරීමේ පහසුව සහ සුරක්ෂිතබව තහවුරු කිරීම සඳහා විදුලිබල සැපයුම් දාමයේ දී උපයෝගී කරගැනෙන උපකරණ ප්‍රමිතිගතකරණය කෙරෙනු ඇත.

(ඉ) ආරක්ෂාව, උසස් ක්‍රියාකාරීත්වය, විශ්වසනීයත්වය සහ තුරු වියන් ආශ්‍රිතව ඇතිවන ගැටළු අවම කරගැනීම කෙරෙහි අවධානය යොමුකරමින්, නාගරික ප්‍රදේශවල විදුලි බෙදාහැරීමේ ජාල ක්‍රම ක්‍රමයෙන් භූගතව ස්ථාපනය කරනු ලබන අතර, අනෙකුත් සියලුම ප්‍රදේශවල ඇති පරිවරණය නොකළ ඇලුමිනියම් සන්නායක රැහැන් පරිවෘත්ත පොකුරු රැහැන් (Arial Bundled Conductors -ABC) මගින් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ.

**3. ජාතික ආර්ථිකය වෙත ප්‍රශස්ත පිරිවැයක් යටතේ විදුලිබල සේවාවන් සැපයීම.**

ජාතික ආර්ථිකය මත ඇති කෙරෙන වැය බර අවම වන පරිදි දිගුකාලීන ප්‍රශස්ත පිරිවැයක් යටතේ බලශක්ති සේවාවන් සපයනු ලැබීම සහතික කිරීම උදෙසා, පහත සඳහන් ඉලක්ක සහ සන්ධිස්ථාන සපුරාලීමට වගකීමෙන් බැඳී සිටින ආයතන කටයුතු කරනු ඇත.

(අ) 2024 විදුලිබල පනතේ විධිවිධාන වලට යටත්ව (සංශෝධිත) අවම මිලක් ලබා ගැනීම පිණිස තරගකාරී ටෙන්ඩර් මත පදනම් වූ ප්‍රසම්පාදනයක් සිදු කෙරෙනු ඇත.

(ආ) සියලුම ආකාරයේ විදුලි උත්පාදනය කිරීම්වලට අදාළව විනිවිදභාවයෙන් යුතු මිලකරණ ක්‍රමවේදයක් අනුප්‍රාප්තික ආයතන විසින් ක්‍රියාත්මක කෙරෙනු ඇති අතර ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) විසින් පරිපාලනය කරනු ලබන නියාමන යාන්ත්‍රණයක් හරහා එය සිදු කෙරෙනු ඇත.

(ඇ) ජීව සහනදායී (Life –line tariff) විදුලි ගාස්තුව මසකට කි.වො.පැ. 30ට අඩු පරිභෝජනයක් සහිත කුටුම්භ පාරිභෝගිකයින් වෙත පමණක් සීමා කෙරෙනු ඇත.

(ඈ) අස්ථායීබව හේතුවෙන් සිදු වන සැපයුම් බිඳවැටීම් අවම කර ආර්ථිකය මත ඉන් ඇති වන වැය බර අඩු කිරීමට කටයුතු කෙරෙනු ඇත.

(ඉ) සහනාධාර එක්වරකට වඩා යලි යලිත් ලබාදීම (Duplication) වැළැක්වෙන පරිදි ප්‍රමාණවත් නම්‍යශීලී ප්‍රතිපත්ති ඇති කෙරෙනු ඇත.

## 4. ස්වයං විශ්වසනීයත්වය නගාසිටුවීම

(අ) 2019 ජාතික බලශක්ති ප්‍රතිපත්තිය තුළ සාක්ෂාත් කර ගන්නා ලද සන්ධිස්ථානයන් පිළිබඳ සත්‍යතාව තහවුරු කරගැනීමට සහ ඇගයීමට තක්සේරුවක් සිදු කරනු ලබන අතර, ප්‍රකාශිත පරමාර්ථ සපුරා ගැනීම උදෙසා මෙම විදුලි ප්‍රතිපත්තිය සුදුසු පරිදි සංශෝධනය කෙරෙනු ඇත.

(ආ) පුනර්ජනනීය බලශක්ති සම්පත්, ඒවායේ පිරිවැය, ආර්ථික කාරණා, තාක්ෂණය සහ එක් එක් සම්පත්වල ගුණාත්මකභාවය සැලකිල්ලට ගනු ලබමින් ප්‍රමුඛතා අනුපිළිවෙලක් මත ප්‍රයෝජනයට ගැනෙනු ඇත. මෙය සිදු කිරීම සඳහා, හැකි සෑම විටම පුනර්ජනනීය බලශක්ති සම්පත් උපයෝගී කරගන්නා මෙන් විදුලිය බෙදාහැරීමේ ආයතන දිරිමත් කෙරෙනු ඇති අතර, ඒ තුළින් ගෘහස්ථ, වාණිජ හෝ කර්මාන්ත මට්ටමින් විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා ලාභදායී අයුරින් යොදා ගත හැකිය.

(ඇ) නම් කරනු ලබන ජෛව ස්කන්ධ බලශක්ති සංවර්ධන ප්‍රදේශවල බලශක්ති වගාවන් (energy plantations) හෝ ඉන්ධන ලෙස උපයෝගී කරගත හැකි වගාවන් ඇති කිරීම මගින් විදුලිය උත්පාදනය කිරීම සඳහා ජෛව ස්කන්ධ වාණිජමය වශයෙන් ලබා ගැනීමේ හැකියාව ඉහළ නංවනු ලැබේ. විදුලිබල උත්පාදනය සඳහා නාගරික ඝන අපද්‍රව්‍ය උපයෝගී කරගැනීම ඉහළ දැමිය යුතුව ඇත.

## 5. විදුලිබල ක්ෂේත්‍රයේ ආයතනයන්හි දිගුකාලීන මූල්‍ය තිරසාරත්වය.

(අ) විදුලි ගාස්තු ප්‍රතිපත්තියේ දී පිරිවැය පරාවර්තක විදුලි ගාස්තු අනිවාර්යෙන් ක්‍රියාත්මක කිරීම

(ආ) උපයෝගිතා ආයතනයන්හි කාර්ය සාධනය මැනීම සඳහා පිල් ලකුණු (Bench mark) යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරීම

(ඇ) නියාමනය වන අනුප්‍රාප්තික ආයතන කාර්ය සාධනය මත පදනම් වූ නියාමන තන්ත්‍රයක් කරා යොමුකරවීමට මාර්ග සිතියමක් සකස් කිරීම

(ඈ) කාර්යක්ෂමතාව ඉහළ නැංවීමෙන් ලැබූ ඉතිරියෙන් උපයෝගිතා ආයතනයන්හි සේවකයින්ට සහ පාරිභෝගිකයින්ට ප්‍රතිලාභ සැලසීමට යාන්ත්‍රණයන් සකස් කිරීම.

සමගාමී ප්‍රතිපත්ති සඳහා වන ප්‍රතිඵල සැලසීම් කාර්යරාමුව මෙසේ ය:

## I. බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණය ඉහළ නැංවීම

2019 ජාතික බලශක්ති ප්‍රතිපත්තියෙන් ඇති කරගන්නා ලද ඉලක්ක ක්‍රියාවට නැංවීම නැවත තක්සේරුවට ලක් කරනු ලබන අතර විදුලිබල කාර්යක්ෂමතාව සහ සංරක්ෂණය ඉහළ නැංවීමේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම වෙනුවෙන් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

## II. පුනර්ජනනීය බලශක්තියෙහි දායකත්වය වැඩි කිරීම

උත්පාදන පිරිවැය ක්‍රම ක්‍රමයෙන් අඩු කිරීම සඳහා පුනර්ජනනීය බලශක්තිය පාදක කරගත් සියලුම විදුලි ප්‍රසම්පාදනය කිරීම් සඳහා පූර්ණ වශයෙන් නියාමනය කෙරෙන තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කෙරෙනු ඇත. කොන්ත්‍රාත්තුවේ දී අවශෝෂක ගාස්තු (feed In Trariff) හා එකඟ වී ඇති අවස්ථාවක දී, අදාළ නීතිවලට යටත්ව එම කොන්ත්‍රාත්තුව සඳහා ගෙවීම් සිදු කරනු ලැබේ. 2024 විදුලිබල (සංශෝධිත) පනතේ විධිවිධානවලට යටත්ව, සහ 2019 ජාතික බලශක්ති ප්‍රතිපත්තියෙන් ඉදිරිපත් කරන ලද ස්ථාවරයට අනුව, ඉදිරියේ දී අවශෝෂක ගාස්තු මත පදනම්ව ගිවිසුම් බැඳීම්වලට එළඹීම සිදුනොකෙරෙනු ඇත.[1]

පුනර්ජනනීය බලශක්තිය උපයෝගී කරගැනීම උපරිම මට්ටමක් කරා ගෙන ඒම සඳහා, පුනර්ජනනීය බලශක්තියෙන් උත්පාදිත අතිරික්ත විදුලිය විදුලිබල පද්ධතිය වෙත අවශෝෂණය කර ගැනීම සහ කප්පාදුව අඩු කිරීම පිණිස විදුලිය ගබඩා කිරීමට හැකි තාක්ෂණයන්ගේ මිශ්‍රණයක් ක්‍රියාත්මක කළ යුතුය. ප්‍රශස්ත ජලාශ කළමනාකාරීත්වය, ගුරුත්වය ආධාරයෙන් ගබඩා කිරීම, විද්‍යුත් රසායනික ගබඩා කිරීම, යාන්ත්‍රික ගබඩා කිරීම, තාප ගබඩා කිරීම සහ අනෙකුත් නවීන සහ වේගවත් තාක්ෂණයන් ඇතුළුව ගබඩා කිරීමේ විකල්පයන් සඳහා විදුලිබල පද්ධතියෙහි අවශ්‍යතා, ආයු කාලය තුළ දරන ලද පිරිවැය, ප්‍රතිචාර දැක්වීමේ හැකියාව සහ පාරිසරික හා සමාජීය බලපෑම් අවධානයට ලක් කෙරෙනු ඇති අතර විනිවිදභාවයෙන් යුතු තාක්ෂණික-ආර්ථික නිර්ණායක උපයෝගී කරගනිමින් ඇගයීමට ලක් කළ යුතුය. පිරිවැය-ඵලදායී බලශක්ති විස්ථාපන පහසුකම, දීර්ඝ මෙහෙයුම් ආයු කාලයන්, දීර්ඝ කාලීන ගබඩාකරණ විකල්ප, ඉඩම් සහ ජලය ආශ්‍රිත සීමාවන්, විදුලි පද්ධතියේ ස්ථායිතාව සහ නම්‍යශීලීභාවය සපයන විසඳුම් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දිය යුතු අතර ඒවායින් වන පාරිසරික හානිය අවම කිරීමට කටයුතු කළ යුතුය. පුනර්ජනනීය බලශක්තිය වැඩි වශයෙන් පද්ධතිය වෙත ඒකාබද්ධ කිරීම සහ බලශක්ති සුරක්ෂිතභාවය දිගුකාලීනව තහවුරු කිරීම සඳහා ගබඩා කිරීමේ කටයුතු සංවර්ධනය අදියර වශයෙන්, ආර්ථික වශයෙන් කාර්යක්ෂමව සහ පාරිසරික වශයෙන් වගකිවයුතු ආකාරයකින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් සහ නියාමන රාමුව ඔස්සේ කටයුතු කළ යුතුය.

## III. විදුලිබල ක්ෂේත්‍රයේ යහ පාලනය ශක්තිමත් කිරීම

ගාස්තු සකස් කිරීමේදී සහ ගණනය කිරීමේදී, නියාමකයා විසින් තීරණය කරනු ලබන ගාස්තුවලට ඇතුළත් කිරීමට අපේක්ෂා කරන පිරිවැයට අදාළ මූල්‍ය තොරතුරු ඇතුළුව සියලු තොරතුරු ජනන සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ ජාතික පද්ධති ක්‍රියාකරු යන ආයතන විසින් නියාමක වෙත ලබා දීම සිදුකළ යුතුය. විවෘත හා විනිවිදභාවයකින් යුතු ලංසු තැබීමේ ක්‍රියාවලියක් මත පදනම්ව සියලුම තාප සහ පුනර්ජනනීය-පාදක විදුලි උත්පාදනයන් ප්‍රසම්පාදනය කෙරෙනු ඇත. එම ආයතන විසින් එම සියලු වියදම් වෙළඳපොලේ පවතින අවම පිරිවැය බවට සාධාරණීකරණය කිරීමට කටයුතු කළ යුතුය. පාරිභෝගික ගාස්තු සම්බන්ධයෙන් මහජන උපදෙස් විමසීමට පෙර මීට අදාළ ක්‍රමවේදය සහ පියවර ඇතුළත් සවිස්තරාත්මක තොරතුරු ප්‍රසිද්ධියේ පළ කරනු ලැබේ. කාර්ය සාධනය මත පදනම් ප්‍රතිලාභ දීමනා සහ දණ්ඩන ඇතුළුව කාර්ය සාධනය මත පදනම් වූ නියාමනයක් ක්‍රියාත්මක කෙරේ.
කතිපයාධිකාරීත්වයකට හෝ මිල ඉහළ තබා ගැනීමට නිපැයුම් සැපයුම් පාලනය සඳහා ඇති කරගන්නා සන්ධානගතවීමකට අවසරය ලබා දීම හෝ ඒවා සිදු කරගෙන යාමට ඉඩ ලබාදීම සිදු නොවන පරිදි කටයුතු කරනු ඇත. සියලුම බලපත්‍රලාභීන් මෙන්ම විදුලිබල කර්මාන්තය ද මෙම ප්‍රතිපත්තිය සමඟ අනුකූල විය යුතුය.

---

1. අවශෝෂක ගාස්තු සම්බන්ධයෙන් සම්මත මිළ ක්‍රමවේදය සක්‍රියව පැවති අවදියේ සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත ඉදිරිපත් වූ, එනමුත් එම ක්‍රමවේදය නතර වූ බැවින් ප්‍රගතියක් නොලද දැනට අනුමැති ක්‍රියාවලියේ විවිධ අවස්ථාවල ඇති අයදුම්පත් සුදුසු අන්තර්කාලීන වැඩපිළිවෙලක් මගින් තරඟකාරී ක්‍රමවේදයකට යොමු කෙරේ. මෙහිදී අදාළ ව්‍යාපෘති යෝජකයින් හට විශේෂ සැලකිල්ලක් ලබා දීම සඳහා ව්‍යාපෘතියේ ප්‍රගතිය, මේ වන විට සිදු කර ඇති ආයෝජන වැනි කරුණු පදනම් කර ගැනේ. ඒ ඒ තාක්ෂණයන්ගේ සුවිශේෂී ලක්ෂණ ද සලකා බලා මෙසේ ප්‍රගතියක් ලබා නොගත් ව්‍යාපෘති කඩිනමින් සංවර්ධනය සඳහා විකල්ප වැඩසටහන් ලංකා විදුලිබල මණ්ඩලය සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් 2020 වසර මැද භාගයේදී නිර්මාණය කෙරේ. මෙමගින් මේ ආකාරයේ නතර වූ ව්‍යාපෘති 2023 වසර වන විට තරඟකාරී ක්‍රමවේද යටතේ සංවර්ධනය කොට අවසන් කෙරේ. (ජාතික බලශක්ති ප්‍රතිපත්තිය 2019, ක්‍රියාමාර්ගය 7d )

අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්ති සකස් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී සහ පනත හා ඒ යටතේ සාදන ලද නියෝග බලාත්මක කිරීමේදී, විදුලිබල උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම සම්බන්ධයෙන් කිසිදු ඒකාධිකාරයකට,(monopoly) කතිපයාධිකාරිත්වයකට (oligopoly) හෝ මිල ඉහල තබා ගැනීමට නිපැයුම් සැපයුම් පාලනය සඳහා ඇති කර ගන්නා සන්ධානගත වීමකට අවසරය ලබා දීම හෝ ඒවා සිදු කරගෙන යාමට ඉඩ ලබා දීම සිදු නොවන පරිදි කටයුතු කරනු ඇත. සියළුම බලපත්‍රලාභීන් මෙන්ම විදුලිබල කර්මාන්තය ද මෙම ප්‍රතිපත්තිය සමඟ අනුකූල විය යුතුය.

## IV. ඩිජිටල්කරණය

(අ) ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ වේදිකාවක් උපයෝගී කරගනිමින් විදුලිබල ක්ෂේත්‍රයේ ආයතන ඩිජිටල්කරණය කිරීම ප්‍රමුඛතාවයක් ලෙස සලකා ක්‍රියාවට නංවනු ලබන අතර, සුහුරු මනු, දුරස්ථව පාලනය කළ හැකි උපාංග සහ සුහුරු ජාල දක්වා වූ සමස්ත අගය දාමය ඩිජිටල්කරණය කෙරෙන අතර කෘත්‍රිම බුද්ධිය (AI), අන්තර්ජාලයට සම්බන්ධ කර භාවිත කිරීම (LOT) සහ විසිරි දත්ත පද්ධති (distributed ledgers) වැනි නවීන තාක්ෂණයක් යොදාගැනීමට මෙහිදී ඉඩ සැලසෙන අතර එමගින් කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතය ඉහළ යනු ඇත.

(ආ) ගබඩා කිරීම, භාවිතය සහ කළමනාකරණය යන අංශ ආවරණය වන පරිදි ඩිජිටල් තොරතුරු වල ආරක්ෂාව සහතික කිරීම සඳහා ඩිජිටල් තොරතුරු කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශයක් හඳුන්වා දෙනු ලැබේ.

(ඇ) වලාකුළු පරිගණක තාක්ෂණය මත පදනම් වූ මධ්‍යම දත්ත ගබඩා පද්ධතිවල (cloud based central databases) උපයෝගිතා සේවා ගනුදෙනු සම්බන්ධ දත්ත සුරක්ෂිතව ගබඩා කිරීම සඳහා එම ගනුදෙනු ඩිජිටල්කරණය කිරීම සිදු කෙරෙනු ඇති අතර විදුලිබල ක්ෂේත්‍රයේ මෙතෙක් ඒකරාශීව ඇති දත්ත, තොරතුරු සහ දැනුම අනාගත භාවිතය සඳහා සුචිගත කර සහ ලැයිස්තුගත කර සුරක්ෂිතව ගබඩා කරනු ලබන අතර එය දැනුම වත්කම් (Knowledge assets) ලෙස සලකනු ලැබේ.

## V. ජාතික පාරිසරික සහ දේශගුණික ප්‍රතිපත්ති ·

රටේ ස්වභාවික පරිසරය ආරක්ෂා කරනු ලබන අතර, දේශීය පරිසරයට ප්‍රමුඛත්වය දෙමින් හා සුදුසු උපාය මාර්ග භාවිතා කරමින් සුදුසු අඩු විමෝචන ක්‍රියාවලින් සහ බලපෑම අවම කිරීමේ පියවරයන් අනුගමනය කිරීමෙන් දේශගුණික විපර්යාස අවම කරගැනීමට අර්ථවත් දායකත්වයක් ලබා දෙනු ලැබේ.

## VI. විදුලිබල ක්ෂේත්‍රයේ අනාගත සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් සුරක්ෂිත කිරීම.

ඇතැම් තාක්ෂණයන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන විශේෂිත පිහිටීම් සහිත ඉඩම් සීමිතවීම සැලකිල්ලට ගනිමින් සහ විදුලි බලාගාර සහ සම්ප්‍රේෂණ වත්කම් ඉදිකිරීමේදී ඉදිකරනු ලබන භූමි පිහිටා ඇති ස්ථාන සහ මාර්ග වෙනස් කිරීමට (විතැන් කිරීමට) සිදුවීමෙන් මින් පෙර සිදු වී ඇති විශාල මූල්‍ය අලාභ සැලකිල්ලට ගනිමින්, ඉදිරියේදී සිදු කරන විදුලි යටිතල පහසුකම් ස්ථාපිත කිරීම් සඳහා උපායමාර්ගික පිහිටීමක් සහිත ස්ථාන සහ මාර්ග කල් තබා වෙන් කරවා සුරක්ෂිත කිරීම සිදු කෙරෙනු ඇති අතර එවැනි පහසුකම් නිසි කාලීනව ක්‍රියාත්මක කිරීම සහ අහිතකර සමාජීය හා පාරිසරික බලපෑම් අවම කිරීම සඳහා උපාය මාර්ග භාවිත කිරීම සිදු කෙරේ.

(අ) විදුලිබල ක්ෂේත්‍රයේ අනාගත යටිතල පහසුකම් සහ ඒ ආශ්‍රිත පහසුකම් ඉදිකිරීම සඳහා සුදුසු ස්ථාන සහ මාර්ග, මූලික ශක්‍යතා අධ්‍යයනවලින් පසුව, උපායමාර්ගිකව කල් තබා වෙන් කරවා ගැනීමට කටයුතු කෙරෙන අතර, එමගින් මහජනතාව එවැනි ස්ථාන හෝ මාර්ග භාවිත කිරීම වළක්වා ගැනීමට ද වෙනත් ස්ථානයකට ගෙන යාමට සිදුවීම මෙන්ම සංවර්ධන කටයුතු සිදු කෙරෙන සමයේ දී සමාජීය බලපෑම් ඇති වීම ද අවම කරගැනීමට හැකිවේ.

(ආ) සුළං සහ සූර්ය බලශක්ති බලාගාර වැනි මහා පරිමාණ පුනර්ජනනීය බලශක්ති යටිතල පහසුකම් ස්ථානගත කිරීම සඳහා වඩාත් උචිත ස්ථාන කල් තබා හඳුනා ගනිමින් ප්‍රධාන සැලැස්මක් තුළට ඇතුළත් කෙරෙනු ඇති අතර එමගින් ඒවා විශාල, කේන්ද්‍රගත වූ පහසුකම් ලෙස අදියර වශයෙන් සංවර්ධනය කළ හැකිය.

(ඇ) ජාතික යටිතල පහසුකම් සැලසුම්කරණයේ ප්‍රයෝජනය තකා පොදුවේ භාවිතයට ගෙන ඇති අභ්‍යන්තර මාර්ග සඳහා ප්‍රමුඛතාව දක්වමින්, සම්ප්‍රේෂණය සඳහා සහ ප්‍රධාන විදුලි රැහැන් පද්ධති සම්ප්‍රේෂණය (Back bone transmission) සඳහා මාර්ග හඳුනාගැනීමට කටයුතු කෙරේ. මහජනතාව වෙත පෙර දැනුම්දීමේ අරමුණින් යුතුව එම හඳුනාගත් මාර්ග ප්‍රකාශයට පත් කරනු ලැබේ.

(ඈ) නොයෙක්විධ නල මාර්ග සහ විදුලි සම්ප්‍රේෂණ රැහැන් මාර්ග ඇතිරීම සඳහා දැනට ඇති අභ්‍යන්තර මාර්ග හැකි සෑම විටම යොදාගැනෙනු ඇත.

(ඉ) අනාගතයේ ඉදිකෙරෙන භූගත කේබල් මාර්ග සහ නල මාර්ග ප්‍රශස්ත ලෙස ස්ථානගත කිරීම සඳහා විදුලිය, ජලය, සන්නිවේදනය, ගෑස් සහ ඛනිජ තෙල් ඇතුළු දැනට පවතින සහ අනාගත භූගත උපයෝගිතා සේවා යටිතල පහසුකම් සියල්ලම පොදු හා විධිමත් භූගෝලීය තොරතුරු පද්ධතියකට (GIS) ඇතුළත් කෙරෙනු ඇත.

(ඊ) විදුලිය බෙදා හැරීම, මලාපවහන, ජලය, සන්නිවේදනය සහ ගෑස් සැපයුම ඇතුළු මහා මාර්ගය ආශ්‍රිත උපයෝගිතා යටිතල පහසුකම් සම්බන්ධ මාර්ග, හිමිකාරිත්වය පැහැදිලිව නිර්ණය කිරීම, නඩත්තු කිරීමේ නම්‍යශීලීභාවය සහ පුළුල් කිරීම සඳහා ඉඩකඩ සහතික වන ආකාරයට, ප්‍රවාහන යටිතල පහසුකම් සමඟ සම්බන්ධීකරණය කළ යුතුය.

මෙම ආයතන සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වූ පසු බලපත්‍රලාභීන් සමඟ සාකච්ඡා කර මෙම ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සංශෝධනය කෙරේ.

ජාතික විදුලි අයකුම ප්‍රතිපත්තිය ඇමුණුම A ලෙස අමුණා ඇත.

මහජන අදහස් සඳහා නිකුත් කළ අනුවාදය

2025 දෙසැම්බර් 15

# ජාතික විදුලිබල ප්‍රතිපත්තිය

## <u>ඇමුණුම A</u>

## ජාතික විදුලි අයක්‍රම ප්‍රතිපත්තිය

**බලශක්ති අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා රජය**

**2025** <මාසය > <දිනය>

ශ්‍රී ලංකාව තුළ විදුලිබල පිරිවැය සහ මිල තීරණය කිරීමට අදාළ ප්‍රතිපත්තිය, උපාය මාර්ග සහ ක්‍රියාමාර්ග සඳහා වන කාල රාමු ප්‍රකාශයට පත් කිරීම පිණිස බලශක්ති අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ලේඛනයකි.

2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත මගින් සංශෝධිත 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධාන ප්‍රකාරව 2025<මාසය> <දිනය> දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කෙරේ.

මෙම ගාස්තු ප්‍රතිපත්තිය, ජාතික බලශක්ති ප්‍රතිපත්තියේ අනිවාර්ය කොටසක් වන ජාතික විදුලිබල ප්‍රතිපත්තියෙහි විස්තර කර ඇති රජයේ ප්‍රතිපත්තිමය රාමුව මත පදනම් වේ. මෙම ගාස්තු ප්‍රතිපත්තිය ජාතික විදුලිබල ප්‍රතිපත්තියේම කොටසක් වන අතර, එම ප්‍රතිපත්ති දෙකම අනුමත කළ දින සිට වසර පහකට වරක් හෝ හදිසි අවශ්‍යතාවයක් පැනනැඟුණු අවස්ථාවක ඊට පෙර ඕනෑම අවස්ථාවකදී සංශෝධනය කරනු ලැබිය හැකිය.

පටුන

කෙටි යෙදුම් සහ ඒකක
ලැයිස්තුව......................................................................iv

| | | |
|---|---|---|
| I | හැඳින්වීම | I |
| II | 2009 අංක 20 දරණ විදුලිබල පනත යටතේ ආර්ථික නියාමනය | I |
| III | 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ ආර්ථික නියාමනය සඳහා විධිවිධාන | 2 |
| IV | ගාස්තු ප්‍රතිපත්තියේ අරමුණු | 4 |
| V | ප්‍රතිපත්ති ප්‍රකාශය | 5 |
| VI | උපාය මාර්ග, ක්‍රියාමාර්ග සහ කාල රාමුව | 5 |

# කෙටි යෙදුම් ලැයිස්තුව

| | |
|---|---|
| BST | තොග සැපයුම් ගාස්තු |
| BSTA | තොග සැපයුම් ගනුදෙනු ගිණුම |
| CEB | ලංකා විදුලිබල මණ්ඩලය |
| CEBEF | ලංකා විදුලිබල මණ්ඩල සේවක අරමුදල් (පුද්ගලික) සමාගම |
| CPI | පාරිභෝගික මිල දර්ශකය |
| EDL | විදුලිබල බෙදාහැරීම් ලංකා (පුද්ගලික) සමාගම |
| EGL | විදුලිබල උත්පාදන ලංකා (පුද්ගලික) සමාගම |
| EVL | බලශක්ති ව්‍යාපාර ලංකා (පුද්ගලික) සමාගම |
| IPP | ස්වාධීන බලශක්ති නිෂ්පාදකයෝ |
| LECO | ලංකා විදුලි (පුද්ගලික) සමාගම |
| LKR | ශ්‍රී ලංකා රුපියල් |
| MOE | බලශක්ති අමාත්‍යාංශය (පෙර - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය) |
| MOF | මුදල් අමාත්‍යාංශය |
| MoPE | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය (වර්තමානයේ බලශක්ති අමාත්‍යාංශය) |
| MYT | බහු-වාර්ෂික ගාස්තු |
| NSO | ජාතික පද්ධති ක්‍රියාකරු (පුද්ගලික) සමාගම |
| NTNSP | ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු (පුද්ගලික) සමාගම |
| O&M | මෙහෙයුම් සහ නඩත්තු |
| PPA | විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම |
| PPP | රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය |
| PUCSL | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව |
| SLSEA | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය |
| SPPA | සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම |
| TOU | භාවිත කරන වේලාව |
| UDA | නාගරික සංවර්ධන අධිකාරිය |

## ඒකක

| | |
|---|---|
| GW | ගිගාවොට් |
| GWh | ගිගාවොට් පැය |
| kWh | කිලෝවොට් පැය |
| MW | මෙගාවොට් |
| V | වෝල්ට් |
| W | වොට් |

## I හැඳින්වීම

රජය සතු සංස්ථාවක් වන ලංකා විදුලිබල මණ්ඩලය (CEB), 1969 වසරේ සිට ශ්‍රී ලංකාවේ විදුලි සැපයුම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම උපයෝගිතා ආයතනය ලෙස කටයුතු කර ඇත .1969 සිට 1996 දක්වා කාලය තුළ, ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සියලුම විදුලි උත්පාදන පහසුකම්වල අයිතිය සහ මෙහෙයුම් කටයුතු සිදු කළ අතර, ඉන් පසුව නව විදුලි උත්පාදනය සඳහා ආයෝජනය කිරීමට පෞද්ගලික අංශයට ආරාධනා කරන ලදී. 2024 වසර අවසානය වන විට, රටේ මුළු විදුලි උත්පාදන ධාරිතාවෙන් 55%ක් ලංකා විදුලිබල මණ්ඩලය සතු වූ අතර, එමඟින් සමස්ත බලශක්ති අවශ්‍යතාවයෙන් 66%ක් සපුරාලන ලදී. වහල මත සවිකරන සූර්ය බලශක්ති පද්ධති (rooftop solar) ඇතුළුව ඉතිරි ධාරිතාව සහ බලශක්ති ප්‍රමාණය පෞද්ගලික ආයෝජකයින් විසින් සපයන ලදී.

1996 වසරේ සිට, තෙල් මත පදනම් වූ තාප විදුලි උත්පාදනය (thermal generation) සඳහා පෞද්ගලික ආයෝජන කැඳවනු ලැබූ අතර, හඳුන්වාදීමේ පියවරක් ලෙස පුනර්ජනනීය බලශක්තිය පදනම් කරගත් විදුලි උත්පාදනය දිරිමත් කිරීම සඳහා සැපයුම් මත පදනම් වූ ගාස්තු ක්‍රමවේද (feed-in-tariffs) හඳුන්වා දෙන ලදී. 2024 වසර අවසානය වන විට, ලංකා විදුලිබල මණ්ඩලය සතු බලාගාර 29ක් (පුනර්ජනනීය 20ක් සහ තාප විදුලි 9ක්), පෞද්ගලික විදුලි නිෂ්පාදකයින් 346ක් (තාප විදුලි 2ක් සහ අනෙක්වා පුනර්ජනනීය) සහ වහල මත සවිකරන සූර්ය බලශක්ති ඒකක 93,064ක් මෙරට පද්ධතිය තුළ ක්‍රියාත්මක විය.

විදුලිය සම්ප්‍රේෂණය සහ පද්ධති මෙහෙයුම් කටයුතු ද 1969 වසරේ සිට ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සතු අනන්‍ය අයිතියක්ව පැවතුණි.

භාණ්ඩාගාරය විසින්1983 වසරේදී ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සහ නාගරික සංවර්ධන අධිකාරිය (UDA) කොටස්කරුවන් ලෙස දායක වන ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO), ස්ථාපිත කරන ලදී.2024 වසර අවසානය වන විට, ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO)පාරිභෝගිකයින් 631,000කට පමණ සේවය සැපයූ අතර, එය රටේ මුළු පාරිභෝගිකයින් මිලියන 7.73කින් 8%ක පමණ ප්‍රතිශතයක් වේ..ඉතිරි පාරිභෝගිකයින් මිලියන 7.1 ක පිරිසකට ලංකා විදුලිබල මණ්ඩලයේ (CEB) බෙදාහැරීමේ අංශ හතර මඟින් සේවා සපයනු ලැබේ. ශ්‍රී ලංකාවේ විදුලි බෙදාහරින්නන් විසින් බෙදාහැරීමේ ජාල පවත්වාගෙන යාම සහ විදුලිය සැපයීම යන කාර්යයන් දෙකම සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තයේ මෙහෙයුම් 'තනි ගැනුම්කරු ආකෘතිය' (single buyer model) අනුගමනය කරන අතර, ඒ අනුව සියලුම විදුලි උත්පාදනයන් ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ (නොවන) අංශයට විකිණීම අනිවාර්ය වේ. මෙම අංශය කාර්යයන් තුනක් ඉටු කරයි: (i) තනි ගැනුම්කරු, (ii) තොග සැපයුම්කරු, සහ (iii) පද්ධති මෙහෙයුම්කරු

## II 2009 අංක 20 දරන විදුලිබල පනත යටතේ ආර්ථික නියාමනය

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත (සංශෝධිත පරිදි) මඟින් ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්යයන් සඳහා වෙන වෙනම බලපත්‍ර ලබා ගැනීම අනිවාර්ය කළ අතර, එමඟින් ලංකා විදුලිබල මණ්ඩලය එකම ආයතනයක් තුළ පවතින පරිදි එහි කාර්යභාරයන් අනුව වෙන් කිරීමට (functionally unbundled) පියවර ගන්නා ලදී ඒ අනුව, ලංකා විදුලිබල මණ්ඩලය (CEB) වෙත බලපත්‍ර හයක් නිකුත් කරන ලදී: එනම් උත්පාදනය සඳහා එක් බලපත්‍රයක් ද, සම්ප්‍රේෂණය සඳහා එක් බලපත්‍රයක් ද (සම්ප්‍රේෂණ ජාලය, තොග සැපයුම් සහ මෙහෙයුම් කටයුතු ආවරණය වන පරිදි), සහ විදුලිය බෙදාහැරීම සහ සැපයීම සඳහා බලපත්‍ර හතරක් ද (ලංකා විදුලිබල මණ්ඩලය තුළ ඒ වන විටත් පිහිටුවා තිබූ බෙදාහැරීමේ අංශ හතරට අනුකූල වන පරිදි) වේ. ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO), ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ අංශයෙන් විදුලිය මිලදී ගෙන එය බෙදාහැරීම සහ පාරිභෝගිකයින්ට සැපයීම සිදු කරන වෙනම බලපත්‍රලාභී බෙදාහැරීමේ සමාගමක් ලෙස තවදුරටත් කටයුතු කරන ලදී2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත (සංශෝධිත පරිදි), ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තයේ ආර්ථික, තාක්ෂණික සහ ආරක්ෂණ නියාමකයා ලෙස කටයුතු කිරීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) වෙත බලතල පවරා ඇත. අනෙකුත් අවශ්‍යතා අතර, සම්ප්‍රේෂණ හා තොග සැපයුම් ගාස්තු මෙන්ම බෙදාහැරීමේ හා සැපයුම් ගාස්තු ද, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) විසින් අනුමත කරන ලද පිරිවැය පිළිබිඹු කරන ක්‍රමවේදයකට (cost reflective methodology)

අනුකූලව එම කොමිෂන් සභාව විසින්ම තීරණය කළ යුතුව තිබුණි. ඒ අනුව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) විසින් 2011 වසරේදී ගාස්තු ක්‍රමවේදය ප්‍රකාශයට පත් කරන ලද අතර, එය 2016 සහ 2021 වසරවලදී යාවත්කාලීන කරන ලදී. 2011 ගාස්තු ක්‍රමවේදය මඟින්(අ) වසර පහක පාලන කාල සීමාවක් සහිත සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ගාස්තු සඳහා බහු-වසර ගාස්තු තීරණය කිරීමේ ක්‍රියා පටිපාටියක් (multi-year tariff - MYT) ද, (ආ) මාස හයක පාලන කාල සීමාවක් සහිත තොග සැපයුම් ගාස්තු (ජනවාරි සිට ජූනි දක්වා සහ ජූලි සිට දෙසැම්බර් දක්වා) ද ස්ථාපිත කරන ලදී. අනාවැකි පළ කරන ලද (forecast) මාස හයක තොග සැපයුම් ගාස්තු තීරණය කිරීමේ ක්‍රියා පටිපාටිය මෙම ක්‍රමවේදය මඟින් ස්ථාපිත කරන ලද අතර, එහිදී පෙර මාස හයක පාලන කාල සීමාව තුළ වූ අනාවැකිගත පිරිවැය සහ සැබෑ තොග සැපයුම් පිරිවැය අතර පවතින ඕනෑම නොගැලපීමක් (mismatch) පිළිබිඹු වන පරිදි එම ගාස්තු සංශෝධනය කරනු ලබයි. ඒකාකාරී ජාතික ගාස්තු ප්‍රතිපත්තිය (policy of uniform national tariffs) ක්‍රියාත්මක කිරීම සඳහා තොග සැපයුම් ගාස්තු සංශෝධනය කිරීමේ ක්‍රියා පටිපාටිය ද මෙම ක්‍රමවේදය මඟින් ස්ථාපිත කරන ලදී. එමෙන්ම, අනාවැකි පළ කරන ලද පාරිභෝගික මිශ්‍රණය (forecast customer mix) සහ සැබෑ පාරිභෝගික මිශ්‍රණය (actual customer mix) අතර පවතින නොගැලපීම හේතුවෙන් ඇති වන ඕනෑම ආදායම් අඩුවීමක් (shortfall) හෝ අතිරික්තයක් (surplus) නිවැරදි කිරීම සඳහා ද එම ක්‍රියා පටිපාටිය මඟ පෙන්වයි.

සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ගාස්තු සඳහා ප්‍රථම ගොනු කිරීම (tariff filing) 2010 වසරේදී සිදු කරන ලද්දේ, 2011 ජනවාරි මාසයේ සිට ආරම්භ වූ පළමු පාලන කාල සීමාව (control period) සඳහාය. 2011-2020 කාලය තුළ වසර පහ බැගින් වූ චක්‍ර දෙකක් අවසන් කිරීමෙන් පසුව, 2021 වසරේ සිට සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ගාස්තු සඳහා වන බහු-වසර ගාස්තු (MYT) පාලන කාල සීමාව වසර තුනක් ලෙස ස්ථාවර කර ඇත. සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ගාස්තු සඳහා වන සිව්වන බහු-වසර ගාස්තු (MYT) පාලන කාල සීමාව 2024 වසරේදී ආරම්භ විය. 2011 ජනවාරි මාසයේ සිට මාස හයක්ව පැවති තොග සැපයුම් ගාස්තු සඳහා වූ පාලන කාල සීමාව, 2024 වසරේ සිට මාස තුනක් දක්වා (එනම් කාර්තුමය පදනමින්) අඩු කර ඇත. ගාස්තු ගොනු කිරීමේ සහ තීරණය කිරීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා, 2016 වසරේදී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) විසින් 'ගාස්තු තීරණය කිරීම සඳහා වන රීති' (Rules for Tariff determination) නිකුත් කරන ලදී. උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම සඳහා බලපත්‍රලාභීන් විසින් සිදු කරනු ලබන ගාස්තු ගොනු කිරීම් සහ බලපත්‍රලාභීන්ගේ දත්ත පසුව ඉදිරිපත් කිරීම (ex-post filing), එම කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආකෘති පත්‍ර (formats) සහ අච්චු (templates) මඟින් විධිමත් කර ඇත

## **III** අංක **36** දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ ආර්ථික නියාමනය පිළිබඳ විධි විධාන

Sri Lanka Electricity Act, No. 36 of 2024, as amended by Sri Lanka Electricity (Amendment) Act, No. 14 of 2025, provides for the CEB to be unbundled into separate companies, which are required to be financially independent, four of which will be subject to regulation in term of the Act. 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සහ 2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත මගින් හඳුන්වා දී ඇති ප්‍රතිපාදනවලට අනුව, ලංකා විදුලිබල මණ්ඩලය වෙන් වෙන් වශයෙන් පවතින සමාගම්වලට විභජන කළ යුතුයමෙම එක් එක් සමාගම මූල්‍යමය වශයෙන් ස්වාධීන විය යුතු අතර, ඉන් සමාගම් හතරක් මෙම පනතේ විධිවිධාන ප්‍රකාරව නියාමනයට යටත් විය යුතුය. මෙම සමාගම් හතරේ කාර්යභාරයන් පහත පරිදි වේ:

(a) විදුලිබල උත්පාදන ලංකා (පුද්ගලික) සමාගම- Electricity Generation Lanka (Private) Limited (EGL);

*කාර්යයන්: විදුලිය උත්පාදනය කිරීම, ලංකා විදුලිබල මණ්ඩලයේ සියලුම බලාගාරවල වත්කම්, බැරකම් සහ මෙහෙයුම් කටයුතු පවරා ගැනීම.*

(b) ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු (පුද්ගලික) සමාගම- National Transmission Network Service Provider (Private) Limited (NTNSP);

*කාර්යයන්: ජාතික පද්ධතිය සමන්විත වන භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම සහ මෙහෙයවීම මෙන්ම ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ පද්ධතියට අදාළ සියලුම වත්කම්, බැරකම් සහ මෙහෙයුම් කටයුතු පවරා ගැනීම.*

(c) ජාතික පද්ධති ක්‍රියාකරු (පුද්ගලික) සමාගම -National System Operator (Private) Limited (NSO);

*කාර්යයන්: විදුලි උත්පාදන බලාගාර කාලසටහන්ගත කිරීම , ඒවා පද්ධතියට සම්බන්ධ කිරීම (Commitment) සහ ආර්ථික පිරිවැය මත පදනම්ව ප්‍රේෂණය මෙහෙයවීම (Economic Dispatch) මෙන්ම අනාගත විදුලි උත්පාදන සහ සම්ප්‍රේෂණ ධාරිතාව සැලසුම් කිරීමට අදාළ කාර්යයන්.*

(d) විදුලිබල බෙදාහැරීම් ලංකා (පුද්ගලික) සමාගම Electricity Distribution Lanka (Private) Limited (EDL);

*කාර්යයන්: විදුලිය බෙදාහැරීම සහ සැපයීම මෙන්ම ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීමේ කොට්ඨාස හතරේ (04) වත්කම්, බැරකම් සහ මෙහෙයුම් කටයුතු පවරා ගැනීම.*

පත් කරන ලද දින සිට ක්‍රියාත්මක වන පරිදි, සෑම සමාගමක්ම ලංකා විදුලිබල මණ්ඩලයේ පහත සඳහන් වත්කම් සහ ක්‍රියාකාරකම් පවරා ගැනීම, ඒවායේ අයිතිය දැරීම සහ මෙහෙයවීම සිදු කරනු ලබයි
EGL: බලාගාර 29කින් සමන්විත, ලංකා විදුලිබල මණ්ඩලය සතු සියලුම උත්පාදන වත්කම්.
NTNSP: ලංකා විදුලිබල මණ්ඩලය සතු සියලුම සම්ප්‍රේෂණ වත්කම්(transmission assets)
NSO: ලංකා විදුලිබල මණ්ඩලය සතු රැහැන්ගත නොවන (non-wired) සම්ප්‍රේෂණ මට්ටමේ සියලුම මෙහෙයුම් කටයුතු (තොග සැපයුම් සහ පද්ධති මෙහෙයුම් කටයුතු).
EDL: කොට්ඨාස හතරකින් (04) සමන්විත, ලංකා විදුලිබල මණ්ඩලය සතු සියලුම බෙදාහැරීමේ වත්කම් සහ සිල්ලර සේවා (retail service).
විදුලිබල පනතේ I වන උපලේඛනයෙහි විස්තර කර ඇති විදුලිබල කර්මාන්තයේ ව්‍යුහයට අනුකූලව, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත තවත් සීමිත ඇපකාර සමාගම් දෙකක් (limited liability companies) මගින් ලංකා විදුලිබල මණ්ඩලයේ ඉතිරි වත්කම් සහ කාර්යයන් පවරා ගනු ලැබේ.

(a) CEB Employees Fund (Private) Limited (CEBEF);
(b) Energy Ventures Lanka (Private) Limited (EVL)

ඉහත සඳහන් ආයතනවලට අමතරව, 2024 වසර අවසානය වන විට පෞද්ගලික විදුලි නිෂ්පාදකයින් 346ක් (තාප විදුලි බලාගාර 02ක් සහ අනෙක් ඒවා පුනර්ජනනීය බලශක්ති පදනම් කරගත් බලාගාර) සහ වහල මත සවිකළ සූර්ය බලශක්ති ඒකක 93,064ක් ක්‍රියාත්මක මට්ටමේ පැවතුණි.

LECO is a distributor of electricity in its service area. ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO) එහි සේවා බල ප්‍රදේශය තුළ විදුලිය බෙදාහරින්නෙකු ලෙස කටයුතු කරනු ලබයි.
විදුලිබල උත්පාදන සමාගම (EGL) සතු සෑම බලාගාරයක්ම ජාතික පද්ධති මෙහෙයුම්කරු (NSO) සමඟ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමකට (Power Purchase Agreement) එළඹෙනු ඇත. සියලුම පෞද්ගලික විදුලි නිෂ්පාදකයින්, විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමකට (මෙගාවොට් 10කට වඩා වැඩි බලාගාර සඳහා) හෝ ප්‍රමිතිගත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමකට (මෙගාවොට් 10 දක්වා වූ පුනර්ජනනීය බලශක්ති පදනම් කරගත් බලාගාර සඳහා) එළඹ ඇත. ලංකා විදුලිබල මණ්ඩලය විසින් වහල මත සවිකළ සූර්ය බලශක්ති ඒකක සම්බන්ධයෙන්, පද්ධතිගත (on-grid) වහල මත සවිකළ සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා (PV) උත්පාදන පහසුකම් සඳහා වන ගිවිසුම්වලට දැනටමත් එළඹ ඇත. මෙම ගිවිසුම් ඉදිරියේදී ජාතික පද්ධති මෙහෙයුම්කරු (NSO) වෙත පවරා දෙනු ලැබේ.

ජාතික පද්ධති මෙහෙයුම්කරු (NSO) විසින් විදුලිය තොග වශයෙන් මිලදී ගැනීම, විකිණීම සහ පද්ධති මෙහෙයුම් කටයුතු සිදු කළ යුතුය. NSO shall also be the single-buyer for all generation, except for generators participating in open access once it is made operational, as provided for in the Electricity Act 2024. 2024 විදුලිබල පනතේ දක්වා ඇති පරිදි, විවෘත ප්‍රවේශ (Open Access) ක්‍රමය ක්‍රියාත්මක වූ පසු ඊට සහභාගී වන උත්පාදකයින් හැර, අනෙකුත් සියලුම උත්පාදනයන් සඳහා ජාතික පද්ධති මෙහෙයුම්කරු (NSO) "ඒකල ගැනුම්කරු" (Single-buyer) ලෙස කටයුතු කළ යුතුය.

ජාතික පද්ධති මෙහෙයුම්කරු (NSO) විසින් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් වෙත (Electricity Distribution Lanka - EDL හි බෙදාහැරීමේ කොට්ඨාස හතර සහ ලංකා විදුලි පුද්ගලික සමාගම - LECO) විදුලිය අලෙවි කළ යුතු අතර, එම බලපත්‍රලාභීන් ජාතික පද්ධති මෙහෙයුම්කරු සමඟ විදුලිය විකිණීමේ ගිවිසුම්වලට (Power Sale Agreements) එළඹිය යුතුය. ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු

(NTNSP) ජාතික පද්ධති මෙහෙයුම්කරු සමඟ සම්ප්‍රේෂණ සේවා ගිවිසුමකට (Transmission Service Agreement) එළඹෙනු ඇත.

මෙම ගාස්තු ප්‍රතිපත්තිය 2024 විදුලිබල පනත යටතේ පවතින ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයක් වන අතර, නියාමන ආයතනය (Regulator) සහ සියලුම බලපත්‍රලාභීන් විසින් එය අනුගමනය කළ යුතුය. 2024 විදුලිබල පනතේ 4 (10) (v) වගන්තිය යටතේ වන ප්‍රතිපාදනවලට අනුකූලව ක්‍රියා කරමින්, මෙම ජාතික ගාස්තු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා අමාත්‍යවරයා විසින් වරින් වර ලිඛිතව ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය හැකිය.

## IV ගාස්තු ප්‍රතිපත්තියේ අරමුණු

මෙම ගාස්තු ප්‍රතිපත්තියේ අරමුණු වනුයේ, ප්‍රතිපත්ති, උපායමාර්ග සහ ප්‍රතිඵල ලබාදීමේ රාමුව (අවශ්‍ය අවස්ථාවලදී කාලරාමු ද ඇතුළත්ව) සැලසුම් කිරීමයි. [2024 විදුලිබල පනතට අදාළ යොමු කිරීම් වරහන් තුළ දක්වා ඇත].

1. නියාමනය කරනු ලබන ආයතන විසින් සපයනු ලබන විදුලිය සහ ඒ ආශ්‍රිත සේවාවන්හි මිල තීරණය කිරීමේදී, පාරිභෝගිකයින්ට දැරිය හැකි බව (Affordability), සාධාරණත්වය (Equity) සහ සමානත්වය (Equality) සහතික කිරීම. [2024 විදුලිබල පනතේ 2(ඌ) වගන්තිය]

2. නියාමනය කරනු ලබන ආයතනවල ආයෝජන සඳහා සාධාරණ ප්‍රතිලාභයක් ඇතුළුව, මූල්‍යමය තිරසාරභාවය සහතික කිරීම. [2024 විදුලිබල පනතේ 3(3)(vi) වගන්තිය]

3. to provide principles to be adhered to by the Regulator in setting the tariffs [Electricity Act section 29(1)] [list of tariffs to be fixed by the Regulator following the Tariff Policy are given in Electricity Act 2024 section 29(3)] ගාස්තු නියම කිරීමේදී නියාමන ආයතනය විසින් අනුගමනය කළ යුතු මූලධර්ම සැපයීම [විදුලිබල පනතේ 29(1) වගන්තිය]; (ගාස්තු ප්‍රතිපත්තියට අනුකූලව නියාමන ආයතනය විසින් නියම කළ යුතු ගාස්තු ලේඛනය 2024 විදුලිබල පනතේ 29(3) වගන්තියෙහි දක්වා ඇත).

4. විවෘත ප්‍රවේශ ගාස්තු (Open Access Charges) නියම කිරීමේදී අනුගමනය කළ යුතු මූලධර්ම නිශ්චිතව දැක්වීම [2024 විදුලිබල පනතේ 29(8) වගන්තිය] සහ තොග විදුලි වෙළඳපලේ (Wholesale Market) මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික පූර්ව අවශ්‍යතාවයන් සැපයීම

5. සහනාධාර (Subsidies) සහ අන්තර්-සහනාධාර (Cross-subsidies) ලබා දීමේදී පදනම් කරගත යුතු මූලධර්ම නිශ්චිතව දැක්වීම. [2024 විදුලිබල පනතේ 13(1) සහ 29(11)(අ) සහ (ආ) වගන්ති]

6. විදුලි සැපයුම් අගය දාමයේ (Value Chain) කාර්යක්ෂමතාව ඉහළ නැංවීම ප්‍රවර්ධනය කිරීම සහ ඉල්ලුම් පාර්ශවයේ (Demand Side) බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම ප්‍රවර්ධනය කිරීම. [විදුලිබල පනතේ 5(3)(i) වගන්තිය]

7. තරඟකාරී ගාස්තු සහ විදුලි සැපයුමෙහි විශ්වාසනීයත්වය මගින් පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම; [2024 විදුලිබල පනතේ 4(3)(අ) වගන්තිය]

එමගින්, ජාතික විදුලිබල ප්‍රතිපත්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

## V ප්‍රතිපත්ති ප්‍රකාශය

විදුලි සැපයුම් ධාරිතාව, විද්‍යුත් බලශක්තිය සහ අනෙකුත් අදාළ සහායක සේවාවන් සැපයීම සඳහා වන පිරිවැය, මිල ගණන් සහ මිල ව්‍යුහය සාමූහිකව "විදුලි ගාස්තු" ලෙස හඳුන්වනු ලැබේ.

1. ගාස්තුවලට ඇතුළත් කර ඇති විදුලි උත්පාදන පිරිවැය, තරඟකාරී ලෙස ප්‍රසම්පාදනය කරන ලද විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (Power Purchase Agreements) මත පදනම් වූ සහ "ආරක්ෂක සීමාවන්ට යටත් ආර්ථික මෙහෙයවීම (Security Constrained Economic Dispatch) සිදු කරනු ලබන බලාගාරවල පිරිවැය මත පදනම් විය යුතුය.
2. තොග මිලදී ගැනීමේ ගාස්තු, තොග විකිණීමේ ගාස්තු, සම්ප්‍රේෂණ ගාස්තු, විවෘත ප්‍රවේශ ගාස්තු, බෙදාහැරීමේ ගාස්තු සහ සැපයුම් ගාස්තු පිරිවැය පරාවර්තනය විය යුතු අතර, එමගින් නියාමනය කරනු ලබන ආයතන නියමිත කාර්ය සාධන නිර්ණායක සපුරාලීම යටතේ, ඒවායේ මූල්‍යමය තිරසාරභාවය සහතික කළ යුතුය.
3. අවසන් පරිභෝජක පාරිභෝගික වර්ගීකරණය, ගාස්තු සහ පවතිනු ලබන ගාස්තු විකල්ප, සියලුම බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සඳහා ඒකාකාරී (Uniform) විය යුතුය.
4. පද්ධතිමය සම්පත් (Grid Resources) පරිහරණය කිරීම වෙනුවෙන් එක් එක් පාරිභෝගික කාණ්ඩ සඳහා පිරිවැය පරාවර්තනය වන ගාස්තු (Cost-reflective tariffs) ක්‍රියාත්මක කළ යුතුය.
5. නිවාස සඳහා වන ජීවනෝපාය සහන ගාස්තු (Lifeline tariffs) සහ අනෙකුත් සහනාධාරිත හෝ සාමාජීයකරණය කරන ලද ගාස්තු, සුදුසුකම් ලත් පාරිභෝගිකයින් සහ පරිශීලකයින් වෙත පමණක් ඉලක්කගත විය යුතුය.
6. පිරිවැය සහ තාක්ෂණික වශයෙන් කාර්යක්ෂම භාවිතය, ඉල්ලුම කළමනාකරණය (Demand Management) සහ සම්පත් සංරක්ෂණය ප්‍රවර්ධනය වන පරිදි අවසන් පරිභෝජක පාරිභෝගික ගාස්තු ව්‍යුහගත කළ යුතුය.
7. ගාස්තු තීරණය කිරීමේ ක්‍රියාවලියේ විවික්ත ලක්ෂණ සහ පුනර්ජනනීය බලශක්ති සම්පත්වල ඍතුමය ස්වභාවය හේතුවෙන් සිදුවන අවසන් පරිභෝජක ගාස්තු උච්චාවචනයන් මෙන්ම පොසිල ඉන්ධන මිලෙහි විචලනයන් සමනය කළ යුතුය (Fluctuations of end-use tariffs owing to discrete features of the tariff determination process and seasonality of renewable energy resources, and variations of fossil fuel prices shall be smoothened.)
8. ලංකා විදුලිබල මණ්ඩලය සතු ණය බර අනුප්‍රාප්තික ආයතන වෙත පැවරිය යුතු අතර, ඒවා අවසන් පරිභෝජක පාරිභෝගික ගාස්තු හරහා අයකර ගත යුතුය
9. අවසන් පරිභෝජක ගාස්තු, දකුණු සහ ගිනිකොනදිග ආසියානු කලාපයේ තරඟකාරී ආර්ථිකයන් සහිත රටවල පවතින ගාස්තු සමඟ සැසඳිය (benchmarked) යුතුය
10. සමාගම් ස්වයං-මූල්‍යකරණය (Self-financing) විය යුතු යැයි අදහස් කෙරේ.සමාගම්වල මූල්‍ය ශක්තිමත්භාවය (Financially viable) සහතික වන පරිදි ගාස්තු ව්‍යුහගත කළ යුතුය. මෙම සමාගම් සම්පූර්ණයෙන්ම රජය සතු වන අතර, එහි අරමුණ ලාභය උපරිම කිරීම නොව, දැරිය හැකි ගාස්තුවලට විදුලිය සැපයීමයි. 1 සිට 9 දක්වා වූ ප්‍රතිපත්ති යටතේ දක්වා ඇති උපායමාර්ග සහ ක්‍රියාමාර්ග හරහා මෙම ප්‍රතිපත්තිය සාක්ෂාත් කරගනු ලබයි.

## VI උපායමාර්ග, ක්‍රියාමාර්ග සහ කාලරාමුව

1. **ගාස්තුවලට ඇතුළත් කර ඇති විදුලි උත්පාදන පිරිවැය, තරඟකාරී ලෙස ප්‍රසම්පාදනය කරන ලද විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (Power Purchase Agreements) මත පදනම් වූ සහ ආරක්ෂක සීමාවන්ට යටත් ආර්ථික ප්‍රේෂණ මෙහෙයවීම (Security Constrained Economic Dispatch) සිදු කරනු ලබන බලාගාරවල පිරිවැය මත පදනම් විය යුතුය.**

| උපායමාර්ග, ක්‍රියාමාර්ග සහ ක්‍රියාත්මක කිරීමේ කාලරාමුව | | ක්‍රියාත්මක වන දින සිට |
|---|---|---|
| **උපායමාර්ග 1.1: විදුලි උත්පාදනය සඳහා වන ලංකා විදුලිබල මණ්ඩලයේ අනුප්‍රාප්තික ආයතනය (EGL) සහ ජාතික පද්ධති මෙහෙයුම්කරු (NSO) අතර වන විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (PPAs), සිය කැපවීම්/බැඳීම් (commitments) ඉටු කිරීමට ප්‍රමාණවත් වන ගාස්තු ඇතුළත් විය යුතුය.** | | |
| 1.1.1 | විදුලිබල උත්පාදන සමාගම (EGL) විසින් විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (PPAs) සඳහා වන ධාරිතාව පිරිවැය (Capacity Costs), බහු-වසර ගාස්තු (MYT) රාමුවක් | 2026 ජූලි මස |

| | | |
|---|---|---|
| | මත පදනම්ව, මුලින් වසර 03ක කාලසීමාවක් සඳහා නියාමන ආයතනයේ අනුමැතිය පිණිස ඉදිරිපත් කළ යුතුය. | |
| 1.1.2 | ගොනු කරන ලද ධාරිතා පිරිවැය (Capacity Costs) මගින්, පවතින වත්කම්වල ණය බැදීම් (ඇත්නම්), පවතින සහ නව වත්කම්වල ස්ථාවර මෙහෙයුම් සහ නඩත්තු (O&M) පිරිවැය, ක්ෂයවීම්, පොලී පිරිවැය සහ නව වත්කම් සඳහා වන ආයෝජන ප්‍රතිලාභ (කාර්යක්ෂමතාව හෝ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම් සඳහා වන ඒවා ඇතුළත්ව), කාරක ප්‍රාග්ධනය සඳහා වන පොලී, ආයතනික පිරිවැය සහ රක්ෂණ ගාස්තු අයකර ගත යුතුය. නොමිලේ පවරා දෙන ලද (transferred free of charge) උත්පාදන වත්කම් සඳහා ආයෝජන ප්‍රතිලාභයක් (return on investment) ලබා ගැනීමට ඉඩ දෙනු නොලැබේ. කෙසේ වෙතත්, මෙම බලාගාර අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා හෝ අනපේක්ෂිත නඩත්තු කටයුතු වෙනුවෙන් අනාගතයේදී ආයෝජන සිදු කිරීමට අවශ්‍ය විය හැකිය. | දැනටමත් සිදු කරමින් පවතී |
| 1.1.3 | විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමක බලශක්ති පිරිවැය, ඉන්ධන පිරිවැය (අදාළ වන්නේ නම්), මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය සහ ආරම්භක/නැවැත්වීමේ පිරිවැය (අදාළ වන්නේ නම්) යන අංගයන්ගෙන් සමන්විත විය යුතුය. | |
| 1.1.4 | විදුලිබල උත්පාදන සමාගම සතු බලාගාරවල මහා පරිමාණ අලුත්වැඩියාවන්, වැඩිදියුණු කිරීම්, පුනරුත්ථාපනය කිරීම් , ප්‍රතිශක්තිකරණය (repowering), ඉන්ධන මාරු කිරීම, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ ජීව කාලය දීර්ඝ කිරීම සඳහා වන ආයෝජන වෙනුවෙන්, දිගුකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්මට අනුකූලව වෙනම නියාමන ගොනු කිරීමක සිදු කළ යුතුය; තවද ඒවා ක්‍රියාත්මක කිරීමෙන් පසු, එම ආයෝජන සඳහා ක්ෂයවීම්, පොලී පිරිවැය සහ වත්කම් මත ප්‍රතිලාභ ලබා ගැනීමට ඉඩ දෙනු ලැබේ. වත්කම් මත ප්‍රතිලාභය මුලින් 2%ක් වනු ඇති අතර, එය 2.3.12 හි විස්තර කර ඇති අධ්‍යයනයේ ප්‍රතිඵල මත පදනම්ව සංශෝධනය කිරීමට යටත් වේ. | 2026, ජනවාරි මස |
| 1.1.5 | ඕනෑම තාක්ෂණයක් භාවිතා කරන සියලුම විදුලිබල උත්පාදන (EGL) බලාගාර විසින්, මූල්‍යමය වශයෙන් ශක්‍ය වූ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ පියවර සහ ආයෝජන හඳුනා ගැනීම සඳහා අනිවාර්ය බලශක්ති විගණනයක්සිදු කළ යුතු අතර; එම විගණනය ජාත්‍යන්තර හොඳම පුරුදු සමඟ අනුකූල විය යුතුය.. නියාමන ආයතනයේ අනුමැතිය ලැබීමෙන් පසු, එවැනි ආයෝජන MYT රාමුවට හෝ EGL විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂිත ගොනු කිරීමකට ඇතුළත් කළ යුතුය. | විගණනය 2026 දෙසැම්බර් මස වන විට අවසන් කළ යුතුය |
| 1.1.6 | EGL විසින් ඉදිරිපත් කරනු ලබන සියලුම පිරිවැය විස්තරාත්මක මූල්‍ය විගණනයකට යටත් විය යුතු අතර, එහි සොයාගැනීම් ප්‍රසිද්ධියට පත් කළ හැකිය. | |
| 1.1.7 | බලාගාර නඩත්තු කිරීම සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් දෙපාර්ශවයේම වගකීම්/බැඳීම් ඉටු කර ඇති ප්‍රමාණය තහවුරු කර ගැනීම සඳහා පවතින සියලුම PPAs සම්බන්ධයෙන් විගණනයක් පවත්වනු ලැබේ; මෙගාවොට් (MW) 5ක් හෝ ඊට වැඩි පුනර්ජනනීය බලශක්ති පදනම් කරගත් බලාගාර සඳහා වන ප්‍රමිතිගත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (SPPAs) ද මෙයට ඇතුළත් වේ. | 2027 අවසානය වන විට NSO සම්පූර්ණ කළ යුතුය |
| 1.1.8 | ජාතික පද්ධති මෙහෙයුම්කරු (NSO) විසින් ප්‍රතික්‍රියාශීලී බල කළමනාකරණය සහ ධාරිතාව හා බලශක්ති ගබඩා කිරීම ඇතුළු නමුත් ඒවාට පමණක් සීමා නොවූ සහායක සේවාවන් සැපයීම සඳහා, පවතින හෝ නව වත්කම් භාවිතා කරමින් විදුලිබල උත්පාදන සමාගම (EGL) සමඟ තෝරාගත් පරිදි වෙන් වෙන් ගිවිසුම්වලට එළඹෙනු ඇත. | 2026 ජනවාරි |
| **උපායමාර්ග 1.2: පොසිල ඉන්ධන මගින් ක්‍රියාත්මක වන පවතින සියලුම බලාගාර විසින් තරඟකාරී ලෙස ඉන්ධන ප්‍රසම්පාදනය කළ යුතු අතර, ඒවායේ තාප ප්‍රමාණය සම්බන්ධයෙන් සහතික පත්‍ර ලබා ගත යුතුය..** | | |
| 1.2.1 | EGL සතු පවතින සියලුම තාප විදුලි බලාගාර විසින් ඉන්ධන සපයන්නන් එක් අයෙකු හෝ කිහිප දෙනෙකු සමඟ ඉන්ධන සැපයුම් ගිවිසුම්වලට එළඹිය යුතුය; එහිදී පුනර්ජනනීය බලශක්ති සම්පත්වල ඍතුමය විචලනයන් පියවා ගැනීම සඳහා අවශ්‍ය සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව සැලකිලිමත් වන අතරම, මිල තීරණය කිරීම තරඟකාරී ලෙස සිදුවන බව සහතික කළ යුතුය. | 2026 ජූලි |
| 1.2.2 | ඉන්ධන මිල තීරණය කිරීම තරඟකාරී ලෙස සිදුවන බව සහතික කිරීම සඳහා සහ අවශ්‍ය ඉන්ධන සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව සැලකිලිමත් වෙමින්, ස්වාධීන විදුලි නිෂ්පාදකයින්ගේ (IPPs) පවතින ඉන්ධන සැපයුම් ගිවිසුම් නියාමන ආයතනය විසින් සමාලෝචනය කළ යුතුය. | 2027 ජනවාරි |
| 1.2.3 | EGL සහ IPPs විසින් ස්වාධීන පාර්ශවයක් හරහා තම බලාගාරවල තාප ප්‍රමාණයන් තහවුරු කර ගැනීම සහතික කිරීමට නියාමන ආයතනය කටයුතු කළ යුතුය. මෙය | 2026 දෙසැම්බර් මාසයෙන් පසුව |

| | | |
|---|---|---|
| | මෙතෙක් අනුකූල වී නොමැති පවතින විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (PPAs) සඳහා වන අවශ්‍යතාවයක් වන අතර, ලංකා විදුලිබල මණ්ඩලයේ බලාගාර වෙනුවෙන් NSO සහ EGL අතර අත්සන් කිරීමට නියමිත ගිවිසුම්වලට ද මෙය ඇතුළත් කර ඇත. | සෑම වසර පහකට වරක් විගණනය සිදු කළ යුතුය |
| **උපායමාර්ගය 1.3: අලුතින් ප්‍රසම්පාදනය කරනු ලබන සියලුම විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (PPAs) හෝ අවශ්‍ය අතිරේක සේවාවන්හි (ancillary services) ධාරිතාව, අනුමත කරන ලද දිගුකාලීන විදුලිබල සංවර්ධන සැලැස්මට අනුකූල විය යුතුය.** | | |
| 1.3.1 | යම් වර්ෂයකදී අලුතින් ප්‍රසම්පාදනය කරනු ලබන විදුලි උත්පාදනයේ තනි සහ සමුච්චිත ධාරිතාව, අනුමත කරන ලද උත්පාදන ව්‍යාප්ති සැලැස්මෙහි (දිගුකාලීන විදුලිබල සංවර්ධන සැලැස්මට අයත්) එම වර්ෂය සඳහා දක්වා ඇති ධාරිතාවන් මත පදනම් විය යුතු අතර ඒවාට සීමා විය යුතුය, ඕනෑම අවස්ථාවක පවතින අනුමත සැලසුම්, ක්‍රියාත්මක වන ධාරිතාව සහ දැනට ප්‍රගතියේ පවතින අනුමත ධාරිතා සංවර්ධනයන් මෙන්ම සැබෑ විදුලි ඉල්ලුමෙහි වර්ධනය මත පදනම්ව, නව ගිවිසුම් සඳහා වන ධාරිතා සීමාවන් පිළිබඳව NSO විසින් කාර්තුමය නිවේදනයක් නිකුත් කළ යුතුය. තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව, ජාතික පද්ධති මෙහෙයුම්කරු (NSO) හෝ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි (ඇත්නම්), විදුලිබල පනතේ දක්වා ඇති ධාරිතා සීමාවන්ට යටත් වූ ගිවිසුම්. | 2026 ජනවාරි සිට කාර්තුමය වශයෙන් |
| 1.3.2 | පද්ධති මෙහෙයවීම සඳහා යෙදවිය නොහැකි එක් එක් වර්ගයේ බලාගාරවල විදුලි උත්පාදනය සීමා කිරීම හේතුවෙන් විදුලිය විකුණන්නන්ට සිදුවන මූල්‍යමය අලාභයන් (ඇත්නම්), මෙන්ම පද්ධති මෙහෙයවීම සඳහා යෙදවිය නොහැකි බලාගාරවල විදුලි උත්පාදනය සීමා කිරීම වැළැක්වීම හෝ අවම කිරීම සඳහා යොදාගන්නා "ප්‍රතිලාභ-විරෝධී මෙහෙයුම්" හේතුවෙන් ඒකල ගැනුම්කරු ලෙස NSO හට සිදුවන මූල්‍යමය අලාභයන්/අමතර පිරිවැය ඇත්නම්, පිළිබඳ තොරතුරු NSO විසින් PUCSL වෙත ලබාදිය යුතු අතර, PUCSL විසින් ඒවා සමාලෝචනය කර ප්‍රකාශයට පත් කළ යුතුය. PUCSL හි ප්‍රකාශනයට, එක් කිලෝවොට් පැයක් (kWh) පදනම මත පාරිභෝගික ගාස්තු කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ නිගමනයක් සහ එම පිරිවැය වැඩිවීම අවම කිරීම සඳහා වන PUCSL හි නිර්දේශයන් ඇතුළත් විය යුතුය. | 2026 ජනවාරි සිට කාර්තුමය වශයෙන් |
| 1.3.3 | ආර්ථික ප්‍රශස්තකරණය සඳහා හෝ ජාලයේ ස්ථායිතාව සහතික කිරීම සඳහා යම් විදුලි බලාගාරයක විදුලි උත්පාදනය සීමා කිරීම සිදු කරන්නේ නම්, ඒ වෙනුවෙන් විකුණුම්කරුට කිසිදු මූල්‍යමය වන්දියක් හෝ වෙනත් ආකාරයක වන්දියක් හිමි නොවේ | දැනටමත් ක්‍රියාකාරීත්වයේ පවතී |
| 1.3.4 | සියලුම තාප විදුලි බලාගාර සඳහා නව විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (PPAs) ප්‍රසම්පාදනය කිරීමේ පදනම විය යුත්තේ NSO විසින් කැඳවනු ලබන විවෘත තරඟකාරී ලංසු වන අතර, එහි ගාස්තු යෝජනාව මූලික වශයෙන් ස්ථාවර පිරිවැය සහ විචල්‍ය පිරිවැය යන කොටස් දෙකකින් සමන්විත විය යුතුය | දැනටමත් භාවිතයේ පවතී |
| 1.3.5 | විදුලි මිලදී ගැනීමේ ගිවිසුම්වල සඳහන් වන ගාස්තු (Tariffs) නම් කළ යුත්තේ ශ්‍රී ලංකා රුපියල් වලින් පමණි. මෙහි අරමුණ වන්නේ විනිමය අනුපාත අවදානම ණයකරු/ආයෝජකයා වෙත පැවරීම සහ අදාළ ලංසු ඉදිරිපත් කරන්නන් අතර පවතින තරඟකාරී ක්‍රියාවලිය හරහා එම විනිමය අවදානම සඳහා වන පිරිවැය තීරණය කිරීමට ඉඩ සැලසීමයි | |
| 1.3.6 | CEB විසින් අත්සන් කර ඇති දැනට ක්‍රියාත්මක PPA, SPPA සහ ජාලගත සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා පද්ධති සඳහා වන ගිවිසුම්, නියමිත දිනක සිට NSO වෙත පවරනු ලැබේ." | 2026 ජනවාරි |
| 1.3.7 | සංශෝධිත 2024 විදුලිබල පනතේ 11 වන වගන්තිය යටතේ නිදහස් කර ඇති තාක්ෂණයන් සහ ධාරිතාවන් හැර, පුනර්ජනනීය බලශක්ති පදනම් කරගත් බලශක්ති පද්ධති සඳහා වන නව PPAs ප්‍රසම්පාදනය කිරීම විවෘත තරඟකාරී ලංසු මගින් සිදු කළ යුතු අතර, එහි ගාස්තු ශ්‍රී ලංකා රුපියල්වලින් දැක්විය යුතු අතර එය එක් කොටසකින් (එනම් ශක්තිය සඳහා පමණක්) සමන්විත විය යුතුය | 2026 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ප්‍රකාශයට පත් කරන ඕනෑම ලංසු සඳහා |
| **උපායමාර්ග 1.4: මෙගාවොට් (MW) 10 ට අඩු පුනර්ජනනීය බලශක්ති පදනම් කරගත් බලාගාරවලින් ජනනය ලබා ගැනීම (ප්‍රසම්පාදනය), ක්‍රමිකව තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි සමඟ අනුකූල විය යුතුය** | | |
| 1.4.1 | සපයනු ලබන ස්ථාවර ගාස්තු පදනම මත තරඟකාරී නොවන ලෙස ප්‍රසම්පාදනය කළ හැකි, එවැනි පුනර්ජනනීය බලශක්ති පදනම් කරගත් බලාගාරවල සහ ඒ හා සෘජුවම සම්බන්ධ ගබඩා කිරීමේ හෝ අතිරේක සේවාවන්හි ඉහළ සීමාව සංශෝධිත 2024 විදුලිබල පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. තවද, එකී යාබද ප්‍රදේශයක ප්‍රදේශයක සමුච්චිත ධාරිතාවය සම්බන්ධයෙන් සංශෝධිත 2024 විදුලිබල පනතේ ඇති විධිවිධාන NSO විසින් දැඩි ලෙස අනුගමනය කළ යුතුය එක් එක් තාක්ෂණය | වහාම |

| | | |
|---|---|---|
| | සඳහා, තරඟකාරී නොවන ප්‍රසම්පාදන වෙනුවෙන් පවතින මෙගාවොට් (MW) 10 ක ධාරිතා සීමාව, එක් එක් තාක්ෂණයට අදාළව වඩාත් අඩු උපරිම සීමාවක් | |
| 1.4.2 | නියාමක විසින් තීරණය කරනු ලබන සපයනු ලබන ස්ථාවර ගාස්තු පිරිවැය පරාවර්තනය වන සහ එක් එක් තාක්ෂණයට ආවේණික විය යුතුය. එම ගාස්තු මට්ටම් දෙකකට ස්ථරගත කළ යුතු අතර, පළමු ස්ථරය වසර 6ක් නොඉක්මවිය යුතුය. සපයනු ලබන ස්ථාවර ගාස්තු මාස හයකට වරක් බැගින් සංශෝධනය කළ යුතුය.2026 2026 ජනවාරි 01 දින හෝ ඉන් පසුව අත්සන් කරනු ලබන සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (SPPAs) සහ පද්ධතිගත වහල මත සවිකරන සූර්ය පැනල පද්ධති ජනන පහසුකම් සඳහා වන ගිවිසුම්වල කාලසීමාව වසර 10ක් විය යුතුය. තාක්ෂණික වෙනස්කම්වල සන්දර්භය තුළ, සපයනු ලබන ස්ථාවර ගාස්තු අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණය වරින් වර සමාලෝචනය කරනු ලැබේ. | පත් කරන ලද දිනටපසුව හෝ 2026 ජනවාරි මාසයෙන් පසුව |
| 1.4.3 | සපයනු ලබන ස්ථාවර ගාස්තු තීරණය කරනු ලබන මූලධර්ම පිළිබඳව තීන්දු කිරීම සඳහා වන කමිටුවක් පත් කිරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලබයි සාධාරණ ලෙස සපයනු ලබන ස්ථාවර ගාස්තු ගණනය කිරීමකට එළඹීම සඳහා, අවශ්‍ය අවස්ථාවලදී සියලුම විශේෂඥ ක්ෂේත්‍ර, රාජ්‍ය අංශයේ සියලුම පාර්ශ්වකරුවන් සහ පාරිභෝගිකයින් නියෝජනය වන පරිදි මෙම ස්ථාවර කමිටුවෙහි කටයුතු කිරීම සඳහා සුදුසු පුද්ගලයන්ව හඳුනා ගැනීම සහ සලකා බැලීම මෙම කමිටුව මගින් සිදු කරනු ලබයි | 2026 ජනවාරි |
| 1.4.4 | නියාමක විසින් සපයනු ලබන ස්ථාවර ගාස්තු තීරණය කිරීම සඳහා භාවිතා කළ යුතු පොලී අනුපාත, උද්ධමන අනුපාත, වත්කම් මත ප්‍රතිලාභ සහ වට්ටම් අනුපාත ඇතුළු (නමුත් ඒවාට පමණක් සීමා නොවූ) ප්‍රධාන මූල්‍ය පරාමිතීන්, මුදල් අමාත්‍යාංශයෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබා ගත යුතුය. | 2026 ජනවාරි |
| 1.4.5 | කුඩා ජල විදුලිය, සුළං සහ සූර්ය බලශක්තිය පදනම් කරගත් විදුලි උත්පාදනය (බිම මත සවිකරන ලද හෝ වහල මත සවිකරන ලද) සහ ගබඩා කිරීමේ පද්ධති ඇතුළු ඒවායේ තාක්ෂණික ප්‍රභේදයන් අයත් පරිණත තාක්ෂණයන් සඳහා, නියාමකයා විසින් තීරණය කරනු ලබන සපයනු ලබන ස්ථාවර ගාස්තුකාර්යක්ෂම විය යුතු අතර, කෙසේ වෙතත්, 1.4.7 යටතේ ඇති වහල මත සවිකරන සූර්ය පැනල පද්ධති (rooftop solar PV) සඳහා වන ගාස්තු ඇතුළුව, මෑතකදී ප්‍රකාශයට පත් කරන ලද 'සපයනු ලබන ස්ථාවර ගාස්තු' හෝ තරඟකාරී ලෙස ප්‍රසම්පාදනය කරන ලද විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (PPAs) සඳහා වන ගාස්තු, යන දෙකෙන් අඩු අගය නොඉක්මවිය යුතුය. | 2026 ජනවාරි |
| 1.4.6 | වහල මත සවිකරන සූර්ය පැනල පද්ධති මගින් ලබාදෙන ධාරිතාවය සහ ශක්තිය අර්ථාන්විත ලෙස මැනීම සහ කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා, පද්ධතිගත වහල මත සවිකරන සූර්ය පැනල පද්ධති ජනන පහසුකම් සඳහා වන සියලුම ගිවිසුම් සහ ඒවායේ දිගු කිරීම් (තිබේ නම්), 'ශුද්ධ ප්ලස්' (Net Plus) පදනම මත විය යුතුය. | 2026 ජනවාරි |
| 1.4.7 | වහල මත සවිකරන සූර්ය බලශක්තිය සඳහා, එක් එක් බෙදාහැරීමේ බලපත්‍රලාභියාගේ සේවා ප්‍රදේශය තුළ මෙගාවොට් (kW) 500 කට නොඅඩු සමුච්චිත ධාරිතාවයක් ප්‍රසම්පාදනය කිරීම වෙනුවෙන්, 'සමූහකරණ' (aggregator) ක්‍රියාවලියක් හෝ ඒ හා සමාන ක්‍රමවේදයක් හරහා නියමු තරඟකාරී ක්‍රියාවලියක් NSO විසින් ක්‍රියාත්මක කළ යුතුය. මෙම ප්‍රසම්පාදනය සඳහා අවශ්‍ය වන 'වහල කුලියට දීමේ මාර්ගෝපදේශ' (roof rental guidelines) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) විසින් සකස් කළ යුතුය. මෙතැන් සිට, සියලුම වහල මත සවිකරන සූර්ය පැනල පද්ධති (rooftop solar PV) මෙම ක්‍රමය භාවිතා කරමින් ප්‍රසම්පාදනය කළ යුතුය | 2026 ජූනි වන විට |
| 1.4.8 | පාරිභෝගික-නිෂ්පාදකයින් (prosumers) සතු බැටරි බලශක්ති ගබඩා පද්ධති (BESS) සඳහා වන සපයනු ලබන ස්ථාවර ගාස්තු (feed-in-tariff) මේ වන විටත් ක්‍රියාත්මක වේ. බලශක්ති අමාත්‍යාංශය විසින් එම ක්‍රියාවලිය වසරක කාලයක් ක්‍රියාත්මක වීමෙන් පසුව එම ප්‍රතිපත්තිය සමාලෝචනය කළ යුතු අතර, 2024 විදුලිබල පනතට අනුකූලව ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශයක් නිකුත් කළ හැකිය. | 2026 ජූනි වන විට |
| 1.4.9 | දිවා කාලයේදී ආරෝපණය කර උපරිම ඉල්ලුම පවතින කාලසීමාවන්හිදී (peak) විදුලි පද්ධතියට සැපයුම ලබාදෙන බැටරි බලශක්ති ගබඩා පද්ධතියක් (BESS) සඳහා වන 'සපයනු ලබන ස්ථාවර ගාස්තුව' (feed-in-tariff), බැටරිය ආරෝපණය කිරීම සඳහා මූලික බලශක්ති ප්‍රභවය ලෙස පවතින හෝ නව වහල මත සවිකරන සූර්ය පැනල පද්ධති භාවිතා කරන පාරිභෝගික-නිෂ්පාදකයින් (prosumers) සඳහා පමණක් සීමා විය යුතුය. පද්ධති සම්පත් භාවිතයෙන් හෝ පද්ධතිය සහ සූර්ය පැනල පද්ධති යන දෙකෙහි මිශ්‍රණයක් භාවිතයෙන් බැටරිය ආරෝපණය කිරීමට ඉඩ නොදිය යුතුය. සියලුම වර්ගයේ සහ කාණ්ඩවල පාරිභෝගිකයින්ගේ සහ පාරිභෝගික-නිෂ්පාදකයින්ගේ ස්ථාවර ගාස්තු සහ බලශක්ති ගාස්තු, එක් එක් භාවිත වන වේලාව අන්තරයන්හි පිරිවැය සමඟ පූර්ණ ලෙස අනුකූල වූ පසුව, මෙම ප්‍රතිපත්තියේ වෙනසක් පිළිබඳව සලකා බලනු ලැබේ. | පටිපාටිය දැනටමත් ක්‍රියාත්මකයි |

| | | |
|---|---|---|
| **උපායමාර්ග 1.5: සපයනු ලබන ස්ථාවර ගාස්තු මත පදනම් වූ දැනට ක්‍රියාත්මක ගිවිසුම් දීර්ඝ කිරීමේදී, අඩු පිරිවැය සහිත පුනර්ජනනීය බලශක්තියේ ප්‍රතිලාභ දිගුකාලීනව පාරිභෝගිකයින් වෙත ලබාදීම සහතික කිරීම සඳහා, ඒවායේ විශේෂ තත්ත්වය සැලකිල්ලට ගත යුතුය** | | |
| 1.5.1 | සපයනු ලබන ස්ථාවර ගාස්තු මත පවතින සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (SPPAs) සහ පද්ධතිගත වහල මත සවිකරන සූර්ය පැනල පද්ධති (ජනන පහසුකම් සඳහා වන ගිවිසුම් දීර්ඝ කිරීම, එම ගාස්තු හඳුන්වා දෙන අවස්ථාවේදී ගිවිසුම් දීර්ඝ කිරීම සම්බන්ධයෙන් යම් නිවේදනයක් නිකුත් කර තිබුණේ නම්, එම අවස්ථාවේ ප්‍රකාශයට පත් කරන ලද කොන්දේසි මත පදනම් විය යුතුය. NSO විසින් එවැනි තොරතුරු නියාමක (Regulator) වෙත දැනුම් දිය යුතුය. | 2026 ජනවාරි |
| 1.5.2 | 1අතීතයේදී සම්පත් පිරිවැයක් (resource costs) අය කර නොමැති බව සහ කල් පිරෙන එවැනි SPPA ගිවිසුම් දීර්ඝ කිරීමේදී ද ඒවා අය නොකරන බව සැලකිල්ලට ගනිමින්, දීර්ඝ කරන ලද SPPA සහ පද්ධතිගත වහල මත සවිකරන සූර්ය පැනල පද්ධති ජනන පහසුකම් සඳහා වන ගිවිසුම්වල සියල්ල ඇතුළත් මිල එම තාක්ෂණයටම අදාළ සපයනු ලබන ස්ථාවර ගාස්තු සහිත නව ගිවිසුමක කිලෝවොට් පැයකට (kWh) ගෙවන මිලෙන් 35%ක් නොඉක්මවන බව නියාමක විසින් සහතික කළ යුතුය. | 2026 ජනවාරි |
| **උපායමාර්ග 1.6: බලපත්‍රලාභීන්ගේ පාලනයෙන් බැහැර වූ සහ ගාස්තු ප්‍රතිපත්තියේ වෙනත් කිසිදු විධිවිධානයකින් ආවරණය නොවන අසාමාන්‍ය සිදුවීම් හේතුවෙන් සිදුවන මුදල් පිටතට ගලායාම් සඳහා ඔවුන්ට වන්දි ගෙවිය යුතුය.** | | |
| 1.6.1 | බලපත්‍රලාභීන් සතු බලපත්‍රලාභී ව්‍යාපාරයට අදාළව, බේරුම්කරණ තීන්දු බේරුම්කරණ පිරිවැය, අධිකරණ තීන්දු සහ නීතිමය පිරිවැය හේතුවෙන් දරන්නට වන පිරිවැය සඳහා ඔවුන්ට වන්දි ගෙවිය යුතුය.. | |
| 1.6.2 | බලපත්‍රලාභීන්ගේ වත්කම්වලට බලපාන හෝ ජනන බලාගාර හෝ බලශක්තිය ප්‍රසම්පාදනය කිරීම සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුවන බලහත්කාරී සිදුවීම්වලට අදාළ පිරිවැය පියවා ගැනීම සඳහා බලපත්‍රලාභීන් විසින් අයදුම් කළ යුතුය | |

2. **තොග මිලදී ගැනීමේ ගාස්තු තොග විකිණීමේ ගාස්තු , සම්ප්‍රේෂණ ගාස්තු , විවෘත ප්‍රවේශ ගාස්තු , සහ බෙදාහැරීමේ ගාස්තු සහ සැපයුම් ගාස්තු යනු නියාමනය කරන ලද ආයතන නියමිත කාර්ය සාධන නිර්ණායක සපුරාලීම යටතේ, ඒවායේ මූල්‍ය තිරසාරභාවය සහතික කිරීම සඳහා පිරිවැය පරාවර්තනය විය යුතුය.**

| උපායමාර්ග,ක්‍රියාමාර්ග සහ ක්‍රියාත්මක කිරීමේ කාල රාමුව | | ක්‍රියාත්මක වන දින සිට |
|---|---|---|
| **උපායමාර්ගය 2.1: ජාතික පද්ධති ක්‍රියාකරු (NSO) විසින් සිදුකරනු ලබන පද්ධති මෙහෙයුම් සහ තොග විදුලිය මිලදී ගැනීම් සඳහා වන), පිරිවැය පරාවර්තනය වන එකක් විය යුතුය.** | | |
| 2.1.1 | පද්ධති මෙහෙයුම් සඳහා වන 'අනුමත ආදායම' (allowed revenue), වත්කම්වල ක්ෂය වීම (depreciation), පොලී පිරිවැය, සහ කාර්ය මණ්ඩල හා නඩත්තු වියදම් ඇතුළත් විය හැකි 'ස්ථාවර පිරිවැයෙන්' (fixed costs) පමණක් සමන්විත විය යුතුය. | |
| 2.1.2 | NSO විසින් ගාස්තු අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර, එහි බහු-වාර්ෂික ගාස්තු කාලසීමාව, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ගාස්තු සඳහා වන කාලසීමාවටම සමාන විය යුතුය. | 2026 ජනවාරි |
| 2.1.3 | අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ ක්‍රියාත්මක වන බහු-වාර්ෂික ගාස්තු කාලසීමාවට ගැළපෙන පරිදි සහ නිවැරදිභාවය සහතික වන සේ යාවත්කාලීන කරන ලද 'ගාස්තු අයදුම්පත් ආකෘති' නියාමකයා විසින් ලබා දිය යුතුය. | |
| 2.1.4 | සංශෝධිත 2024 විදුලිබල පනතේ අවශ්‍යතාවය පරිදි මාස තුනක චක්‍රයක් මත පදනම් විය යුතුය | දැනටමත් ක්‍රියාත්මකයි |
| 2.1.5 | තොග විදුලිය මිලදී ගැනීමේ පිරිවැය ඉදිරිපත් කිරීම සකස් කිරීමේදී, පුරෝකථනය කරන ලද ඉල්ලුම සපුරාලීම සඳහා විදුලි බලාගාරවල බෙදාහැරීම් ආකෘතිකරණය සිදු කිරීම, බහුවිධ පරිශීලකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ජල විදුලි පහසුකම් මෙහෙයවීම, සහ අනෙකුත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් හා ගබඩා කිරීමේ පහසුකම්වල දායකත්වය ආකෘතිකරණය කිරීම සඳහා NSO විසින් ජාත්‍යන්තර හොඳම පිළිවෙත් භාවිතා කළ යුතුය | දැනටමත් ක්‍රියාත්මකයි |
| 2.1.6 | ස්වාධීන ඇගයීමක් සිදු කිරීමට හැකි වන පරිදි ප්‍රමාණවත් විස්තර සහිතව, දත්ත සහ ආකෘතිකරණ ප්‍රතිඵල නියාමකයා වෙත ලබා දිය යුතු අතර ඒවා ප්‍රසිද්ධියේ අනාවරණය කළ යුතුය | 2026 ජූලි මාසයේ සිට NSO ක්‍රියාත්මක වන පරිදි |
| උපායමාර්ගය 2.2: සම්ප්‍රේෂණ ගාස්තු ජාලය පුරා ඒකාකාරී විය යුතුය. | | |

| | | |
|---|---|---|
| 2.2.1 | සම්ප්‍රේෂණ ගාස්තු, සම්ප්‍රේෂණ ජාලය පුරා ඒකාකාරී ලෙස අදාළ විය යුතුය. | මේ වන විට ක්‍රියාත්මක වේ |
| 2.2.2 | 2024 විදුලිබල පනතට අනුකූලව අමතර සම්ප්‍රේෂණ බලපත්‍රයක් නිකුත් කරනු ඇතැයි අපේක්ෂා කරන්නේ නම්, සම්ප්‍රේෂණ ගාස්තු තීරණය කිරීමේදී එම පනතේ විධිවිධාන අනුගමනය කළ යුතුය. | අවශ්‍යතාවය පරිදි |
| 2.2.3 | මුදල් වර්ෂය අවසන් වී මාස 9ක් ඇතුළත, ජාතික පද්ධති ක්‍රියාකරු (NSO) විසින් සිය විගණනය කරන ලද ගිණුම් වාර්තා නියාමකයා වෙත ලබා දීම අනිවාර්ය වේ". | |
| **උපායමාර්ගය 2.3: සම්ප්‍රේෂණ ගාස්තු පිරිවැය පරාවර්තනය වන ඒවා විය යුතුය.** | | |
| 2.3.1 | සම්ප්‍රේෂණ ගාස්තු සඳහා පහත සඳහන් අනුමත පිරිවැය ඇතුළත් විය යුතුයක්ෂයවීම : පොලීමෙහෙයුම් සහ නඩත්තු , බදු සහ වත්කම් මත ප්‍රතිලාභ | මේ වන විට ක්‍රියාත්මක වේ |
| 2.3.2 | වැඩ නිම කරන ලද නව සම්ප්‍රේෂණ වත්කම් (transmission assets) වෙනුවෙන්, ගාස්තු අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමට නියමිත අවස්ථාවකදී, අනුමත කරන ලද දීර්ඝකාලීන සංවර්ධන සැලැස්ම පදනම් කරගනිමින් පිරිවැය වාර්තා ඉදිරිපත් කිරීමට සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට (transmission licensee) හැකියාව ඇත. | මේ වන විට ක්‍රියාත්මක වේ |
| 2.3.3 | අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ ක්‍රියාත්මක වන 'බහුවාර්ෂික ගාස්තු-' (MYT) කාලසීමාවට ගැළපෙන පරිදි සහ නව කර්මාන්ත ව්‍යුහය සමඟ ගැළපීම සහතික වන සේ යාවත්කාලීන කරන ලද 'සංශෝධිත ගාස්තු අයදුම්පත් ආකෘති' (revised tariff filing formats), නියාමකයා විසින් ලබා දිය යුතුය. | 2026 ජනවාරි |
| 2.3.4 | ක්ෂය වීම, ව්‍යවස්ථාපිත ගිණුම් සඳහා භාවිතා කරනු ලබන එම ජීව කාලයම සහිතව 'සරල රේඛීය ක්‍රමය' (straight-line method) පදනම් කරගත යුතු අතර, එහි ශේෂ අගයක් නොතිබිය යුතුය. | මේ වන විට ක්‍රියාත්මක වේ |
| 2.3.5 | ක්ෂය වීමේ ප්‍රතිපාදන ආපසු ගෙවිය යුතු ණය මුදලට වඩා සැලකිය යුතු ලෙස අඩු වන අවස්ථාවලදී, ගාස්තු තීරණය කිරීමේ අරමුණ සඳහා 'ත්වරිත ක්ෂය වීම' (accelerated depreciation) ලබා දෙන ලෙස බලපත්‍රලාභියා විසින් නියාමකයාගෙන් ඉල්ලා සිටිය හැකිය පාරිභෝගිකයාගෙන් ගාස්තු අය කළ යුත්තේ .අනුප්‍රාප්තිකආයතනවල දිගුකාලීන මූල්‍ය තිරසාරභාවය (financial sustainability) සඳහා අවශ්‍ය වන පිරිවැය වෙනුවෙන් පමණි". | 2026 ජනවාරි |
| 2.3.6 | ප්‍රාග්ධන ආධාර තිබේ නම්, සහ වෙනත් පාර්ශ්වයක් විසින් (පාරිභෝගිකයින් ඇතුළුව) මුදල් ගෙවා ඇති ආයෝජන සඳහා, කිසිදු ක්ෂය වීමක් පොලී හෝ වත්කම් මත ප්‍රතිලාභයක් ලබා නොදිය යුතුයකෙසේ වෙතත් ., එවැනි වත්කම් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වන ප්‍රාග්ධන ප්‍රතිපූරණය (capital remuneration), වෙනත් ඕනෑම ආයෝජනයක් ලෙස සලකනු ලැබේ. | 2026 ජනවාරි |
| 2.3.7 | ගාස්තු තීරණය කිරීමේ අරමුණු සඳහා, නියාමන වත්කම් පදනම (regulatory asset base) තීරණය කිරීම සම්බන්ධයෙන් ද, අලුතින් එක් කරන ලද වත්කම්, ඉවත් කරන ලද වත්කම්, ඉදිකිරීම් කාලසීමාව තුළ පොලී ප්‍රතිපාදන (interest during construction) සහ විනිමය අනුපාතික වෙනස්වීම් (exchange rate variations) සම්බන්ධයෙන් ද නියාමකයා විසින් පැහැදිලි මාර්ගෝපදේශ නිකුත් කරනු ලබයි. | දැනටමත් නිකුත් කර ඇත |
| 2.3.8 | අනුමත පොලී පිරිවැය (allowed interest costs), බලපත්‍රලාභියාගේ ඉදිරිපත් කිරීම මත පදනම් විය යුතු අතර, වාණිජ මූලාශ්‍රවලින් ණය ලබා ගන්නේ නම්, බලපත්‍රලාභියා විසින් ලබා ගත හැකි හොඳම කොන්දේසි යටතේ එම ණය ප්‍රසම්පාදනය කර ඇති බවට නියාමකයා සෑහීමකට පත්විය යුතුයමේ සම්බන්ධයෙන් නියාමකයා විසින් . .මාර්ගෝපදේශයක් නිකුත් කරනු ලබයි | 2026 ජනවාරි |
| 2.3.9 | අනෙකුත් අනුමත ස්ථාවර පිරිවැය ඉදිරිපත් කරන ලද සැබෑ වියදම්මත (රක්ෂණ වැනි) ලසෑම බලපත්‍ර .පදනම් විය යුතුයාභියෙකු විසින්ම රක්ෂණ අරමුදලක් පිහිටුවිය යුතුය. එම රක්ෂණ අරමුදල කළමනාකරණය කිරීම සඳහා වන මාර්ගෝපදේශ නියාමකයා විසින් සකස් කරනු ලබයි". | මේ වන විට ක්‍රියාත්මක වේ, මාර්ගෝපදේශ 2026 ජූලි මාසය වන විට සකස් කළ යුතුය |
| 2.3.10 | අනුමත මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය, බලපත්‍රලාභියාගේ වඩාත් මෑතකාලීන විගණනය කරන ලද නියාමන ගිණුම් මත පදනම් විය යුතුයඅනුමත මෙහෙයුම් සහ . නඩත්තු පිරිවැය, පාරිභෝගික මිල දර්ශකයට (CPI) අනුව ඉහළ නැංවිය යුතුයඅනුමත . කරන ලද එම පිරිවැය නැවත අයකර ගැනීමක් සිදු නොකළ යුතුය. | |

| | |
|---|---|
| 2.3.11 වියදම් නොකළ ප්‍රාග්ධනය හෝ අතිරික්ත ආයෝජන සඳහා වන අමතර ප්‍රාග්ධන දීමනා, සහ ඊට අනුරූප වත්කම් මත ප්‍රතිලාභ (return on assets) නැවත අයකර ගැනීම එක් එක් 'බහුවාර්ෂික ගාස්තු-' (MYT) කාලසීමාව තුළ එක් වරක් සිදු කළ යුතුය. | **2024 (MYT)** කාලසීමාවේ සිට ආරම්භ කරමින් |
| 2.3.12 අනුමත කළ යුතු වත්කම් මත ප්‍රතිලාභය තීරණය කිරීමේදී, බලපත්‍රලාභී ව්‍යාපාරයේ ණය:සාධාරණත්වය අනුපාතය ණය පිරිවැය සාධාරණත්ව පිරිවැය සහ අවසාන පරිශීලකයින්ට තරඟකාරී ගාස්තු ලබා දීමේ රටේ අරමුණු සඳහා සහාය වීම පිණිස සම්ප්‍රේෂණ ගාස්තු අවම මට්ටමක පවත්වා ගැනීමේ අරමුණ යනාදිය නියාමකයා විසින් නිසි ලෙස සලකා බැලිය යුතුයතිලාභ අනුපාතය අනුමවත්කම් මත ප්‍ර .ත කිරීමෙන් පසු, නියාමකයා විසින් බලශක්ති අමාත්‍යාංශය වෙත වාර්තාවක් නිකුත් කළ යුතුයඑතෙක් ., වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය 2%ක් විය යුතුයඑලෙස ජනනය වන මුදල් අනාගත . එලෙස .ආයෝජන සඳහා පමණක් භාවිතා කිරීමට සමාගම තුළ රඳවා තබා ගත යුතුය රඳවා තබා ගන්නා මුදල් ආයෝජනය නොකරන අවස්ථාවකදී, එම මුදල් පාරිභෝගික ගාස්තු අඩු කිරීම සඳහා යොමු කළ යුතුද යන්න කොටස් හිමිකරුවිසින් තීරණය කළ යුතුය | **2026 ජූලි වන විට,** වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය **2%**ක් විය යුතු අතර එතෙක් එම අනුපාතයම බලාත්මක විය යුතුය |
| 2.3.13 සම්ප්‍රේෂණ වෝල්ටීයතා මට්ටම්වලදී සේවා සපයනු ලබන අවසාන පරිශීලක පාරිභෝගිකයින්ට අදාළ ගාස්තු පිරිවැය පරාවර්තනය වන (cost reflective) ඒවා විය යුතුය එවැනි පාරිභෝගිකයින් සඳහා සේවා සපයන්නා විය යුත්තේ ජාතික පද්ධති . ක්‍රියාකරුය ) ගිවිසුම්ගත ඉල්ලුම සඳහා වන ගාස්තු, මනින ලද උපරිම ඉල්ලුම සඳහා වන ගාස්තු, බලශක්තිය සඳහා 'භාවිත වන වේලාව' (Time of Use - TOU) මිලකරණය, ප්‍රතික්‍රියක බලය (reactive power) හෝ ගබඩා කිරීම ඇතුළු අතිරේක සේවාවන් භාවිතා කිරීම හෝ සැපයීම, සහ සිල්ලර සේවා සඳහා වන ගාස්තු ඇතුළත් ඒකාකාරී ජාතික පිරිවැය පරාවර්තන ගාස්තුවක් නියාමකයා විසින් තීරණය කළ යුතුයපවත්නා . ෂණ පාරිභෝගිකයන් සම්බන්ධයෙන් නියාමකයා විසින් සිදුකරනු ලබනසම්ප්‍රේ'බර ප්‍රමාණ පර්යේෂණ අධ්‍යයනයක්' සම්ප්‍රේෂණ පාරිභෝගිකයන් සඳහා වන ගාස්තු තීරණය කිරීමේ පදනම විය යුතුය. | 2026 ජනවාරි |
| 2.3.14 සෑම බලපත්‍රලාභියෙකුම මුදල් වර්ෂය අවසන් වී මාස 9ක් ඇතුළත, සිය විගණනය කරන ලද ගිණුම් වාර්තා නියාමකයා වෙත ලබා දීම අනිවාර්ය වේ. | |
| **උපායමාර්ගය 2.4: සම්ප්‍රේෂණ ගාස්තු කලාපීය සම්ප්‍රේෂණ උපයෝගිතා (regional transmission utilities) සමඟ සැසඳිය යුතුය.** | |
| 2.4.1 පිරිවැය තවදුරටත් අඩු කිරීම සඳහා වන නිර්දේශ ද ඇතුළත්ව, නියාමකයා විසින් නිකුත් කරනු ලබන ප්‍රකාශනයක, සම්ප්‍රේෂණ ගාස්තු කලාපයේ පවතින සමාන සම්ප්‍රේෂණ උපයෝගිතා සමඟ සසඳා දැක්විය යුතුය". | සෑම MYT කාලසීමාවකම . ආරම්භයේදී |
| **උපායමාර්ගය 2.5: සම්ප්‍රේෂණ කාර්යසාධනය (transmission performance) සම්බන්ධයෙන් බලපත්‍රලාභීන් වගකීම දැරිය යුතුය.** | |
| 2.5.1 ගුණාත්මකභාවය සහ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ විධිවිධාන පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වූ සංශෝධිත කාලරාමුවක් සහිතව, (2025 දී සංශෝධිත (2024 විදුලිබල පනත යටතේ 2016 විදුලිබල ආරක්ෂාව), ගුණාත්මකභාවය සහ අඛණ්ඩ පැවැත්ම ( .රෙගුලාසි නියාමකයා විසින් නැවත නිකුත් කළ යුතුය | 2027 ජනවාරි වන විට |
| 2.5.2 විදුලිබල ආරක්ෂාව), ගුණාත්මකභාවය සහ අඛණ්ඩ පැවැත්මරෙගුලාසිවල ඇති විධිවිධාන භාවිතා කරමින් සකස් කරන ලද මිනුම් සලකුණු (benchmarks) වලට වඩා විදුලියේ ගුණාත්මකභාවය සහ අඛණ්ඩ පැවැත්මේ කාර්යසාධනය පහළ මට්ටමක පවතී නම්, සම්ප්‍රේෂණ අනුමත ආදායම (transmission allowed revenues) ඒ අනුව සංශෝධනය කළ යුතුය. | 2027 ජනවාරි වන විට |
| 2.5.3 අතුරු පියවරක් ලෙස සම්ප්‍රේෂණ හානි ඉලක්කය ශක්තියෙන් 3.5% කට සීමා කළ යුතුය .NSO සහ NTNSP විසින් නියාමකයා වෙත ලබා දෙනු ලබන දත්ත මත පදනම්ව, 2027 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත හානි ප්‍රමාණයන් නියාමකයා විසින් අධ්‍යයනය කර තීරණය කළ යුතුය. | අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත **NTNSP/NSO** විසින් **2026** ජූලි මාසය වන විට ඉදිරිපත් කළ යුතුය. |
| 2.5.4 සෑම වර්ෂයක් සඳහාම, පද්ධති හානි ඉලක්කය සහ සැබෑ ජයග්‍රහණය නියාමක විසින් ප්‍රකාශයට පත් කළ යුතුය. | 2027 ජනවාරි සිට |
| 2.5.5 ජනන/සම්ප්‍රේෂණ සීමාවන් හරහා සිදුවන විදුලි ගලායාමතක්සේරු කිරීමට හෝ මීටර් යටිතල පහසුකම් හෝ වෙනත් මෙවලම් යාවත්කාලීන කිරීම මැනීමට අවශ්‍ය සහතික කිරීම සඳහාEGL, NTNSP සහ NSO සහයෝගයෙන් කටයුතු කළ යුතුය | 2027 ජනවාරි |
| **උපායමාර්ගය 2.6: බෙදාහැරීමේ සහ සිල්ලර සේවා ගාස්තු පිරිවැය පරාවර්තක ආකාරයෙන් ද එක් එක් බෙදාහැරීමේ බලපත්‍රලාභියාගේ ජාලය සඳහා වෙන වෙනම ද නිර්ණය කළ යුතුය.** | |

| | | |
|---|---|---|
| 2.6.1 | බෙදාහැරීමේ ගාස්තු සෑම බෙදාහැරීමේ බලපත්‍රලාභියෙකුගේම ජාලයට එකම ආකාරයෙන් අදාළ විය යුතුය. | වර්තමානයේ ක්‍රියාත්මක වේ |
| 2.6.2 | බෙදාහැරීමේ ගාස්තුවලට පහත සඳහන් අවසර ලත් පිරිවැය ඇතුළත් විය යුතුය: ක්ෂයවීම්, පොලිය, මෙහෙයුම් සහ නඩත්තුව සහ වත්කම් මත ප්‍රතිලාභ | වර්තමානයේ ක්‍රියාත්මක වේ |
| 2.6.3 | නියමිත ගොනු කිරීමේ කාලයේදී නියාමක විසින් සිදු කෙරෙන දැනුම්දීමෙන් අනතුරුව සෑම බෙදාහැරීමේ බලපත්‍රලාභියෙකුම සිය අනුමත මධ්‍ය කාලීන බෙදාහැරීමේ සංවර්ධන සැලැස්ම මත පදනම්ව පිරිවැය ඉදිරිපත් කළ යුතුය. | වර්තමානයේ ක්‍රියාත්මක වේ |
| 2.6.4 | ගොනු කරන අවස්ථාවේ බලාත්මකව පැවති බහුවාර්ෂික ගාස්තු (MYT) කාල සීමාවට ගැලපෙන අයුරින් සංශෝධිත ගාස්තු ඉදිරිපත් කිරීමේ ආකෘති ඉදිරිපත් කිරීමට නියාමක කටයුතු කළ යුතු වන අතර නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා ඒවා යාවත්කාලීන කළ යුතුය. | 2026 ජනවාරි |
| 2.6.5 | ක්ෂයවීම් ශුන්‍ය අගයක් සහිතව සහ ව්‍යවස්ථාපිත ගිණුම් සඳහා යොදාගත් ආයු කාලය ද සහිතව සරල රේඛීය ක්‍රමය මත පදනම් විය යුතුය. | වර්තමානයේ ක්‍රියාත්මක වේ |
| 2.6.6 | ක්ෂය ප්‍රතිපාදනය ණය මත ගෙවිය යුතු මූලික මුදල සැලකිය යුතු ලෙස ඉක්මවා යන අවස්ථාවන්හිදී, ගාස්තු නිර්ණය කිරීමේ කාර්යය සඳහා බලපත්‍රලාභියා හට කඩිනම් ක්ෂයවීමක් සඳහා නියාමන නිලධාරියාගෙන් ඉල්ලීමක් කළ හැකිය. | 2026 ජනවාරි |
| 2.6.7 | ප්‍රාග්ධන ප්‍රදාන, කිසිවක් වේ නම්, සහ වෙනත් ඕනෑම පාර්ශවයක් (ගනුදෙනුකරුවන් ඇතුළුව) ගෙවා ඇති ආයෝජන සඳහා කිසිදු ක්ෂය කිරීමක්, පොලියක් හෝ වත්කම් මත ප්‍රතිලාභයක් ලබා නොදිය යුතුය. එවැනි වත්කම් ආදේශනය කිරීමෙන් වන ප්‍රාග්ධන ලාභය කිසියම් වෙනත් ආයෝජනයක් සේ සලකනු ලැබේ. | 2026 ජනවාරි |
| 2.6.8 | ගාස්තු සම්බන්ධ අරමුණු සම්බන්ධයෙන් නියාමක විසින් නියාමන වත්කම් පදනම නිර්ණය කිරීම සඳහා සහ එකතු කරන ලද වත්කම්, බැහැර කරන ලද වත්කම්, ඉදිකිරීම් අතරතුර පොලී සඳහා ප්‍රතිපාදන මෙන්ම විනිමය අනුපාත විචලනයන් සඳහා පැහැදිලි මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබේ. | දැනටමත් නිකුත් කර ඇත |
| 2.6.9 | අවසර ලත් පොලී පිරිවැය බලපත්‍රලාභියාගේ ඉදිරිපත් කිරීම් මත පදනම් විය යුතු අතර, බලපත්‍රලාභියා වාණිජ ණය ලබා ගෙන ඇත් නම් ඔහු ප්‍රශස්ත ණය කොන්දේසිවලට යටත්ව එම ණය ලබා ගෙන ඇති බවට නියාමක සෑහීමකට පත්විය යුතුය. මේ සඳහා නියාමකය විසින් මාර්ගෝපදේශයක් නිකුත් කළ යුතුය. | 2026 ජනවාරි |
| 2.6.10 | අනෙකුත් අවසර ලත් ස්ථිර පිරිවැය ආදිය (රක්ෂණ වැනි) ගොනු කර ඇති සත්‍ය කරුණු මත පදනම් විය යුතුය. සෑම බලපත්‍රලාභියෙකු විසින්ම රක්ෂණ අරමුදලක් ස්ථාපිත කළ යුතුය. නියාමක විසින් රක්ෂණ අරමුදල කළමනාකරණය කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කළ යුතුය. | වර්තමානයේ ක්‍රියාත්මක වේ |
| 2.6.11 | අවසර ලත් මෙහෙයුම් සහ නඩත්තු වියදම් බලපත්‍රලාභියාගේ මෑතකදී විගණනය කරන ලද නියාමන ගිණුම් මත පදනම් විය යුතුය. අවසර ලත් මෙහෙයුම් සහ නඩත්තු වියදම් පාරිභෝගික මිල දර්ශකය (CPI) අනුව ගැළපිය යුතුය. අවසර ලත් මෙහෙයුම් සහ නඩත්තු වියදම් ආපසු අයකර නොගත යුතුය. | |
| 2.6.12 | අවසර දෙනු ලබන වත්කම් මත ප්‍රතිලාභය පහත සඳහන් කරුණු නිසි ලෙස සලකා බලමින් නියාමක විසින් තීරණය කරනු ලැබේ: බලපත්‍රලාභියාගේ ව්‍යාපාරයේ ණය කොටස් අනුපාතය, ණය පිරිවැය, කොටස් පිරිවැය සහ පාරිභෝගිකයින් වෙත තරඟකාරී ගාස්තු පිරිනැමීමේ ජාතික අරමුණු සපුරාලීම සඳහා බෙදාහැරීමේ ගාස්තු අවම අගයක පවත්වාගැනීමේ අරමුණ; නියාමක විසින් අමාත්‍යවරයා වෙත ප්‍රතිපත්ති සටහනක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර එහිදී වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එතෙක්, වත්කම් මත 2% ක ප්‍රතිලාභ අනුපාතයක් අදාළ විය යුතුය. එසේ ජනනය වන මුදල් අනාගත ආයෝජන සඳහා පමණක් භාවිතා කිරීම සඳහා සමාගම තුළ රඳවා ගත යුතුය. රඳවා ගන්නා එවැනි මුදල් ආයෝජනය නොකරන අවස්ථාවකදී, එවැනි මුදල් පාරිභෝගික ගාස්තුව අඩු කිරීම සඳහා යොදවන්නේ ද යන්න කොටස් හිමියා තීරණය කළ යුතුය. | 2026 ජූලි වන විට, එතෙක් වත්කම් මත 2% ක ප්‍රතිලාභ අනුපාතයක් පවතිනු ඇත. |
| 2.6.13 | සිල්ලර සේවා ගාස්තු තුළ පහත සඳහන්: සේවා සම්බන්ධතා, මනුකරණය, බිල්පත් නිකුත් කිරීම සහ බොල් ණය සඳහා ප්‍රතිපාදන ඇතුළුව ආදායම් කළමනාකරණය යන පිරිවැය පිළිබිඹු විය යුතුය. | වර්තමානයේ ක්‍රියාත්මක වන අතර තවදුරටත් පැහැදිලි කිරීමක් ඇතුළත් කළ යුතුවේ |
| 2.6.14 | පිරිවැය අඩු කිරීමේ යෝජනා ද ඇතුළුව නියාමක විසින් නිකුත් කරන ලද ප්‍රකාශනයක් තුළින් බෙදාහැරීමේ සහ සිල්ලර සේවා පිරිවැය, රටේ අනෙකුත් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සහ රටෙහි සහ කලාපයේ ඒ හා සමාන බෙදාහැරීමේ උපයෝගිතා ආයතන සමඟ සංසන්දනය කළ යුතුය. | එක් එක් බහු වාර්ෂික ගාස්තු (MYT) කාල |

| | | |
|---|---|---|
| | | පරිච්ඡේදයේ ආරම්භයේදී |
| 2.6.15 | නිශ්චිත වත්කම්වලට හෝ ගනුදෙනුකරුවන්ට (සහාධිපත්‍යයක් වැනි) සීමා වූ සිය ව්‍යාපාරයේ විශේෂ ස්වභාවය හේතුවෙන් බෙදාහැරීමේ බලපත්‍රයක් තබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති සේවා සැපයුම්කරුවන් සඳහා, නියාමක විසින් එම සේවා සැපයුම්කරුවන් විසින් සපයා ඇති විශේෂිත ස්ථානීය තොරතුරු භාවිත කරමින් ගාස්තු තීරණය කළ යුතුය. බෙදාහැරීම් බලපත්‍රලාභියා හට පරිශ්‍රය තුළ සිටින සෑම පාරිභෝගිකයෙකුටම සෘජුව විදුලි සැපයුම ලබා දීමට හැකි වන පරිදි 2030 ජනවාරි 1 වන දින හෝ ඊට පසු ආරම්භ කරන නව සහාධිපත්‍ය ගොඩනැගිලි තුළ වෙන් වෙන් වූ මනුකරණ පහසුකම් සකස් කළ යුතුය. | දැනටමත් ක්‍රියාත්මක කර ඇත |
| 2.6.16 | බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් වාහන ආරෝපණය කිරීම හෝ ඒ හා සමාන සේවාවන් සඳහා විදුලිය නැවත විකුණන්නන් වෙත විකිණීම සඳහා ලබා දෙන ගාස්තු පිරිවැය පරාවර්තක ඒවා විය යුතුය. නියාමක විසින් එවැනි සේවා සපයන්නන් විසින් සපයනු ලබන තොරතුරු භාවිත කර තීරණය කරනු ලබන නැවත විකිණීමේ ගාස්තුව සිය ගනුදෙනුකරුවන් වෙත ප්‍රකාශයට පත් කළ යුතුය. | 2026 ජනවාරි |
| 2.6.17 | සෑම බෙදාහැරීම් බලපත්‍රලාභියෙකුම මූල්‍ය වර්ෂය අවසානයේ සිට මාස 9ක් ඇතුළත සිය විගණනය කරන ලද ගිණුම් නියාමක වෙත අනුවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය. | |
| **උපායමාර්ගය 2.7: බෙදාහැරීමේ කාර්ය සාධනය සම්බන්ධයෙන් බලපත්‍රලාභීන් වගකිව යුතුය** | | |
| 2.7.1 | නියාමක විසින් 2016 විදුලිබල (ආරක්ෂාව, තත්ත්වය සහ අඛණ්ඩතාව) පිළිබඳ නියෝග තත්ත්වය සහ අඛණ්ඩතාව පිළිබඳ විධිවිධාන පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා වූ සංශෝධිත කාලරාමුවක් ද සහිතව 2024 විදුලිබල පනත යටතේ (2025 සංශෝධනය පරිදි) නැවත නිකුත් කරනු ලැබිය යුතුය. | 2026 ජනවාරි වන විට |
| 2.7.2 | නියෝග හි විධිවිධාන යොදාගනිමින් වැඩි දියුණු කරනු ලැබූ, විදුලිබල ගුණාත්මකභාවය සහ අඛණ්ඩ කාර්ය සාධනය මිණුම් සලකුණු වලට සාපේක්ෂව අඩු මට්ටමක් ගනියි නම්, බෙදා හැරීමට අවසර දී ඇති ආදායම් ගැළපිය යුතුය. | 2027 ජනවාරි වන විට |
| 2.7.3 | ජාලයේ පරාසය, පාරිභෝගික ඝනත්වය සහ බෙදා හරින ලද උත්පාදනයේ වර්ධනීය කොටස පිළිබඳව නිසි සැලකිල්ලෙන් යුතුව, නියාමක විසින් අවම වශයෙන් වසර පහක කාලයක් සඳහා එක් එක් බලපත්‍රලාභියා සඳහා පවත්වනු ලබන අධ්‍යයනයකින් අවසර ලත් බෙදාහැරීමේ අලාභය (හානි) නිර්ණය කළ යුතුය. | 2026 ජූලි වන විට |
| 2.7.4 | අලාභ ඉලක්කයට අභිබවමින් හානියට ලක් වූ බලශක්තියේ වටිනාකම බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් දැරිය යුතුය. ඒ හා සමානව, සැබෑ අලාභ හානි අගය ඉලක්කගත අගයට වඩා අඩු වූ විට සපයාගත් බලශක්තියේ වටිනාකම නැවත අය කර නොගත යුතුය. නියාමක විසින් සෑම බලපත්‍රලාභියෙකු සඳහාම, සෑම වසරකම ඉලක්කගත හානියේ ප්‍රමාණය සහ සැබෑ ලෙස සපයාගත් බලශක්ති ප්‍රමාණය ප්‍රකාශයට පත් කළ යුතුය. | 2027 ජනවාරි සිට |
| **උපායමාර්ගය 2.8: සිල්ලර සේවා සැපයීමේ දී වාණිජමය ගුණාත්මකභාවය සම්බන්ධයෙන් බලපත්‍රලාභීන් වගකිව යුතුය.** | | |
| 2.8.1 | නව සේවා සම්බන්ධතා සඳහා ගත වන කාලසීමාව, අතිරේක සේවා, සිල්ලර සේවා සැපයුම් පිළිබඳ පාරිභෝගික පැමිණිලිවලට ප්‍රතිචාර දැක්වීම යනාදියට එහෙත් ඒවාට පමණක් සීමා නොවන සිල්ලර සේවා සහ වාණිජ තත්ත්ව දර්ශක, නියාමක විසින් නිර්වචනය කර එක් එක් බලපත්‍රලාභියා විසින් ප්‍රකාශයට පත් කළ යුතුය. | 2026 ජූලි සිට |
| 2.8.2 | නියාමක විසින් එක් එක් බලපත්‍රලාභියාගේ ජාලයේ පරාසය සහ අනෙකුත් විශේෂාංග අනුව සංසන්දනය කරමින් සහ කලාපයේ ඇති ඒ හා සමාන උපයෝගිතා ආයතන සමඟ සංසන්දනය කරමින් වාණිජමය සේවාවේ ගුණාත්මකභාවය පිළිබඳ දර්ශක ප්‍රකාශයට පත් කළ යුතුය. | 2027 ජනවාරි සිට, සෑම වසර සඳහාම |
| **උපායමාර්ගය 2.9: නියාමක විසින් සිදු කරනු ලබන සියලුම ඇගයීම් විගණනය කරන ලද නියාමන ගිණුම් මත පදනම් විය යුතුය** | | |
| 2.9.1 | ගාස්තු ගොනු කිරීමකින් අනතුරුව වන ඕනෑම අවස්ථාවක,අමාත්‍යවරයා විසින් විගණකාධිපතිවරයාට (හෝ, මෙය ප්‍රායෝගික නොවේ නම්, විගණකාධිපතිවරයාගේ මඟ පෙන්වීම යටතේ පිළිගත් පෞද්ගලික විගණන සමාගමකට) ගාස්තු ගොනු කිරීම තුල අන්තර්ගත සංඛ්‍යා දත්ත සත්‍යාපනය කිරීම සඳහා විශේෂ විගණනයක් පවත්වන ලෙස ඉල්ලා සිටිමින් බලය පැවරිය හැකිය. එසේ ගාස්තු ගොනු කිරීම සිදු කරනු ලබන සියලුම බලපත්‍රලාභීන් ගාස්තු නිර්ණය කිරීමේ කාර්යය උදෙසා විශේෂ විගණනයේ ප්‍රතිඵල යොදා ගැනීමට හැකි වන පරිදි කඩිනමින් නියාමකය වෙත අවශ්‍ය සියලු තොරතුරු ලබා දීමට බැඳී සිටී. | |

**3. පාරිභෝගික වර්ගීකරණය සහ ගාස්තු සියලුම බෙදාහැරීමේ බලපත්‍රලාභීන් අතර එකම ආකාරයෙන් ක්‍රියාත්මක විය යුතුය**

| උපාය මාර්ග, ක්‍රියාමාර්ග සහ ක්‍රියාත්මක කිරීමේ කාල රාමුව | | ක්‍රියාත්මක වීම |
|---|---|---|
| **උපායමාර්ගය 3.1: රටේ ඕනෑම ස්ථානයකින් බලපත්‍රලාභියෙකුගේ ජාලයකට සම්බන්ව සිටින ගනුදෙනුකරුවන් සඳහා, (UNT) ගාස්තුවක් ක්‍රියාත්මක කෙරෙනු ඇත** | | |
| 3.1.1 | විවෘත ප්‍රවේශය හරහා ජාලය පුරා චක්‍රීය බලශක්ති පහසුකම ස්ථාපිත කරන තුරු, කුමන බෙදාහැරීමේ බලපත්‍රලාභියාගෙන් සේවය ලබා ගන්නේ ද යන්න නොතකා, සියලුම ගනුදෙනුකරුවන්ට එකම ගාස්තුවකට බිල්පත් නිකුත් කරනු ලැබිය යුතුය. | වත්මන් තත්ත්වය අඛණ්ඩව පවතී |
| 3.1.2 | අවසර ලත් ආදායම් සහ පුරෝකථනය කරන ලද පාරිභෝගික මිශ්‍රණය අනුව බෙදාහැරීමේ බලපත්‍රලාභීන් අතර විෂමතා ගණනය කිරීම සඳහා, නියාමක විසින් සෑම කාර්තුමය සමාලෝචන කාල පරිච්ඡේදයක් සඳහාම අනුමත තොග සැපයුම් ගාස්තුව (BST) ගැළපිය යුතු වන අතර, තත්‍ය විකුණුම් දත්ත මත පදනම්ව තවදුරටත් ගැළපීම් සිදු කළ යුතුය. | දැනටමත් ක්‍රියාත්මක වේ. |
| 3.1.3 | බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ මුදල් ප්‍රවාහයන් පුරෝකථන මට්ටම් හා අනුකූල බව සහතික කිරීම සඳහා, ජාතික පද්ධති ක්‍රියාකරු වෙනුවෙන් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් මිලදී ගන්නා ලද බෙදා හරින ලද උත්පාදනය, තොග සැපයුම් ගාස්තුව යටතේ ජාතික පද්ධති ක්‍රියාකරු වෙතින් ලබා ගන්නා ලද ඔවුන්ගේ අදාළ මිලදී ගැනීම් සඳහා බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගෙන් ජාතික පද්ධති ක්‍රියාකරු වෙත ලැබිය යුතු ගෙවීම් වලින් හිලව් කරනු ලැබිය යුතුය | 2026 ජනවාරි |
| 3.1.4 | එවැනි රෙගුලාසි නිකුත් කිරීමෙන් පසු විවෘත ප්‍රවේශය ලබන පාරිභෝගිකයින් හැරුණු කොට, අනෙක් සියලුම දෙනා, සිය බලපත්‍රලාභී සේවාසැපයුම්කරු කවුරුන් ද යන්න නොතකමින්, මෙම පොදු ජාතික ගාස්තුව අඛණ්ඩව ගෙවීමට කටයුතු කළ යුතුය. | දැනට 2028 සඳහා සැලසුම් කර ඇත. |
| 3.1.5 | විවෘත ප්‍රවේශය සම්බන්ධයෙන් රෙගුලාසි හඳුන්වාදීම සඳහා කටයුතු කිරීමේ දී, නියාමක විසින් සෑම පාරිභෝගිකයෙකුම සඳහා වන (ජීව සහනදායි ගාස්තු ලබන පාරිභෝගිකයින් හැර) විදුලි මිල එම පාරිභෝගික කාණ්ඩය සහ උප කාණ්ඩය සඳහා ගණනය කරන ලද සැපයුම් පිරිවැයෙන් +/- 10% ක් තුළ පැවතිය යුතු බව සහතික කළ යුතුය. පාරිභෝගික කාණ්ඩය යනු භාවිතයේ අරමුණ (ගෘහස්ථ, පොදු අරමුණු, කර්මාන්තය වැනි) වන අතර, උප කාණ්ඩය යනු කාණ්ඩයක කාණ්ඩගත ගාස්තු, සැපයුම් වෝල්ටීයතාවය සහ ඒ හා සමාන උප අංශවල පාරිභෝගිකයා අයත් ස්ථානයයි. | 2026 ජනවාරි සිට, 2027 අවසානය වන විට සාක්ෂාත් කර ගැනෙනු ඇත |
| 3.1.6 | කිසිදු ප්‍රාථමික බලශක්ති සම්පතකින් නිපදවන විදුලිය කිසිදු පාරිභෝගිකයෙකුට, පාරිභෝගික කාණ්ඩයකට හෝ පාරිභෝගික කණ්ඩායමකට සෘජුවම වෙන් කිරීමක් හෝ වක්‍රාකාරව වෙන් කිරීමක් සිදු නොකළ යුතුය. සම්පත් පිරිවැය හෝ ඒ හා සමාන මූල්‍ය ණය හෝ වැය බර සඳහා වන ඕනෑම සහනයක් හෝ අධිභාරයක් සියලුම පාරිභෝගික කාණ්ඩවලට අදාළ වන ලෙස සාධාරණව බෙදී යන පරිදි කටයුතු කළ යුතුය. | පොදු ප්‍රකාශයකි |
| **උපායමාර්ගය 3.2 අනාගතයේදී විවෘත ප්‍රවේශයට ඉඩ ලබා දීම සඳහා කටයුතු සකස් කිරීමේ දී, මධ්‍යම හා විශාල පාරිභෝගිකයින්ට සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාල වෙත විවෘත ප්‍රවේශය ලබා දිය යුතුය.** | | |
| 3.2.1 | විවෘත ප්‍රවේශය ක්‍රියාත්මක කිරීමේ දිනය පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට පහසුකම් සැලසීම සඳහා, විවෘත ප්‍රවේශ ගාස්තු ගණනය කිරීම සහ විභව විවෘත ප්‍රවේශ සැපයුම්කරුවන් සහ ගනුදෙනුකරුවන් පිළිබඳ සමීක්ෂණයක් පිළිබඳ වාර්තාවක් නියාමක විසින් අමාත්‍යවරයා වෙත ලබා දිය යුතුය. එම වාර්තාව තුළ, විවෘත ප්‍රවේශ ගාස්තු ඇතුළත් විය යුතු අතර ඊට සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ගාස්තු, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ අලාභ හානි, බැංකු හෝ ගබඩා ගාස්තු, ස්වාධීන ධාරිතා ගාස්තු, හරස් සහනාධාර අධිභාර, දැනට ක්‍රියාත්මක විදුලිය මිලදී ගැනීමේ සම්මත ගිවිසුම්වල කාල සීමාව අවසානයේ විවෘත ප්‍රවේශයට යාමට තෝරාගැනීමට ඉඩ ඇති සංවර්ධිත පුනර්ජනනීය බලශක්ති පාදක බලාගාර සඳහා වන ගාස්තු ද ඇතුළත් වේ.<br>වාර්තාවේ අඩංගු සියලුම නිගමන සහ නියාමකගේ නිර්දේශය පූර්ණ ලෙස සත්‍යාපනය කළ හැකි ගණනය කිරීම් මත පදනම් විය යුතුය. | 2026 ජූලි |
| 3.2.2 | විවෘත ප්‍රවේශය හඳුන්වාදීමෙන් බලපත්‍රලාභී උත්පාදන, සම්ප්‍රේෂණය හා බෙදාහැරීමේ ආයතන, ජාතික පද්ධති ක්‍රියාකරු හෝ පාරිභෝගිකයින් කිසිවෙකුටත් අවාසිදායක තත්වයක් ඇති නොකළ යුතුය. | පොදු කොන්දේසියකි |

4. විදුලි පද්ධති සම්පත් භාවිත කිරීම වෙනුවෙන් සෑම පාරිභෝගික කාණ්ඩයකටම පිරිවැය පරාවර්තක ගාස්තු අදාළ විය යුතුය.

| උපාය මාර්ග, ක්‍රියාමාර්ග සහ ක්‍රියාත්මක කිරීමේ කාල රාමුව | | ක්‍රියාත්මක කිරීම |
|---|---|---|
| **උපායමාර්ගය 4.1: සේවා පිරිවැයෙහි විනිවිදභාවය ඉහළ නැංවිය යුතුය.** | | |
| 4.1.1 | නියාමක විසින් එක් එක් පාරිභෝගික කාණ්ඩයට සහ උප කාණ්ඩයට (සහ සිල්ලර ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් එක් එක් කාණ්ඩගත කොටසට) බෙදාහැරීමේ වෝල්ටීයතාවයන් සහ සම්ප්‍රේෂණ වෝල්ටීයතාවයන් මට්ටමේ පාරිභෝගිකයින් දක්වාම සේවා පිරිවැය ගණනය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සිදු කරනු ලැබිය යුතු අතර, ස්ථාවර පිරිවැය (සිල්ලර ගනුදෙනුකරුවන් සඳහා), බලශක්ති පිරිවැය (කාල පරතරයන් තුනකින් බෙදා ඇත), ඉල්ලුම් පිරිවැය (තොග පාරිභෝගිකයින් සඳහා) සහ සිල්ලර සේවා පිරිවැය ලෙස වෙන් කර, පාරිභෝගික ගාස්තු වල එක් එක් වෙනස්වීම් සමඟ මෙය සිදු කරනු ලැබිය යුතුය. ජාලක (පද්ධති) ධාරිතාව උපරිම ලෙස භාවිතයට ගනු ලබන කාලයට සමගාමීව, එම පාරිභෝගික කාණ්ඩයෙන් පද්ධතියට ඇති බලපෑම සිල්ලර ගනුදෙනුකරුවන්ට අදාළ එක් එක් කාණ්ඩය සඳහා වන ස්ථාවර පිරිවැය මගින් පිළිබිඹු කෙරෙනු ඇත. | 2026 ජනවාරි |
| 4.1.2 | බෙදාහැරීමේ සහ සැපයුම් බලපත්‍රලාභීන් විසින්, සහ සම්ප්‍රේෂණ වෝල්ටීයතාවන්ගෙන් විදුලි සැපයුම ලබා ගන්නා පාරිභෝගිකයින් සම්බන්ධ අවස්ථාවලදී ජාතික පද්ධති ක්‍රියාකරු විසින් පාරිභෝගිකයින්ට නිකුත් කරන ඉන්වොයිසිවල අවම වශයෙන් පහත සඳහන් පිරිවැය සඳහන් කළ යුතුය: උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, සිල්ලර සේවා, මූළ පිරිවැය, සහනාධාරය හෝ අධිභාරය, ඉන්වොයිසි මුදල් අගය. තොග පාරිභෝගිකයින් සඳහා, ඉහත පිරිවැය ධාරිතාව සහ බලශක්ති පිරිවැය ලෙස බෙදා ඉදිරිපත් කළ යුතුය. අයබදු සහ තීරුබදු වෙන වෙනම දක්වනු ලැබිය යුතුය. ගිවිසුම්වල දක්වා ඇති පරිදි, විදුලි ජාලය වෙත එක් කරන ලද බලශක්තිය සහ ආනයනයන් මත සසඳන ලද ප්‍රමාණයන් පිළිබඳ නිසි තොරතුරු, සියලුම පාරිභෝගික ඉන්වොයිසිවල දැක්විය යුතුය. | 2026 ජූලි |
| **උපායමාර්ගය 4.2: පාරිභෝගික මිල ව්‍යුහය සරල කළ යුතුය, ක්‍රමානුකූලව පිරිවැය පරාවර්තක කළ යුතුය, සමානාත්මතාවය පිළිබිඹු කළ යුතුය, එමෙන්ම ජාත්‍යන්තර ප්‍රශස්ත පිළිවෙත් කරා යොමු විය යුතුය.** | | |
| 4.2.1 | ශුද්ධ මනුකරණ සහ ශුද්ධ ගිණුම්කරණ ගිවිසුම් යටතේ සිටින විදුලි නිෂ්පාදක පාරිභෝගිකයින් (prosumers) ඇතුළුව සියලුම පාරිභෝගිකයින් සඳහා බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් බිල්පත්වල නිකුත් කරනු ලබන මාසික ස්ථාවර ගාස්තුව, විදුලි ජාලයෙන් ආනයනය කරන ලද දළ බලශක්තිය මත පදනම්ව විය යුතුය. ඒ අනුව ස්ථාවර ගාස්තු බිල්පත් කිරීමේදී ජීව සහනදායි ගාස්තු ගෙවන පාරිභෝගිකයින් (lifeline customers) විදුලි නිෂ්පාදක පාරිභෝගිකයින් (prosumers) ලෙස වැරදි ආකාරයෙන් අර්ථකථනය කිරීම අවසන් වනු ඇත. | 2026 ජනවාරි අවසන් වීමට පෙර මීළඟ ගාස්තු නිර්ණය කිරීමේදී |
| 4.2.2 | සිල්ලර ගනුදෙනුකරුවන්ගෙන් සැලකිය යුතු කොටසකගේ බලශක්ති පරිභෝජනය ශුන්‍ය අගයක් ගැනීම අක්‍රිය පාරිභෝගිකයින් ජීව සහනදායි ගාස්තු ගෙවන පාරිභෝගිකයින් හෙවත් අඩු පරිභෝජනයක් සහිත පාරිභෝගිකයින් ලෙස වැරදි අර්ථකථනයකට හේතු වී තිබීම සම්බන්ධව සලකා බලමින්, එවැනි ගනුදෙනුකරුවන්ගෙන් සම්පූර්ණ ස්ථාවර පිරිවැය අය කරගැනීම සඳහා ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් කටයුතු කළ යුතුය. ශුන්‍ය පරිභෝජනය යන කාණ්ඩයකින් පාරිභෝගිකයින් වෙන් කළ නොහැකි හෙයින්, පාරිභෝගික කාණ්ඩයේ ගණනය කළ ස්ථාවර පිරිවැය (උදා: සියලුම කුටුම්භ) සහ සිල්ලර සේවා පිරිවැය ස්ථාවර පිරිවැයට ඇතුළත් විය යුතුය. මෙවැනි සම්බන්ධතාවල පිරිවැය අනෙකුත් පාරිභෝගිකයන්ගෙන් අය කරගැනීමට සිදුවේ.<br><br>ඊළඟ ගාස්තු නිර්ණයට පෙර, නියාමක විසින් එවැනි ගනුදෙනුකරුවන් පිළිබඳ සමීක්ෂණයක් සිදු කර පරිභෝජනය ශුන්‍ය අගයක් ගැනීමට හේතුව හඳුනා ගත යුතුය. | 2026 ජනවාරි අවසන් වීමට පෙර මීළඟ ගාස්තු නිර්ණය කිරීමේදී |
| 4.2.3 | 2030 වසර වන විට සරල කරන ලද සහ වැඩිදියුණු කරන ලද පාරිභෝගික ගාස්තු ව්‍යුහයක් ඇති කිරීමේ අවසාන ඉලක්කය සමඟින් පාරිභෝගික කාණ්ඩ සහ ගාස්තු ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කාලානුරූපී මාර්ග සිතියමක් සකස් කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම නියාමක විසින් සිදු කළ යුතු අතර, එමඟින් සේවා සඳහා අය කිරීම, විදුලිබල පද්ධතිය භාවිත කිරීම සහ බලශක්ති මිලදී ගැනීම් සඳහා පහසුකම් සැලසෙනු ඇත. ක්‍රියාත්මක කළ යුතු සරල කිරීම් නම් (i) ගෘහස්ථ සහ | 2026 ජනවාරි වන විට මාර්ග සිතියම ඉදිරිපත් කිරීම. 2026 ජනවාරි සිට පළමු සරල කිරීම ක්‍රියාත්මක කිරීම |

| | | |
|---|---|---|
| | ආගමික පාරිභෝගික කාණ්ඩවල කාණ්ඩගත කොටස් ගණන අඩු කිරීම, සංරක්ෂණය දිරිමත් කිරීම සඳහා මිල සංඥා පවත්වා ගැනීම, (ii) සියලුම පරිමාවේ වෙනස්කම් ඉවත් කිරීම, (iii) ප්‍රතික්‍රියාශීලී බලශක්ති ගාස්තු (reactive energy charges) හෝ ජව සාධක දඩ ගාස්තු (power factor penalties) ප්‍රගතිශීලීව ක්‍රියාත්මක කිරීම ය. | |
| 4.2.4 | සෑම පාරිභෝගික කාණ්ඩයක්, උප කාණ්ඩයක් සහ කාණ්ඩගත කොටසක් (block) සඳහා වන සැපයුම් පිරිවැය සියලුම ස්ථාවර ගාස්තු (හෝ මනින ලද ඉල්ලුම මත පදනම් වූ ගාස්තු), බලශක්ති ගාස්තු (භාවිත කාලයන් අනුව බෙදා ඇති), සිල්ලර සේවා, ජව සාධක දඩ ගාස්තු හෝ ඒ හා සමාන ගාස්තු තුළ පූර්ණ ලෙස පිළිබිඹු විය යුතුය. සෑම පාරිභෝගික කාණ්ඩයකටම සහ කාණ්ඩගත කොටසකටම 5% ට නොවැඩි අපගමනයක් සහිතව ස්ථාවර ගාස්තු ස්ථාවර පිරිවැයට ගැළපීම සහ බලශක්ති ගාස්තු බලශක්ති පිරිවැයට ගැළපීම සිදු කළ යුතුය. | ක්‍රමිකව ක්‍රියාත්මක කිරීම සහ 2030 ජනවාරි වන විට නිම කිරීම |
| 4.2.5 | දවසේ විවිධ කාලයන්, සතියේ දින සහ ඍතුමය විචලනයන් මුළුල්ලෙහි උත්පාදන පිරිවැය ඇතුළත් විශ්ලේෂණයක් හරහා සහ උත්පාදන මිශ්‍රණයේ නැගී එන ප්‍රවණතා සලකා බලමින් නියාමක විසින් නිර්ණය කරන ලදුව තොග පාරිභෝගිකයින් සඳහා සහ සම්ප්‍රේෂණයේ සිට බෙදා හැරීම දක්වා භුවමාරු කිරීම් සඳහා අත්තනෝමතික ලෙස නියම කර ඇති දැනට පවතින භාවිත කාලය පාදක බලශක්ති ගාස්තු, පිරිවැය පරාවර්තක විය යුතුය. | 2026 ජනවාරි |
| 4.2.6 | සියලුම අඩු වෝල්ටීයතා පාරිභෝගිකයින් සඳහා භාවිත කාලය පාදක ගාස්තු ක්‍රම ක්‍රමයෙන් හඳුන්වා දිය යුතු අතර, එම එක් එක් ගාස්තු සංරචකය තුළ පිරිවැය ද, බලශක්ති සංරචකය තුළ විවිධ භාවිත කාලවලදී සැපයුම් පිරිවැය ද පිළිබිඹු විය යුතුය. තෙකළා (3- phase) පාරිභෝගිකයින් ලෙස මාරුවීම සඳහා බලපත්‍රලාභීන් සමඟ සාකච්ඡා කර 2026 වන විට නිම කෙරෙන පරිදි පුළුල් හා කාලානුරූපී ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට සහ ඉලක්කගත වසර වන විට සියලුම පාරිභෝගිකයින් ආවරණය වන පරිදි ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට නියාමක විසින් කටයුතු කළ යුතුය. මෙම මූලපිරීම යටතේ ස්ථාපනය කෙරෙන සියලුම පාරිභෝගික මණුකරණ කටයුතු දුරස්ථව සිට ප්‍රවේශ වී සිදුකල හැකි සහ ඉල්ලුම ප්‍රතිචාර ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීට හැකි වන පරිදි විය යුතුය. | 2026 ජූනි සැලැස්ම ප්‍රකාශයට පත් කිරීම<br>2026 දෙසැම්බර් වන විට 3-කළා පාරිභෝගිකයින් බවට මාරු වීම<br>සියලු සිල්ලර පාරිභෝගිකයින් ගේ පරිවර්තනය වීම අවසන් කිරීමට ඉලක්ක කෙරෙන දිනය ඉදිරියේදී නිර්ණය කෙරෙනු ඇත. |
| 4.2.7 | සියලුම දැනට සිටින විදුලි නිෂ්පාදක පාරිභෝගිකයින් භාවිත කාලය පාදක ගාස්තුවලට (time-of-use tariffs) යටත් කළ යුතු අතර, එහිදී ගාස්තු, ස්ථාවර ගාස්තු සහ බලශක්ති ගාස්තු වල සෑම සංරචකයකම පිරිවැය පිළිබිඹු විය යුතුය. දැනට සිටින සහ නව යන දෙයාකාරයේම සියලුම නිෂ්පාදක පාරිභෝගිකයින්ට කාණ්ඩගත ගාස්තු (Block tariffs) ක්‍රියාත්මක වීම නවතා දැමෙනු ඇත. | 2026 ජූනි වන විට අවසන් කිරීම |
| 4.2.8 | 2026 ජනවාරි 1 වන දින හෝ ඊට පසු අත්සන් තබන ලද ශුද්ධ මනුකරණ සහ ශුද්ධ ගිණුම්කරණ ගිවිසුම් සම්බන්ධයෙන් සියලුම පාරිභෝගිකයින් භාවිත කාලය පාදක ගාස්තුවලට යටත් විය යුතු වන අතර, භාවිත කාලය පාදක ගාස්තු පිරිවැය පරාවර්තක වන හෙයින්, අපනයනය කරන ලද සහ ආනයනය කරන ලද බලශක්ති සැසඳුම එක් එක් කාල පරතරය සඳහා වෙන වෙනම විය යුතුය. තොග පාරිභෝගික කාණ්ඩයේ නිෂ්පාදක පාරිභෝගිකයින් සඳහා මෙම ප්‍රතිපත්තිය දැනටමත් ක්‍රියාත්මක වේ. | 2026 ජනවාරි |
| 4.2.9 | භාවිත කාලය පාදක ගාස්තුවල දී දැනට උපයෝගී වන කාල පරතරයන්හි වෙනස්කම් නිර්ණය කිරීමට, බෙදා හරින ලද උත්පාදනයේ නැගී එන ප්‍රවණතා සපුරාලීමට සහ ඉල්ලුම කළමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳ අරමුණු සපුරාලීමට මෙන්ම එහි ප්‍රතිඵල ක්‍රියාත්මක කිරීමට නියාමක විසින් අධ්‍යයනයක් සිදු කරනු ලැබිය යුතුය. | ජාතික පද්ධති ක්‍රියාකරුගේ දත්ත මත පදනම්ව 2026 ජනවාරි මාසයේදී මූලිකව ක්‍රියාත්මක කෙරෙන අතර, 2027 ජනවාරි වන විට අධ්‍යයන ප්‍රතිඵල ක්‍රියාත්මක කෙරේ. |

**5. කුටුම්භ සඳහා වන ජීව සහනදායි ගාස්තු සහ අනෙකුත් සහනාධාර හෝ පාරිභෝගික සමූහයට පිරිවැය බෙදී යන සහන ගාස්තු (subsidised or socialised tariffs) සුදුසුකම් ලත් පාරිභෝගිකයින් සහ භාවිත කරන්නන් ඉලක්ක කරමින් ලබා දිය යුතුය**

| උපාය මාර්ග, ක්‍රියාමාර්ග සහ ක්‍රියාත්මක කිරීමේ කාල රාමුව | | ක්‍රියාත්මක කිරීම |
|---|---|---|
| **උපායමාර්ගය 5.1: ජීව සහනදායි ගාස්තු ක්‍රම ක්‍රමයෙන් සුදුසු ගනුදෙනුකරුවන් ඉලක්ක කරමින් ලබා දිය යුතුය.** | | |
| 5.1.1 | 2019 ජාතික බලශක්ති ප්‍රතිපත්තියට අනුකූලව ගෘහස්ථ සහ ආගමික කාණ්ඩයේ ගාස්තු සඳහා ජීව සහනදායි ගාස්තු කාණ්ඩය මසකට කි.වො. පැ. 1 සිට 30 දක්වා විය යුතුය. | ක්‍රියාත්මකයි |
| 5.1.2 | මින් පෙර මූලික අවශ්‍යතාව ලෙස මසකට කි.වො.පැ.30ක් ආලෝකකරණය සඳහා පමණක් යොදාගැනීම සිදුවිය. නවීන, වඩාත් කාර්යක්ෂම ආලෝකකරණ උපාංග මඟින් ආලෝකකරණයේ අවශ්‍යතාවය මසකට කි.වෝ. 30 ට වඩා අඩු කර ගත හැකි අතර, වර්තමානයේ මූලික විදුලි අවශ්‍යතා අතරට අධ්‍යාපනය, විනෝදාස්වාදය, සුවපහසුව සහ ආහාර පිසීම සඳහා අදාළ සීමිත උපකරණ ප්‍රමාණයක් භාවිත වීම ද ඇතුළත් වේ. මසකට කි.වො.පැ.30ක ජීව සහනදායි අවශ්‍යතාවයට සංශෝධන නිර්දේශ කිරීම සඳහා අවශ්‍යතා තක්සේරුවක් (needs assessment) සකස් කර බලශක්ති අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට සුනිත්‍ය බලශක්ති අධිකාරිය කටයුතු කළ යුතුය. | 2026 අවසානය වන විට අධ්‍යයනය අවසන් වේ. |
| 5.1.3 | අඩු ආදායම්ලාභී ගෘහස්ථ පාරිභෝගිකයින් අතර විදුලි මිල ගණන් දැරිය හැකි මිලකට ලබා දීම සහ සුදුසු ගෘහස්ථ පාරිභෝගිකයින් වෙත සහනාධාර ලබා දීම සම්බන්ධයෙන් ඉලක්ක කිරීම ඉහළ නැංවීම පිළිබඳව නියාමක විසින් අධ්‍යයනයක් සිදු කරනු ලැබිය යුතු අතර, ගාස්තු ප්‍රතිපත්තිය තුළ මෙම ක්‍රියාමාර්ගය සංශෝධනය කිරීම පිණිස බලශක්ති අමාත්‍යාංශය වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය. | 2026 ජූලි, සහ ඉන් පසුව සෑම වසර 3 කට වරක් |
| 5.1.4 | කි.වො.පැ.1 සිට 30 දක්වා වූ ජීව සහනදායි කාණ්ඩගත කොටස හැර, පාරිභෝගික සමූහයට පිරිවැය බෙදී යන ඇතැම් පාර්ශවයන්ට ලැබෙන සහන ගාස්තු භුක්ති විඳින සියලුම නිවාස සහ ආගමික පරිශ්‍රයන් සඳහා වන ගාස්තු (එම කාණ්ඩයට, උප කාණ්ඩයට සහ කාණ්ඩගත කොටසට ඇති සැපයුම් පිරිවැය හා සසඳන විට සැබෑ ගාස්තුව), ක්‍රමයෙන් පිරිවැය පරාවර්තනය කරා යොමු කළ යුතුය. ඒ හා සමානව, අධිභාර සහිත ගෘහස්ථ සහ ආගමික පාරිභෝගිකයින් සඳහා වන මිල ගණන් ක්‍රමයෙන් පිරිවැය පිළිබිඹු කරන ගාස්තුවක් කරා ගෙන යා යුතුය. | වසරේ ආරම්භ කර 2030 වසරේ අවසන් කෙරේ |
| 5.1.5 | කුඩා කර්මාන්ත සහ අනෙකුත් ඕනෑම පාරිභෝගික කාණ්ඩ හෝ කාණ්ඩගත කොටස් සඳහා දැනට ක්‍රියාත්මක වන සහනාධාර ගාස්තු (Subsidised tariffs) ක්‍රමයෙන් පිරිවැය පරාවර්තනය වන පරිදි සකස් කළ යුතුය. සියලුම අධිභාර සහිත පාරිභෝගික කාණ්ඩ හෝ කාණ්ඩගත කොටස් සම්බන්ධයෙන් පිරිවැය පරාවර්තනය අදාළ කරගත යුතුය. | 2026 වසරේ ආරම්භ කර 2029 වසරේ අවසන් කෙරේ |
| 5.1.6 | නිවාස, ආගමික පරිශ්‍ර සහ කර්මාන්ත සඳහා වන සහනාධාර දැනට මූල්‍යකරණය කරනු ලබන්නේ අනෙකුත් නිවාස සහ ව්‍යාපාරවලින් උපයන හරස් සහනාධාර මඟිනි. හරස් සහනාධාරවලින් සිදු කෙරෙන මෙය රජයේ සෘජු අයවැය ප්‍රතිපාදන දක්වා ක්‍රමයෙන් මාරු කිරීම ක්‍රියාත්මක කළ යුතුය. මෙය ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම පිණිස මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් සැලැස්මක් සකස් කරනු ලැබිය යුතුය. | 2026 ජූනි මාසය වන විට මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ සැලැස්ම ඉදිරිපත් කිරීම. අයවැය ප්‍රතිපාදන වෙත මාරුවීම 2026 දී ආරම්භ කිරීම, 2029 වන විට අදියර වශයෙන් අවසන් කිරීම. |
| **උපායමාර්ගය 5.2: වීදි සහ පොදු ස්ථාන ආලෝකමත් කිරීමේ පිරිවැය අයක්‍රම හරහා සමාජගත කිරීම අඛණ්ඩව සිදු කරනු ලැබිය යුතුය.** | | |
| 5.2.1 | නියාමක විසින් ප්‍රකාශයට පත් කරන වීදි ආලෝකකරණය සඳහා භාවිත වන බලශක්තිය සඳහා වන ගාස්තු, සපයනු ලබන ධාරිතාව සහ බලශක්තිය භාවිත කරන වේලාවන් ද සලකා බලමින්, පිරිවැය පරාවර්තක විය යුතුය. | 2026 ජනවාරි |
| 5.2.2 | ඕනෑම පාරිභෝගිකයෙකුට එක් එක් බෙදාහැරීමේ බලපත්‍රලාභියා සහ ජාතික පද්ධති ක්‍රියාකරු විසින් නිකුත් කරන ලද ඉන්වොයිසියක බලශක්ති සංරචකයෙන් උපරිම 2.2% කට යටත්ව, වීදි සහ පොදු ස්ථාන ආලෝකමත් කිරීම සඳහා අය විය යුතු බලශක්ති ගාස්තු වලින් පැන නගින පිරිවැය, සියලුම පාරිභෝගික කාණ්ඩ ඔස්සේ ඔවුන් අතර පිරිවැය බෙදී යන ලෙස සමාජගත කිරීම අඛණ්ඩව සිදු කරනු ලැබිය යුතුය. | වත්මන් ක්‍රියාමාර්ගය අඛණ්ඩව ඉදිරියට ගෙන යාම |

| | | |
|---|---|---|
| | | |
| 5.2.3 | සෑම බෙදාහැරීමේ බලපත්‍රලාභියෙකුම බලපත්‍රලාභියාගේ සේවා ප්‍රදේශයේ ඇති වීදි සහ පොදු ස්ථාන ආලෝකමත් කිරීමේ කාර්යය සඳහා ඒවායේ වර්ගය, ධාරිතාව සහ ඇස්තමේන්තුගත මාසික බලශක්තිය පිළිබඳව සමීක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. | 2026 ජූනි |
| 5.2.4 | වීදි සහ පොදු ස්ථාන ආලෝකමත් කිරීම සඳහා පිරිවැය බෙදී යන පරිදි සමාජගත කරන ලද බලශක්ති ගාස්තු නියාමක විසින් විනිවිදභාවයෙන් යුතුව ප්‍රකාශයට පත් කළ යුතු අතර බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් පාරිභෝගිකයින් වෙත නිකුත් කරන සහ ඇතැම් අවස්ථාවකදී ජාතික පද්ධති ක්‍රියාකරු වෙතින් සම්ප්‍රේෂණ ජාලය හරහා සේවය ලබා ගන්නා පාරිභෝගිකයින් වෙත නිකුත් කරන ඉන්වොයිසිවල එය දැක්විය යුතුය. | 2026 ජනවාරි |
| 5.2.5 | මෙරට වීදි සහ පොදු ස්ථාන ආලෝකකරණය සම්බන්ධයෙන් එම කාර්යය පැවරීමට, ප්‍රතිසංස්කරණය (පුනරුත්ථාපනය) කිරීමට, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කර පවත්වාගෙන යාමට නව ආයතනයක් පිහිටුවීමට බලශක්ති අමාත්‍යාංශය කටයුතු කළ යුතුය. නව ආයතනය විසින් එවැනි වීදි ආලෝක සඳහා ඒවායේ සමාජගත පිරිවැය ගණනය කිරීමට හැකි වන පරිදි නිවැරදි බලශක්ති මිනුම් ඇති කිරීම හෝ ඒවා ක්‍රියාකාරී වන වේලාවන් නිරීක්ෂණය කිරීම කළ යුතුය. | 2026 ජනවාරි |
| 5.2.6 | බලශක්ති ගාස්තු වලට අමතරව, නව ආයතනය විසින් කළමනාකරණය කරනු ලබන වීදි සහ පොදු ස්ථාන ආලෝකකරණය සඳහා වන ආයෝජන සහ නඩත්තු වියදම්, බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සහ ජාතික පද්ධති ක්‍රියාකරු විසින් අය කරනු ලබන සහ ඉහත විස්තර කර ඇති ආයතනය වෙත ප්‍රේෂණය කෙරෙනු ඇති පරිදි පාරිභෝගික ගාස්තු මත බද්දක් ලෙස ඇතුළත් කළ යුතුය. මෙම බදු මුදලේ ප්‍රමාණය පිළිබඳව අමාත්‍යවරයා විසින් ප්‍රතිපත්ති මාර්ගෝපදේශයක් නිකුත් කළ යුතුය. | 2027 ජනවාරි |
| 5.2.7 | ආලෝකකරණයට සුදුසු වීදි සහ පොදු ස්ථාන තීරණය කිරීම සඳහා තාක්ෂණික සැලසුම් ප්‍රමිතීන් සහ මාර්ගෝපදේශ සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කළ යුතු අතර ඒවායේ පිරිවැය (ස්ථාවර පිරිවැය සහ බලශක්ති පිරිවැය) අයක්‍රම හරහා සමාජගත කෙරෙනු ඇත. | 2026 ජූලි |
| 5.2.8 | භාවිතකරන්නන් විසින් සෘජුව හෝ වක්‍රව සේවාවන් සඳහා ගෙවීම් සිදු කරන සහ ප්‍රවේශය පාලනය කර ඇති (අධිවේගී මාර්ග සහ කාර්මික කලාප වැනි) වීදි සහ පොදු ස්ථාන ආලෝකමත් කිරීම සඳහා වන බදු සහ ගාස්තු අයක්‍රම හරහා සමාජගත නොකළ යුතුය. | වත්මන් ක්‍රියාමාර්ගය අඛණ්ඩව සිදු කරගෙන යාම |

6. **පාරිභෝගික ගාස්තු, පිරිවැය කාර්යක්ෂම සහ තාක්ෂණික වශයෙන් කාර්යක්ෂම භාවිතය, ඉල්ලුම් කළමනාකරණය සහ සම්පත් සංරක්ෂණය ප්‍රවර්ධනය කෙරෙන පරිදි ව්‍යුහගත කළ යුතුය.**

| උපාය මාර්ග, ක්‍රියාමාර්ග සහ ක්‍රියාත්මක කිරීමේ කාල රාමුව | | ක්‍රියාත්මක කිරීම |
|---|---|---|
| **උපායමාර්ගය 6.1: ඉල්ලුම් කළමනාකරණය සහ ඉල්ලුම් ප්‍රතිචාර උපාය මාර්ග ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය** | | **ක්‍රියාත්මක කිරීම** |
| 6.1.1 | බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් අවම වශයෙන් අවුරුදු 5 ක කාල පරතරයකින් යුතුව, එක් එක් කාණ්ඩය සහ උප කාණ්ඩය සහ කාණ්ඩගත පාරිභෝගික කොටස සඳහා වන පාරිභෝගික ඉල්ලුමේ ලක්ෂණ තක්සේරු කිරීම සඳහා විදුලි ඉල්ලුම පරීක්ෂා කිරීමේ විදුලි භාර සමීක්ෂණ (Load surveys) පැවැත්විය යුතුය. නියාමක විසින් පාරිභෝගිකයාගේ පෞද්ගලිකත්වය සුරක්ෂිත කරමින් සහ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ප්‍රවේශය සහතික කරමින්, විද්‍යාත්මක නියැදීම (scientific sampling), සමීක්ෂණ ක්‍රමවේදය සහ තොරතුරු වාර්තා කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම කළ යුතුය. | නියාමක විසින්, 2026 වසර වන විට |
| 6.1.2 | උපකරණ මට්ටමින් ඇතුළුව, ලාබදායි ගාස්තු (interruptible tariffs) සහ උපායමාර්ගික ඉල්ලුම කළමනාකරණය ඇතුළුව ඉල්ලුම කළමනාකරණ උපාය මාර්ග සහ තාක්ෂණයන් පිළිබඳව බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් අධ්‍යයනය කළ යුතුය. නියාමකයා එවැනි අධ්‍යයනයන් සමාලෝචනය කර MOE වෙත ප්‍රතිපත්ති සංශෝධන යෝජනා කළ යුතුය. නියාමක විසින් මෙම අධ්‍යයනයන් සමාලෝචනය කළ යුතු අතර බලශක්ති අමාත්‍යාංශය වෙත ප්‍රතිපත්ති සංශෝධන යෝජනා කළ යුතුය. | 2026 ජූලි වන විට |
| 6.1.3 | ඉල්ලුම් පැතිකඩ වැඩිදියුණු කිරීම සහ සුමට කිරීම සඳහා, එක් එක් බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින්, නියාමකගේ අනුමැතිය සහිතව, තෝරාගත් පාරිභෝගිකයින් සඳහා අවම වශයෙන් එක් ඉල්ලුම් ප්‍රතිචාර ගාස්තුවක් (demand response tariff) ඉදිරිපත් කළ යුතුය. මෙම ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් වන පාරිභෝගික ප්‍රතිචාරය තක්සේරු කිරීම සඳහා අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කරනු ලැබේ. එවැනි ගාස්තු එක් එක් බෙදාහැරීමේ බලපත්‍රලාභියාට සුවිශේෂී විය යුතුද නැතහොත් රට පුරා පොදුවේ අදාළ විය යුතු ද යන්න නියාමක විසින් තීරණය කළ යුතුය. | 2027 ජනවාරි වන විට |

| | |
|---|---|
| **6.2 ප්‍රතිපත්ති සම්පාදනය වඩාත් විධිමත් කළ යුතු අතර ප්‍රතිපත්ති විශ්ලේෂණ හැකියාවන් ශක්තිමත් කළ යුතුය.** | |
| 6.2.1 වත්මන් සහ ඉදිරි අනාගතයේදී ඇති විය හැකි මිලකරණ මිලකරණ ප්‍රතිපත්ති ගැටළුවලට අදාළ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ පාර්ශවකරුවන් සහ පර්යේෂණ සංවිධාන සමඟ අන්තර් ක්‍රියාකාරීත්වය පවත්වාගැනීමට හැකිවන අයුරින් බලශක්ති අමාත්‍යාංශය තුළ ප්‍රතිපත්ති සම්පාදක ආයතනයක් පිහිටුවිය යුතුය. රාජ්‍ය අංශයේ ආයතන අතරට සුනිත්‍ය බලශක්ති අධිකාරිය, මුදල් අමාත්‍යාංශය ඉදිරියේදී හඳුනාගනු ලබන වෙනත් අදාළ ආයතන ඇතුළත් වනු ඇත. ඉහත සඳහන් කළ සමීක්ෂණවලින් රැස් කරනු ලැබූ දත්ත මෙම ආයතනය මගින් සැපයෙනු ඇත. ප්‍රතිපත්ති සම්පාදන කාර්යය සඳහා වන පර්යේෂණ සඳහා එම දත්ත ලබා ගැනීමට හැකියාව සැලසෙනු ඇති අතර පාරිභෝගික රහස්‍යභාවය සුරක්ෂිත කිරීම පිණිස ඒ මත පනවන සීමාවන්ට යටත්ව එය සිදු කෙරෙනු ඇත. | 2027 ජනවාරි වන විට |

**7.** **ගාස්තු නිර්නය කිරීමේ ක්‍රියාවලියේ සුවිශේෂී ලක්ෂණ සහ පුනර්ජනනීය බලශක්ති සම්පත්වල වාරයන්ට සීමා වීමේ ස්වභාවය (seasonality) සහ පොසිල ඉන්ධන මිල ගණන්වල විචලනයන් හේතුවෙන් වන පාරිභෝගික ගාස්තුවල උච්චාවචනයන් සුමට කළ යුතුය.**

| උපාය මාර්ග, ක්‍රියාමාර්ග සහ ක්‍රියාත්මක කිරීමේ කාල රාමුව | |
|---|---|
| **උපායමාර්ගය 7.1 ජාතික පද්ධති ක්‍රියාකරු සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් අතර ගනුදෙනු කළමනාකරණය කිරීමේ මාධ්‍යය තොග සැපයුම් ගනුදෙනු ගිණුම (BSTA) විය යුතු අතර, තොග සැපයුම් ගනුදෙනු (BST) කාල පරිච්ඡේද අතර ඇති ඕනෑම හිඟයක් නිවැරදි කිරීමට හෝ අතිරික්තයක් අවශෝෂණය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය.** | ක්‍රියාත්මක කිරීම |
| 7.1.1 නියමිත දිනය (appointed date) වන විට පවතින තොග සැපයුම් ගනුදෙනු ගිණුම ප්‍රසිද්ධියේ හෙළිදරව් කළ යුතුය. | ජාතික පද්ධති ක්‍රියාකරු සහ නියාමක, නියමිත දිනය දී |
| 7.1.2 ජාතික පද්ධති ක්‍රියාකරු විසින් සෑම සතියකම අවසානයේ දී තොග සැපයුම් ගනුදෙනු ගිණුමේ ගනුදෙනු සහ අවසන් ශේෂය පිළිබඳව මුදල් අමාත්‍යාංශය (MOF), බලශක්ති අමාත්‍යාංශය සහ නියාමක වෙත වාර්තා කළ යුතුය. ජාතික පද්ධති ක්‍රියාකරු විසින් සෑම මසකම අවසානයේ දී අවසන් ශේෂය ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කළ යුතුය. | ජාතික පද්ධති ක්‍රියාකරු, දැනට ක්‍රියාත්මක වේ, 2026 ජනවාරි සිට මහජන තොරතුරු දේ. |
| **උපායමාර්ගය 7.2: ගාස්තු වෙනස්කිරීම් පාරිභෝගිකයින් සඳහා අසීරුතා ඇති කරවන සහ රටේ ව්‍යාපාරික පරිසරය තුළ අවිනිශ්චිතතාවක් නිර්මාණය කරවන හෙයින් පාරිභෝගික ගාස්තු නිරන්තරයෙන් වෙනස් කිරීමට සිදු නොවන ආකාරයෙන් තොග සැපයුම් ගනුදෙනු ගිණුම කළමනාකරණය කළ යුතුය.** | |
| 7.2.1 නියාමක විසින් සෑම වසරකම සුදුසු දිනයක් (වඩාත් යෝග්‍ය ලෙස ජල වර්ෂය (hydrological year) ආරම්භ වන දිනය වන ඔක්තෝබර් 1 වන දින) ගාස්තු වෙනස් කිරීමේ දිනය ලෙස නම් කළ යුතුය. මෙම දිනයේදී, ඉදිරි වසරේ සැපයුම් සඳහා වන මුළු පුරෝකථන පිරිවැය නිර්ණය කරනු ලැබිය යුතු අතර, පුරෝකථනය කළ ආදායම පුරෝකථනය කළ සැපයුම් පිරිවැයට සමාන වන පරිදි මුළු වර්ෂය සඳහා ම පාරිභෝගික ගාස්තු ගළපා සකස් කළ යුතුය. | 2026 ඔක්තෝබර් |
| 7.2.2 විදුලිබල පනතේ දක්වා ඇති පරිදි, තොග විකුණුම් ගාස්තු, තොග මිලදී ගැනීමේ ගාස්තු සහ සැපයුම් ගාස්තු පිළිබඳ සෑම කාර්තුමය සමාලෝචනයකදීම සහ එකී එක් එක් කාර්තුමය සමාලෝචනයෙන් පසුව ජල විදුලි සහ සුළං සම්පත් හි විචලනයන්ගේ පුරෝකථන කළ වාරයන්ට සීමා වන ස්වභාවය හෙවත් ඍතුමය ස්වභාවය පාරිභෝගික ගාස්තු වෙනස් කිරීමට හේතුවක් නොවිය යුතුය. | |
| 7.2.3 තොග සැපයුම් ගනුදෙනු ගිණුමෙ හි කිසියම් ඍණ ශේෂයක් ඇත්නම්, එය වසර 3 ක කාල සීමාවක් සඳහා නියාමක විසින් අනුමත කරන ලද පොලියක් සහිත ස්ථාවර ණය පහසුකම් හරහා මූල්‍යනය කරනු ලැබිය යුතුය. ඒ හා සමානව, තොග සැපයුම් ගනුදෙනු ගිණුමෙ හි ධන ශේෂයක් ඇත්නම්, ඒ සඳහා පොලිය (ප්‍රකාශිත දර්ශක මත පදනම් වූ සූත්‍රය අනුව) ලැබී තොග සැපයුම් ගනුදෙනු ගිණුමට බැර වනු ඇත. | 2026 ජනවාරි සිට පොලී අනුපාත සූත්‍රය ක්‍රියාත්මක කෙරේ |

| | | |
|---|---|---|
| 7.2.4 | පාරිභෝගික ගාස්තු වෙනස්කිරීමක් ඇති නොවන පරිදි සහ වාරයන්ට සීමාවීමේ ස්වභාවය සහ ඉන්ධන මිල උච්චාවචනයන් ආවරණය වන පරිදි, වාර්ෂික පාරිභෝගික ගාස්තු වෙනස් කිරීමේ දිනයේ පැවති තොග සැපයුම් ගනුදෙනු ගිණුමේ ශේෂයේ අගයට සාපේක්ෂව තොග සැපයුම් ගනුදෙනු ගිණුමේ ශේෂය, මුළු වාර්ෂික විදුලි සැපයුම් පිරිවැයෙන් 10% කින් ඉහළ යාමට හෝ අඩු වීමට අවසර ලබා දිය යුතුය. | |
| 7.2.5 | තොග සැපයුම් ගනුදෙනු ගිණුමේ ශේෂය අඛණ්ඩව සති දෙකක් තුළ 10% සීමාව කරා ළඟා වූවහොත්, ජාතික පද්ධති ක්‍රියාකරු විසින් නියාමක වෙත ඒ සම්බන්ධයෙන් දැනුම් දිය යුතු අතර, විශේෂ තත්වයක් කරා ළඟා වී ඇති බවට නියාමක විසින් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් වෙත අනිවාර්යයෙන් දැනුම් දිය යුතු අතර, ඔවුන් විසින් පාරිභෝගික ගාස්තු 10% කින් වැඩි කිරීමට (හෝ අවස්ථානුගතව අඩු කිරීමට) කටයුතු කළ යුතුය. | |
| 7.2.6 | තොග සැපයුම් ගනුදෙනු ගිණුම පහළ සීමාවට ළඟා වූ පසු 10% ක වැඩිවීමක් තාවකාලිකව අත්හිටුවීමට ජාතික පද්ධති ක්‍රියාකරු විසින් නියාමක හට නිර්දේශ කළ හැකි අතර මෙම තත්ත්වය තවත් සතියකට වඩා නොඉක්මවන කාලයක් පවතිනු ඇති බව ජාතික පද්ධති ක්‍රියාකරුගේ මතය වේ නම්, එම මතය සමඟ දත්ත සහ විශ්ලේෂණයන් ඉදිරිපත් කළ යුතුය. | |
| 7.2.7 | තොග සැපයුම් ගනුදෙනු ගිණුම ඉහළ සීමාවට ළඟා වූ පසු 10% ක අඩු කිරීමක් තාවකාලිකව අත්හිටුවීමට සහ තොග සැපයුම් ගනුදෙනු ගිණුම සඳහා ආධාරක වශයෙන් ලබාගත් මූල්‍ය පහසුකම් සඳහා මුදල් පියවීම සඳහා හෝ තොග සැපයුම් ගනුදෙනු ගිණුමට ආධාරක පිණිස සංචිතයක් ගොඩනගා ගැනීම සඳහා එම අරමුදල් රඳවා තබාගැනීමට ජාතික පද්ධති ක්‍රියාකරු විසින් නියාමක හට නිර්දේශ කළ හැකිය. රඳවා ගන්නා එවැනි අරමුදල් ගාස්තු ස්ථායීකරණ ගිණුම ලෙස නම් කරන වෙනම ගිණුමක තැන්පත් කළ යුතු අතර එහි ගනුදෙනු මාසිකව ප්‍රකාශයට පත් කළ යුතුය. | |
| 7.2.8 | විදුලිබල පනතේ හෝ මෙම ගාස්තු ප්‍රතිපත්තියේ එවැනි කොන්දේසි පැහැදිලිව සඳහන් වන්නේ නම් මිසක, කිසියම් අවසන් කරන ලද ගාස්තු සමාලෝචන ක්‍රියාවලියකට පෙර හෝ පසුව, බහු වාර්ෂික ගාස්තු (MYT) යටතේ සාමාන්‍ය ගාස්තු ගොනු කිරීමක් ඉදිරිපත් ලෙස බලපත්‍රලාභීන් සඳහා කොන්දේසි පැනවීමට නියාමකට නොහැකිය. | |
| 7.2.9 | බලපත්‍රලාභීන් සහ නියාමකයා විසින් කරන ලද සියලුම ගණනය කිරීම් සඳහා පූර්වයෙන් එකඟතාවට පත් ආකෘති සහ සැකසුම් (templates and formats) භාවිත කළ යුතු අතර, ඕනෑම ගැළපීමක් (සංශෝධනයක්) ආකෘති මත පදනම්ව සිදු කළ යුතු අතර, එවැනි ගණනය කිරීම් ප්‍රකාශයට පත් කළ යුතුය. මෙම ගණනය කිරීම්වලට තොග සැපයුම් ගාස්තුව ගණනය කිරීම්, ගැලපුම් කළ තොග සැපයුම් ගාස්තුව, පූරෝකථනය කරන ලද පාරිභෝගික ගාස්තු, උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම සහ සැපයුම් ගාස්තු වල බහුවාර්ෂික ගාස්තු නිර්ණය, ප්‍රමාද වූ ප්‍රාග්ධන ආයෝජන නැවත අය කරගැනීම් (claw-back of delayed capital investments) යන එහෙත් ඒවාට පමණක් සීමා නොවන කරුණු ඇතුළත් වේ. | 2027 ජනවාරි වන විට |
| 7.2.10 | තනි මුදල් ප්‍රවාහ චක්‍රය වෙන් වෙන් වූ මුදල් ප්‍රවාහ චක්‍ර 7 කට බෙදා ඇති විට අමතර වියදම් වළක්වා ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් අධ්‍යයනයක් සිදු කෙරෙනු ඇත. | 2026 ජූනි වන විට |

8. **ලංකා විදුලිබල මණ්ඩලය සතු ණය අනුප්‍රාප්තික ආයතන වෙත පවරනු ලැබිය යුතු අතර පාරිභෝගික ගාස්තු හරහා අයකර ගනු ලැබිය යුතුය.**

| උපාය මාර්ග, ක්‍රියාමාර්ග සහ ක්‍රියාත්මක කිරීමේ කාල රාමුව | ක්‍රියාත්මක කිරීම |
|---|---|
| **උපායමාර්ගය 8.1:** අනුමත පිරිවැය සහ අනුමත විදුලි මිල අතර ඉතිහාසගත වෙනස්කම් වලින් නිර්මාණය වී ඇති දීර්ඝ කාලයක් ගෙවීම් ප්‍රමාද වූ ණය **(Legacy debts)** ජාතික පද්ධති ක්‍රියාකරු වෙත පවරනු ලැබිය යුතුය | |
| 8.1.1 අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි ප්‍රතිව්‍යුහගත කරන ලද දීර්ඝ කාලයක් ගෙවීම් ප්‍රමාද වූ ණය, බලශක්ති අමාත්‍යාංශය විසින් නියමිත දිනට ජාතික පද්ධති ක්‍රියාකරු වෙත පවරනු ලැබිය යුතුය. | නියමිත දිනය වන විට |
| 8.1.2 ගාස්තු නිර්ණය කිරීම්වලදී, නියාමක විසින් දීර්ඝ කාලයක් ගෙවීම් ප්‍රමාද වී ණය අයකර ගැනීමේ කාලසටහන (recovery schedule) සහ එක් එක් තොග සැපයුම් ගාස්තු සමාලෝචන චක්‍රයට පවරා ඇති අයකර ගැනීම් තීරණයන්වලට ඇතුළත් කරගනිමින් ප්‍රකාශයට පත් කළ යුතුය. | 2026 ජනවාරි |
| **උපායමාර්ගය 8.2:** ඉදිකරන ලද හෝ ක්‍රියාත්මක කෙරෙමින් පවතින වත්කම් මත ණයහිමියන්ට ගෙවිය යුතු ව්‍යාපෘති ණය, බලපත්‍රලාභීන් අතර නිසි ලෙස බෙදා හැර ගාස්තු අයක්‍රම හරහා අයකර ගත යුතුය. | |

| | | |
|---|---|---|
| 8.2.1 | බලශක්ති අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති ණය එක් එක් අනුප්‍රාප්තික ආයතනය වෙත නියමිත දිනය වන විට පවරනු ලැබිය යුතුය. | නියමිත දිනය වන විට |
| 8.2.2 | උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම සඳහා අවසර දී ඇති ආදායම් තුළ අනුමත කර ඇති ස්ථාවර පිරිවැයේ ප්‍රතිපාදන හරහා ව්‍යාපෘති ණය අයකර ගනු ලැබිය යුතුය. | 2026 ජනවාරි |

**9.** **දකුණු සහ අග්නිදිග ආසියානු කලාපයේ තරඟකාරී ආර්ථිකයන්හි ගාස්තුවලට සාපේක්ෂව පාරිභෝගික ගාස්තු සැසඳීම (benchmarked) සිදු කළ යුතුය.**

| උපාය මාර්ග, ක්‍රියාමාර්ග සහ ක්‍රියාත්මක කිරීමේ කාල රාමුව | | ක්‍රියාත්මක කිරීම |
|---|---|---|
| **උපායමාර්ගය 9.1: කලාපයේ රටවල ගාස්තුවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ ගාස්තු සසඳනු ලැබිය යුතුය.** | | |
| 9.1.1 | සපයන ලද කි.වෝ. පැයකට සහ අනෙකුත් සුදුසු මූලික පදනම් (bases) මත පදනම්ව, උත්පාදන පිරිවැය, සම්ප්‍රේෂණයට අවසර දී ඇති ආදායම, බෙදා හැරීම සහ සැපයුම් සේවා සඳහා අවසර දී ඇති ආදායම අවම වශයෙන් කලාපයේ රටවල් 10 ක් සමඟ හෝ විදුලි උපයෝගිතා ආයතන සමඟ සංසන්දනය කිරීම සහ ඒවා ප්‍රකාශයට පත් කිරීම නියාමක විසින් සිදු කරනු ලැබිය යුතුය. | 2026 සිට වාර්ෂිකව, සෑම පාරිභෝගික ගාස්තු වෙනස් කිරීමකින් පසු මාසයක් ඇතුළත |
| 9.1.2 | එකම කාණ්ඩයේ (සමාන) පාරිභෝගිකයින් සඳහා වන පාරිභෝගික ගාස්තු, අවම වශයෙන් කලාපයේ රටවල් 10 ක් සමඟ හෝ විදුලි උපයෝගිතා ආයතන සමඟ සංසන්දනය කිරීම සහ ඒවා ප්‍රකාශයට පත් කිරීම නියාමක විසින් සිදු කරනු ලැබිය යුතුය. | 2026 සිට වාර්ෂිකව, සෑම පාරිභෝගික ගාස්තු වෙනස් කිරීමකින් පසු මාසයක් ඇතුළත |
| **උපායමාර්ගය 9.2: විදුලි මිල ගණන් පිළිබඳ අනාගත දිශානතින් විනිවිදභාවයෙන් යුතුව ප්‍රකාශයට පත් කළ යුතුය.** | | |
| 9.2.1 | උත්පාදන පුළුල් කිරීමේ සැලැස්මේ සහ සම්ප්‍රේෂණ පුළුල් කිරීමේ සැලැස්මේ සහ ඇස්තමේන්තුගත බෙදාහැරීමේ පුළුල් කිරීමේ සැලසුම්වල සෑම සංශෝධනයකටම අනුකූල වන පරිදි ජාතික පද්ධති ක්‍රියාකරු විසින් සකස් කරන ලද සාමාන්‍ය පාරිභෝගික ගාස්තු සම්බන්ධයෙන් අවම වශයෙන් අවුරුදු 10ක පුරෝකථනයක් තිබිය යුතුය. එම පුරෝකථනයට දැනට සිදු කරගෙන යන කටයුතු සඳහා වන සියලු වියදම්, සහ ස්ථාවර සහ විචල්‍ය පිරිවැය ඇතුළුව විදුලිබල පද්ධතියේ ඉදිරියට සැලසුම් කර ඇති වියදම් ඇතුළත් විය යුතුය. | 2026 සිට ජාතික පද්ධති ක්‍රියාකරු විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කෙරෙනු ඇත. |
| 9.2.2 | නියාමක විසින්, මිණුම් සලකුණු (පිල් ලකුණු) අධ්‍යයනය සහ පුරෝකථන ගාස්තු මත පදනම්ව, පාරිභෝගික ගාස්තු තරඟකාරී ඒවා බවට පත් කිරීමේ ක්‍රම සහ විධි පිළිබඳව අමාත්‍යවරයා වෙත වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරනු ලැබිය යුතුය. | 2026 සිට නියාමක විසින් |